
# බුදුසරණ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක්වූ පොසොන් අමාවක
රාජ්‍ය වර්ෂ 2020 ජූනි 20 වනදා සෙනසුරාදා
BUDUSARANA, SATURDAY JUNE 20, 2020
55 වන කාණ්ඩය, 03 වන පත්‍රය, පිටු 20
ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

"දරුව,
නුවණත් උත්සාහයත් ඇති කෙනෙකුට
පොහොසතෙක් වීමට නම්
මේ මී කුණත් ප්‍රමාණවත්"

## චුල්ලසෙට්ඨි ජාතකය

(18 පිටුව)

# පාපයෙහි ආදීනව දකිමින් සිත පාලනය කරගන්න



කොළඹ කොටුව ශ්‍රී සම්බුද්ධාලෝක
විහාරාධිකාරී
කථිකාචාර්ය
**විතාරන්දෙණියේ මේධානන්ද හිමි**

**ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී යන ශ්‍රී සද්ධර්ම දේශනාවට අනුව ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා ඒකාන්ත වශයෙන්ම ඒ ධර්මය විසින් ආරක්ෂා කරනු ලබයි.**

අප තිලෝගුරු සම්මා සම්බුදු බුදුපියාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පාරමී දම් පූරණය කරමින් අවබෝධ කොට වදාළා වූ එම ධර්ම කාරණාව අපගේ ජීවිතයට ගළපා ගත යුත්තේ කෙසේ ද ? යන්න පිළිබඳ ව අප විග්‍රහ කර ගත යුතු ය. අප සියලු දෙනාම ජීවිතය ජයගැනීමට කැමැත්තෝ වෙමු. අප සියලු දෙනාම ජීවිතය සතුටින් ගත කිරීමට කැමැත්තෝ වෙමු. සැප කැමැත්තෝ වෙමු. අපගේ ජීවිතය ජය ගත නොහැකි, ජීවිතයෙහි සතුට නැති කරන, කාරණය අප සොයා ගත යුතු ය. මෙලොව පරලොව ජීවිතය හා බැඳි සියලුම ධර්ම කාරණාවන් උන්වහන්සේ විසින් දේශනා කළ විවිධ සූත්‍ර දේශනාවන්හි සඳහන් ව ඇත.

මෙලොව හා පරලොව ජීවිතය සැපවත්ව ගතකිරීමට අපි සියලු දෙනාම

උත්සාහ කරන්නෙමු. බුදු දහම පරලොව ජීවිතය පමණක් ජයගැනීමට අදාළ වන දර්ශනයක් නොවන බව අප පළ මු කොටම අවබෝධ කර ගත යුතු ය. එම අවබෝධ කරගත්තා වූ ධර්මය විසින් ගොඩනගාගත් ධර්මානුකූල ජීවිතය තුළින් ඇතිකර ගනු ලබන ශික්ෂණය හා දියුණුව තුළ අප බලාපොරොත්තු වන්නා වූ සාදාකාලික සැනසීම ළඟා කරගැනීමට උපකාරී වේ.

ඒ අනුව ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා ඒකාන්ත වශයෙන් ම ඒ ධර්මය විසින් ආරක්ෂා කරනවා යනු, ඔහු යහපත් වූ නිවැරැදි වූ පුද්ගලයකු බවයි. ඔහු කරදර පීඩාවන්ගෙන් තොර වූ, සමාජය විසින් ගරු කරනු ලබන පුද්ගලයකු වෙයි. ඔහු සත්‍යය වාදියකු වෙයි. ධාර්මික පුද්ගලයෙකු වෙයි. ධර්මයෙහි හැසිරිය යුතු ආකාරය පිළිබඳව බුදුරජාණන් වහන්සේ උන්වහන්සේගේ ආදර්ශවත් සම්බුදු චරිතය තුළින් ද, සූත්‍ර දේශනා තුළින් ද පැහැදිලි කර ඇත. කුමන ආගමකට අයත් පුද්ගලයකු වුවත්, ප්‍රාණඝාතයෙන් පළමු කොටම වැළකිය යුතු ය. තමා ජීවිතයට ආදරය කරන්නා සේ ම, අන් සත්ත්වයා ද තමාගේ ජීවිතය සැපවත්ව, කරදරයකින් තොරව ගත කිරීමට කැමැත්තෝ වෙති.

තමාගේ පණට ආදරය කරන්නා සේ ම අන් සත්ත්වයෝ ද ඔවුන්ගේ ජීවිතයට ආදරය කරති. එබැවින් අනෙකාගේ ජීවිතයට ගරු කළ යුතු ය. එවිට පුද්ගල ජීවිතය තර්ජනයකට ලක් නොවේ. එබඳු පුද්ගලයෝ ජීවත් වන සමාජය පවා සැනසිලිදායක වේ.

සත්ත්ව ඝාතනය හෝ පුද්ගල ඝාතනය කරනු ලබන පුද්ගලයා යහපත් සමාජයට පීඩාවකි. යහපත් සමාජ පැවැත්මට විනාශකාරී පුද්ගලයෙකි. ප්‍රාණඝාත අකුසලය ධර්මය සමාජයෙහි නො රැඳෙන බරපතළ කාරණාවක් ද වනු ඇත. එබැවින් ධර්මය තුළ හැසිරෙන පුද්ගලයකුගේ පළමු ලක්ෂණය නම්, සියලු සත්ත්වයාට ආදරය කරුණාව දැක්වීම ය. සබ්බේ තසන්ති දණ්ඩස්ස සියලු සත්ත්වයෝ දඬුවමට බිය වෙති. සියලු සත්ත්වයෝ ජීවිතයට ප්‍රිය වෙති. සංසාරික වශයෙන් වුව ද, අප මනුෂ්‍ය භවයක් ලබා අත්තේ ද, ප්‍රාණඝාතනය නමැති අකුසල කර්මයෙන් වැළකී සිටි හෙයිනි. සුගති ලෝකය ලෙස බුදු දහම අර්ථ ගන්වා ඇත්තේ ද මනුෂ්‍ය ලෝකය යි.

නරකාදිය, තිරිසන් ලෝක, ප්‍රේත ලෝක. අසුර ලෝක යන ස්ථාන දුර්වල ගති සහිත පුද්ගලයන් උප්පත්තිය ලබන දුගති ලෙස ධර්මයෙහි සඳහන් වේ. උසස් මනසක් සහිත සත්ත්වයෝ පංච දුෂ්චරිතයෙන් මිදුණෝ වෙති. සත්ත්ව ඝාතනය කරන පුද්ගලයාගේ මනස දුර්වල ය. අන්‍යයාගේ ජීවිතය ආරක්ෂා කරන උසස් මනසක් සහිත පුද්ගලයෝ මනුෂ්‍ය හෝ දිව්‍ය ලෝකවල උප්පත්තිය ලබති. එහි අවසන් ප්‍රතිඵලය වනුයේ ලෝභ, ද්වේෂ, මෝහ යන සියලු කෙලෙස් ප්‍රහීණ කරමින් මෙලොව පරලොව ජීවිතය ජය ගනිමින් නිවන සාක්ෂාත් කරගැනීමේ හැකියාව ලැබීම ය.

යම් රටක රාජ්‍ය නායකයකු ජනතාවට ආදරය කරයි නම්, රටේ ජනතාව ඝාතනය වීමට හෝ ඝාතනය කිරීමට ඉඩ තබන්නේ නැත. එය පංච සීල ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලබන ධාර්මික නායකයකු සතු ගුණයකි. පුද්ගල ජීවිතය පමණක් නොව සතා සිවුපාවාගේ ජීවිතය පවා ආරක්ෂා කළ යුතු ය.

යම් පුද්ගලයකු විසින් දෑතේ වීර්යයෙන්, දහදිය වගුරවමින්, උට්ඨාන වීර්යයෙන් වෙහෙස මහන්සියෙන් උපයා සපයා ගත් වස්තුව තවකෙකු විසින් සොරාගනු ලබන්නේ නම්, ඔහු විශාල කඩාවැටීමකට හේතු වේ. තවත් පුද්ගලයකු විසින් එබඳු ආකාරයෙන් යමක් පැහැර ගැනීමේ දී ඔහුට කෙතරම් දුකක් ශෝකයක් උපදී ද? එබැවින් නොදුන් දේ නොගත යුතු ය. ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා අන්‍යයාගේ වස්තුව පැහැර නොගනී.

පුද්ගලයකු ගේ දෙයක් සොරකම් නොකරන ධර්මතාවය තමන් ආරක්ෂා කරන විට එවැනි සමාජයක් ධර්මානුකූල වේ. එවැනි රටක් ද ධර්මානුකූ ල වේ. සන්තුට්ඨී පරමං ධනං යන ලද දෙයින් සතුටු වන කාරණය ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා තුළ දක්නට ලැබේ. ධර්මානුකූලව ජීවත් වන පුද්ගලයාගේ ධනය සතුටයි. එම ධනය කිසිවෙකුටත් සොරාගත නොහැකි ය. පසුගිය දශක ය තුළ අප රට තුළින් පැහැදිලි වූ යේ ද ඉහළ පෙළ සිට පහළ පෙළ දක්වා ජනතාව සතු දේ හෝ අන්සතු දේ තවත් පිරිසක් විසින් වංචා සගහත ලෙස පරිහරණය කිරීමකි. එය ධාර්මික සමාජයක් තුළ සිදු නොවුවකි. එය සමාජ ප්‍රගමනයට ද විශාල හානියක් බව අවබෝධ කර ගත යුතු ය.

යම්කිසි සමාජයක ආධ්‍යාත්මික ව ධර්මානුකූල ව ජීවත් වන පුද්ගලයකු ලබන දියුණුව නම්, අසීමිත ආසාවන්ගෙන් පිරුණු පුද්ගලයෙකු නොවීම ය. කාමයෙහි වරදවා හැසිරීම අධර්මකාමී පුද්ගලයාගේ ලක්ෂණයකි. කාමය පිළිබඳ නිවැරැදි දැක්මක් ඇති පුද්ගලයා ධර්මානුකූල පුද්ගලයකු වේ.

අසීමිත ආසාවන් පසුපස ලුහුබඳින ඇතැම් පුද්ගලයන් තමා ගේ ජීවිතය පවා අහිමි කරගන්නා අවස්ථා ද, අනෙකාගේ ජීවිත විනාශ කරන ආකාරය ද සමාජය තුළ කොතෙකුත් වාර්තා වේ. ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා අන් සැපතට ආසා කරමින් ඊර්ෂ්‍යාය සහගත පුද්ගලයකු බවට පත් නොවේ. තමනට ලද පමණින් සතුටට පත්වන ඔහු ධර්මානුකූල ව ජීවිතයේ යථා ස්වභාවය දකී.

ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා සත්‍යවාදී වචනය ම භාවිත කරයි. කිසිවිටෙකවත් බොරුව කේළම, හිස් වචන පරිහරණය නොකරන එබඳු පුද්ගලයාගේ සීලයෙහි දියුණුවක් ඇති වේ.

ධාර්මික සමාජයක් බිහි කිරීමට නම්, බොරුව සඳහා දඬුවම පමණක් ප්‍රමාණවත් නොවේ. එනම්, එහි ආදීනව පිළිබඳව අවබෝධ කරගත යුතු ය. අසත්‍ය වචනයක් තුළින් යම් පුද්ගලයකු අපහසුතාවයට පත්කොට සතුටක් ලබනවා නම්, තමා ආධ්‍යාත්මික වශයෙන් පරිහානියට පත් වේ. ධර්මය අවබෝධ කොටගත්, ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා අසත්‍ය වචන ප්‍රකාශ කරමින් සතර අපායට පත්වීමට අවස්ථාව උදා කරගන්නේ නැත.

මත්වතුර, මත්ද්‍රව්‍ය පරිහරණය කරන පුද්ගලයා ධර්මයෙන් දුරස් වේ. තාවකාලික ව ලබන සතුට දීර්ඝ කාලීන දුකක් බවට පත්වන්නේ නම්, එහි ආදීනවයන් දෙස බලා සිත පාලනය කරගත යුතු ය. එය දැකිය හැකි වන්නේ ද ධර්මානුකූල ඇසකින් පමණි. ආස්වාදයට නැඹුරුවන පුද්ගලයා ආසාවන් පසුපස ලුහුබඳිනවා මිස ආදීනවයන් පිළිබඳව සිතන්නේ නැත. මොහොතකින් ලබන ආස්වාදය හේතුකොට ගෙන දීර්ඝ කාලීන දුකක් බවට පත්වෙනවා නම්,

ඒ ආදීනවයන් දෙස බලමින් ධර්මානුකූල ව සිත සකස්කර ගත යුතු ය. මොහොතකදී ලබන ආස්වාදයෙන් දුරස් විය යුතුය. ධර්මයෙහි හැසිරීමෙහි වැදගත්කම සමාජගත කළ යුතු ය. ඔහු ධර්මානුකූල ව හැසිරීමට පෙළඹීමෙන් මෙලොව පරලොව ජීවිතය සැපවත් ව ගත කරයි. ධර්මයෙහි හැසිරෙන ධර්මානුකූල පිරිසක් බවට පත්කිරීමට නම්, යහපත් පුරුදු ඇතකර ගත යුතු ය. සැපවත් ජීවිතයක් ගත කිරීමට නම්, බොහෝ දේ පිළිබඳව ධර්මානුකූල ව සිතීමට පෙළඹිය යුතු ය. ධර්මානුකූල ව සිතන ධර්මයෙහි හැසිරෙන යහපත් පුද්ගලයකු බවට පත්වීමෙන් අන්තවාදයෙන් ම්ලේච්ඡත්වයෙන් තොර මනුෂ්‍යත්වයෙන් පිරුණු සමාජයක් නිර්මාණය කර ගත හැකි ය. ඒ අනුව ධර්මයෙන් දුරස් නොවී ධර්මය තුළට ම නතු වීමෙන් ගොඩනැගෙන සිතිවිලිතුළින් සසර දුකින් එතෙර වීමට අවශ්‍ය කරන යහපැවැත්ම ඇතිකර ගැනීම තුළ සසර දුක නිමා කර නිවන කරා ළඟා විය හැකි ය.



**හේමමාලා රන්දුනු**



# සිරුර දරකඩකි

පොසොන් අමාවක පෝය

## දම් දෙසුම



**සැවැත්නුවර වාසය කළ එක්තරා කුල දරුවෙක් බුදු රදුන් දෙසු බණ අසා පැහැදී පැවිදිව විසිවයස් සපිරෙන සාමණේරවරුන් ලබන මහලු පැවිද්ද ද ලබා ගත්තේය. එයින් පසු ප්‍රකට වූයේ "තිස්ස" තෙරුන් වහන්සේ යන නමිනි. ටික කලක් ගත වීමෙන් පසු උන් වහන්සේ ගේ ශරීරයෙහි මරණයෙන් මිස ප්‍රතිකාර කිරීමෙන් සුව කළ නො හැකි රෝගයක් ඇති විය. එය සිදු වූයේ මෙසේ ය.**

මුලින් ම අබ ඇට තරම් කුඩා බිබිලි මතු වී, පසුව ඒවා මුං ඇට තරම් ද, මෑ ඇට තරම් ද, නෙල්ලි ගෙඩි තරම් ද අවසානයේදී බෙලි ගෙඩි තරම් ද විශාලත්වයට පත් විය. ඒවා පැසවා පැළී හිල් වන්නට ද විය. මුළු ශරීරය ම වේයන් විසින් කන ලද පරඬැල් කොළයක් සේ ඉතා කුඩා සිදුරු වලින් යුක්ත විය. එතැන් සිට උන් වහන්සේ "පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ" යැයි ප්‍රසිද්ධ වූ හ. පසුව තවත් දවස් කිහිපයකින් ශරීරයේ ඇට බිඳුණි. එබැවින් බැලීමටත් අපහසු විය. ඇඳිමට හා පෙරවීමට ගන්නා සිවුරු සැරවවලින් හා ලේ වලින් ගැවසී ගත්තේ ය. ශිෂ්‍යයෝත් උන් වහන්සේ දෙස බැලීමට ඇති අපහසුකම නිසා අත්හැර ගිය හ. එබැවින් උන් වහන්සේ කිසිවකු ගේ පිහිටක් නො මැති ව මඤ්චපරායන ව හෙවත් ඇඳට ම සීමා වී වැතිර සිටිය හ.

එකල්හි බුදු රදුන්ට ශරීරය කුණු වී ගියත් රහත් වීමට හේතුවන පිනින් අඩු නො වූ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ පෙණුනු සේක. භික්ෂූන් වහන්සේත් සමග එහි වැඩමවා පළමුව රෝගී තෙරුන් වහන්සේ ඇඳ පිටින් ම ඔසවා ගෙන ස්නානය කරන තැනට ගෙන ආහ. සිවුරු සේදීමට දමන ඔරුවක් ගෙන්වා ගෙන උණු වතුර එයට වත් කොට තෙරුන් වහන්සේ පොරවා ගෙන සිටි සිවුරු ඉවත් කළ හ. එම සිවුරු උණු වතුරෙන් සෝදා සැර නැති අවුවක තදින් නො වියළෙන ලෙස දැම්ම වූ සේක. පසුව බුදුරදුන් පූතිගත්ත තිස්ස තෙරුන් ළඟට ම වී තමන් වහන්සේ ගේ අතින් ම උණු වතුර වත් කරවා ඇඟ අතගා නැවූ සේක. තෙරුන් වහන්සේ ද නීරෝගී භාවයට පින නැතත්, ශක්‍ර බ්‍රහ්ම ආදීන් ගෙන් පවා අත් පා සේදීම් ආදී උපස්ථාන ලබන බුදුරදුන් ගෙන් එම උපස්ථාන ලැබීමට තරම් පින ඇති බැවින් එමදිය නැවීම ලබමින් වැඩ හුන්හ. දිය නාවා අවසන් වූ විට සේදූ සිවුරු වියළී තිබිණි. ඒවා ගෙන අවුත් උන් වහන්සේට අන්දවා අඳනය උණු වතුරෙන් සෝදවා අවුවේ දැම්ම වූ හ. දිය නෑ ශරීරයේ ජලය සිඳුණු කල්හි අඳනයත් වියළී තිබිණි. එවිට පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ අඳනය ද ඇඳ ගෙන සිවුරත් පොරවා ගෙන සැරව කුණු ඉවත් වී ශරීරය සැහැල්ලු බවට පත් ව සිත එකඟ කොට ගෙන ඇඳෙහි වැතිර සිටිය හ.

ඉක්බිති බුදු රජාණන් වහන්සේ පූතිගත්තතිස්ස තෙරුන් සමීපයෙහි වැඩ සිටිමින් මෙසේ දෙසූ හ.

අචිරං වතයං කායෝ
පඨවිං අධිසෙස්සති
ඡුද්ධෝ අපේතවිඤ්ඤාණෝ
නිරත්ථංව කලිංගරං

මේ සිරුර නොබෝ කලකින් ඒකාන්තයෙන් පහ වූ සිතැති ව, ඉවත ලන ලදුව, දිරා ගිය දඬු කඩක් මෙන් පොළොව මත හෝනේ ය.

පසුව මෙසේ ද දෙසූ හ. මහණෙනි, ලී දඬුවලින් ප්‍රයෝජන ඇති මිනිස්සු කැලෑවට ගොස් ඇද නැති ලී ඇද නැතුවම ද, ඇද ලී ඇද ඇතුව ම ද, කපා ගෙන සිදුරු තිබෙන ස්ථාන, දිරීමට පත් වූ ස්ථාන, ගැටිති සහිත ස්ථාන කපා එතැන ම දමා යත් ද, පසුව දඬු හා ලෑලි සොයාගෙන පැමිණි කෙනෙක් ගැළපෙන දඬු හා ලෑලි කපා ගෙන යන නමුත් කපා දැමූ දඬු හා ලෑලි එ පරිද්දෙන් ම රැගෙන නො යත්. තවදුරටත් එයින් යටට තැබීමට ගන්නා ලී කැබලි ආධාරකයකට ප්‍රයෝජනයක් ඇති නමුත් මෙම ආත්ම භාවයේදී ශරීරයේ ඇති කෙස්, ලොම්, නිය, දත්, සම යනාදී කුණු කොටස් තිස් දෙකින් එක කොටසක් හෝ පාද ආධාරකයකට යනාදී වූ කිසිම දෙයකට ගැනීමට නොහැකි හෙයින් කපා දැමූ දඬු කැලි ආදිය තරම් වත් ප්‍රයෝජනයක් නැත. එම නිසා මේ සිරුරෙහි රූප අරූප ජීවිතය ද නැති වන්නා සේ සැප පහසු අගනා ඇඳන්වල නිදා සිටිය ද වළ දැමීම යනාදිය මහ පොළොවේ ම වන බැවින් වැඩි කල් යාමට පෙර අත් හැර දැමූ ලී කැබැල්ලක් මෙන් මහ පොළොවට ම පැමිණෙයි.

සෑම දෙයකට ම සිරුර උචිත නො වෙතත් සිත දුබල නො වී පවත්නා නිසා මේ ආකාර වූ කිලිටි ආත්මභාවය දිගට ම පවතියි. ශරීරයේ කෙස්, ලොම්, නිය, දත් හා සම යන අංග පහ හැර ඊට වඩා වෙනත් කුණු කොටස් නැතිදිව්‍ය ආත්මභාව හා බ්‍රහ්ම ආත්මභාවයන් ද නො මැති වීම නිසා සසර අවසන් කිරීමට ම උත්සාහ කළ යුතු ය.



ඌරුගමුවේ
අස්සජී හිමි

මෙම දේශනාව අවසානයේදී පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන වශයෙන් ඇති දැනීම උපදවා එනම් සිව්පිළිසිඹියාපත් රහත් බව ලැබ කෙලෙස්වලින් හට ගන්නා රෝගයෙන් ද සුවපත් වී ආයුෂ ප්‍රමාණය ද අවසන් වූ බැවින් පිරිනිවන් පෑහ. තවත් විශාල පිරිසක් නිවන් දුටුව හ. බුදුරජාණන් වහන්සේ පූතිගත්තතිස්ස තෙරුන් ගේ සිරුර ආදාහනය කරවා අවසානයේ ධාතු ලබා ගෙන චෛත්‍යයක් ද කර වූහ.

එතැන වැඩසිටි භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි, තෙරුන් වහන්සේ මෙතරම් දැඩි දුකකින් පීඩා විඳ ශරීරයේ වේදනාව බලවත් වූ බැවින් මරණය සිදු වන විට පැවැති සිතේ පිරිසිදුකම කෙසේ ද? කවර නම් තැනක ඉපදුණ සේක් දැ" යි, විමසූ හ. බුදුහු උන් වහන්සේ පිරිනිවන් පා වදාළ බව දේශනා කළ හ. රහත් වූ බැව් අසා "ස්වාමීනි, රහත්වීමට තරම් සුදුසු මෙ බඳු වූ පින් තිබිය දීත් සිරුර කුණු වූයේ ඇයි? සිරුරේ ඇට සියල්ල බිඳී ගියේත් ඇයි ? රහත් භාවයට පත් වීමත් කෙසේ සිදුවී දැ" යි, විමසූ හ.

"මහණෙනි, මේ සියල්ලක් ම වෙනත් අයෙකු විසින් කරන ලද දෙයක් නො වෙයි. මොහු තම තමන් විසින් ම කළ දේවල් යැ" යි, පැහැදිලි කළ හ. පසුව කර්මයේ ස්වභාවය අසා දැන ගනු කැමතිව සිටි භික්ෂූන් වහන්සේලාට මෙසේ වදාළ හ.

මහණෙනි, මේ තෙමේ කාශ්‍යප බුදුරදුන් කාලයෙහි පක්ෂීන් අල්වා බැඳ විකුණා ජීවත්වීම සිදු කරන වැදි පවුලක ඉපදී මොනර, කුකුළු ආදී වූ පක්ෂීන් අල්වාගෙන නොමරා ඇති දැඩි කිරීම සඳහා බොහෝ දෙනාට දෙයි. පක්ෂීන් ඉතිරිව ඇත්නම් මරා මස් කන්නවුන්ටත් විකුණයි. විකුණා ඉතිරි වූ පක්ෂීන් මරා තැබූ විට නරක් වන නිසා පියඹා යාමට නො හැකි වන ආකාරයට කකුල් ඇට ආදිය බිඳ දමා විකුණයි. ඉතා වැඩියෙන් පක්ෂීන් ලැබුණි නම් ඔහු ද පිසවා ගෙන කයි.

එක දිනක් මස් ව්‍යංජනයක් පිසූ විට පිඬු සිඟා හැසිරෙන රහත් තෙරුන් වහන්සේ නමක් මොහු ගේ නිවසට වැඩම කළ හ. ඔහු උන් වහන්සේ දැක පැහැදීමට පත්ව "අපොයි, බොහොමයක් පර පණ නැසීම් සිදු කළෙමි. තෙරුන් වහන්සේ ද මාගේ නිවසට පිඬු සිඟා වැඩම කළ හ. නිවසෙහි දීමට කිසිවක් නැත. මස් ව්‍යංජනයක් නම් ඇත. මස් ව්‍යංජනයෙන් යුක්තව ආහාරයක් දානය පිණිස දෙමි" යි, අදහස් කළේ ය.

පසුව තෙරුන් වහන්සේට ඇරයුම් කොට පාත්‍රය අතට ගෙන මස් ව්‍යංජනයෙන් යුක්ත ආහාර පාත්‍රය පිළිගන්වා උන් වහන්සේට දෙ දණ, දෙ අත, නළල යන ශරීර අංග පස බිම තබා නමස්කාර කොට "ස්වාමීනි, ඔබ වහන්සේ ලත් නිවන නමැති රසය මා දුන් මස් ව්‍යංජන රසයේ ප්‍රධාන විපාකයෙන් මට ද වේ වා!" යි ප්‍රාර්ථනා කළේ ය. රහත් තෙරුන් වහන්සේත් "එය එසේම වේවා" යි, වදාළහ. ඒ කාලයෙහි පක්ෂීන් ගේ ඇට බිඳ දැමූ ලෙසට ම මොහු ගේ සිරුර කුණු විය. ඇට බිඳී ගියේ ය. රහතන් වහන්සේට දුන් දානයෙහි ආනිසංසයෙන් නිවනෙහි රසය ලැබුයේ ය.



# ජාතියක උදාරත්වය ලොවට පෙන්වූ බෞද්ධ පිළිවෙත

**බුදු දහමේ මූලික අභිමතාර්ථය වන්නේ පුද්ගල සන්තානය තුළ ආධ්‍යාත්මික දියුණුව ඇති කිරීමයි. ශෝකය, වැළපීම සමනය කිරීමයි.**

දුක් දෙම්නස ප්‍රහාණය කිරීමයි. ප්‍රඥාවේ පූර්ණත්වයට පමුණුවාලීමයි. අවසානයේ නිර්වාණාවබෝධය සිදු වීමයි. මෙම බෞද්ධ නිර්වාණගාමී ප්‍රතිපදාවේ ආරම්භක පියවර වන්නේ මිනිසා තුළ මානුෂීය ගුණාංග උද්දීපනය කරමින් සදාචාරා සම්පන්න පුද්ගලයෙකු බිහි කිරීමයි. ඒ සඳහා අදාළ වන ඉගැන්වීම් සමුදායක් බුදු සමය තුළ අන්තර්ගත වේ. නිදසුනක් වශයෙන් මංගල, මෙත්ත, පරාභව, වසල, ව්‍යග්ඝපජ්ජ යනාදී සූත්‍ර දේශනා දැක්විය හැකි ය. පරිපූර්ණ, ගුණගරුක, සදාචාර සම්පන්න පුද්ගලයෙක් බිහි කිරීමට බුද්ධ දේශනාවන් බෙහෙවින් උපකාරී වේ. එම උදාර මානුෂීය ගුණාංගවලින් මිනිසා පරිපූර්ණ වන විට සදාචාර සම්පන්න සමාජයක් බිහි වන බවත්, එම ගුණාංගවලින් දුරස් වන විට සමාජය පිරිහෙන බවත් අග්ගඤ්ඤ සූත්‍රයෙන් පැහැදිලි කර ඇත.

කාලයත් සමග පසුගිය සමය වන විට ඇතැම් මිනිසුන් නොමිනිසුන් බවට පත්ව සමාජය විනාශ මුඛයට පමුණුවන නොමිනිස් ක්‍රියා සමාජයේ ව්‍යාප්ත විය. එවැනි පසුබිමක් යටතේ ලෝකය තුළ කොරෝනා නමින් දරුණු වසංගතයක් ඇති විය.

කොරෝනා වසංගතය හමුවේ නැවතත් මිනිසත් බව අවදි වන්නට විය. මානුෂීය ගුණාංග යම් පමණට උද්දීපනය වන්නට ද විය. ඒ අනුව පවුල් ඒකකය ශක්තිමත් වීම සිදු විය. දෙමාපියන් දරුවන් සමගියෙන් කටයුතු කරන සමාජයක් දක්නට ලැබුණි. මුදල් පසුපස ලුහු බඳින සමාජයක, තමා සමග ජීවත් වන අය අමතක කරන සමාජයක් ගොඩනැගී තිබුණු අතර එය යම් පමණකට යටපත් වී දෙමාපියන් දරුවන් පිළිබඳව ද, දරුවන් දෙමාපියන් පිළිබඳව ද සිතන්නට විය. මව්පියන් දරුවන් එක්ව බුදුන් වහන්සේට මල් පහන් පුදමින් තමන්ටත් සෙසු අයටත් මෙත් සිත පතුරුවමින් දවස ගෙවන සමාජයක් දක්නට ලැබුණි. පරහිතකාමීත්වය යන මානුෂීය ගුණාංගය බෙහෙවින් ඉස්මතු වූ යුගයක් වශයෙන් කොරෝනා වසංගත සමය දැක්විය හැකි ය. අනුන්ගේ දියුණුව, නිරෝගී බව හා සුවපත් බව කැමැති වීම හා ඒ අනුව ක්‍රියා කිරීම පරිහිතකාමීත්වයේ ලක්ෂණයකි. සමාජයේ යහපත වෙනුවෙන් නිරෝධායනට යොමු වීම සිදු විය.

යෝනිසෝමනසිකාරය යනු අවදි වූ සිහියෙන් කටයුතු කිරීමයි. තමා කරන කියන දේවල්, යන එන ගමන් බිමන්, කායික හැසිරීම්, ශාරීරික ඉරියව් පිළිබඳව මනා අවබෝධයෙන් යුක්තව කටයුතු කිරීම යොනිසෝමනසිකාරයේ ලක්ෂණයයි. පසුගිය වසංගත සමයේ අපගේ කායික වාචසික ක්‍රියාවන් පිළිබඳ ව මිනිසුන් අවදියෙන් කටයුතු කළ බව පැහැදිලි කරුණකි. අප යන ගමන පිළිබඳව මනා අවබෝධයක් අප සතුව තිබුණි. යම් තැනකට ගියත් එහි හැසිරීම මනා සිහියෙන් සිදු කරන ලදී. ආගිය තැන් හා වේලාවන් පිළිබඳ අවබෝධයෙන් පසුවිය. මෙවැනි සිහිය පිහිටුවාගත් හැසිරීමක් මිනිසුන් තුළින් මූර්තිමත් වූයේ වසංගතය නිසා ය.

තමාගෙන් පීඩාවක් පරිසරයට සිදු නොවීමට කටයුතු කිරීම බෞද්ධයෙකුගේ ලක්ෂණයයි. බෞද්ධයෝ තමාට ඇති රෝගී තත්ත්වයන් සෙසු අය අතර පැතිර නොවීමටත් සෙසු අය කරදරයට පත් නොකිරීමත් ක්‍රියා කරමින් සෙසු අයගේ නිරෝගී බව නිතැතින් ම ප්‍රාර්ථනා කරති. එය මනාව පෙන්නුම් කළ යුගයක් වූයේ වසංගත සමයයි.

අප වාහානයක ගමන් කරන විට තමා ගමනක් යන බව සිහියේ තබා ගැනීමත්, තමා අවට සිටින අය පිළිබඳව අවබෝධයෙන් පසුවීමත් මෙ යුගයේ දක්නට ලැබුණු තත්ත්වයකි. එය සිහියෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීමකි. එය බුදු දහමේ සති සම්පජඤ්ඤ නමින් හඳුන්වයි. නිවසක සිදු වන දේ පිළිබඳව මනා අවබෝධයෙන් හා ප්‍රඥාවෙන් පසුවීම බෞද්ධ ජීවිතයක ලක්ෂණයකි. එසේ වූ විට තම පවුලේ සාමාජිකයන් අතර හා සාමාජීය වශයෙන් මනා සම්බන්ධතාවක් හා නිරෝගීමත් පරිසරයක් ගොඩ නැංවීමට සිහිය හා ප්‍රඥාව බෙහෙවින් ඉවහල් වේ.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ආචාර්ය,
**එච්. එම්. මහින්ද හේරත්**

තම ජීවිතය සෙසු අය වෙනුවෙන් කැප කිරීම උපරිම තලයකින් සිදු වූයේ බුදුන් වහන්සේගේ චරිතය තුළ ය. එය සංසාරික වශයෙන් ආත්ම ගණනාවක් තුළ සිදු කළ ආකාරය ජාතක කථා තුළින් ප්‍රකට වේ. එම තත්ත්වය වඩාත් මූර්තිමත් වූයේ බුදුන් වහන්සේගේ අවසන් ආත්ම භවයේ දී ය. සියලු සැප සම්පත් හැර දුෂ්කරක්‍රියා කරමින් සිදු කළ අනුපමේය කැප කිරීම අති ප්‍රබල ය. බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනුගමනය කරන බෞද්ධයන් විසින් යම් පමණකට හෝ සිය ජීවිතය අනුන් වෙනුවෙන් ක්‍රියා කිරීම අවශ්‍යයෙන් ම සිදු විය යුත්තකි. කොරෝනා වසංගත සමයේ රාජ්‍ය නිලධාරීන්, වෛද්‍යවරුන්, ආරක්ෂක අංශවල සියලු දෙනා සිය ජීවත පරදුවට තබා අපගේ ජීවිත ආරක්ෂා කළහ. අප අපගේ ගෞරවය ඔවුන් වෙනුවෙන් නිරතුරුව පුද කිරීමත් සැමදා සිය සිත්වල එය සිහි තබා ගැනීමත් සිදු කළ යුතු ය. එබැවින් පසුගිය සමයේ බෞද්ධයින්ගේ පරහිකතකාමීත්වය, ඉවසීම, කරුණාව, මෛත්‍රිය ආදී ගුණාංග මූර්තිමත් විය. බෞද්ධයෝ කළගුණ දන්නා පිරිසකි. උපකාර ලබා ගෙන උදව් කළ අය පසෙක දමන පිරිසක් වශයෙන් බෞද්ධයෝ ක්‍රියා නොකරති. අවස්ථාවදීහූ නොවෙති. ගුණමකු පිරිසක් ද නොවේ. එනිසා ගුණවත්, ගුණගරුක කළගුණ දන්නාවූ පිරිසක් වශයෙන් අපි සියලු දෙනාම අපගේ ජීවිත රැක දුන් සැමට සැමදා ගෞරව කළ යුතු ය.

අන්‍යන්ගේ වචනයට ගරු කිරීම හා අහුම්කන් දීම බෞද්ධයාගේ චරිතයේ ලක්ෂණයකි. අරගල කිරීම, අවි අයුධ අමෝරා ගෙන හැසිරීම, වාග් ප්‍රහර එල්ල කිරීම, සෙසු අයගේ ජීවිත හිංසාවට පත් කිරීම, මංකොල්ල කෑම බෞද්ධ චරිතයක ලක්ෂණය නොවේ. පසුගිය සමයේ බෞද්ධයෝ එබඳු යහපත් ක්‍රියාවලින් යුක්තව කටයුතු කළහ. එය සැමදා පවත්වා ගෙන යාම අපගේ වගකීම වේ.

අවංක බව හා අව්‍යාජත්වය ද බෞද්ධ ජීවිතයකින් ස්මතු විය යුත්තේ ය. එනිසා තමාට ඇති රෝගී තත්ත්වයන් නොසඟවා පැවැසීමටත්, තමා ආ ගිය තැන් දැක්වීමටත්, සෙසු අය වෙනුවෙන් නිරෝධයනයට යොමු වීමටත් බෞද්ධ ජනයා කටයුතු කළේ ය. තමාගේ ජීවිතය ආරක්ෂා කරමින් සෙසු අයගේ ජීවත රැක ගැනීම පන්සිල් පදවල පළමු ශික්ෂාපදය වන ප්‍රණඝාතයෙන් වැළකීම යන්නෙන් කියැවේ. එනිසා අපගේ ජීවිතය ආරක්ෂා කරමින් සෙසු අයගේ ජීවත අනතුරේ හෙළීම බෞද්ධ පිළිවෙත නොවේ.

අපි සමවිටම ස්වභාව දහමත් සමග ක්‍රියා කළ යුතුවේ. මිනිසා ස්වභාව දහම ඉක්මවා යන්නේ නම් එයට පරිසරයෙන් දඬුවම් ලැබෙන බවත් අමතක නොකළ යුතු ය. එය අග්ගඤ්ඤ සූත්‍රයෙන් පැහැදිලි කර ඇත. අපගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අනවශ්‍ය ලෙස ගිජු කමින්, ආශාවෙන් සියල්ල තමාට අත්පත් කර ගැනීම බෞද්ධයාගේ පිළිවෙත නොවේ. මට මෙන්ම සෙසු අයටත් සමාජයේ ජීවත් වෙමින් ක්‍රියා කිරීමේ අවශ්‍යතාව ඇති බව වටහා ගත යුතු වේ. තමාට තමා ප්‍රිය නම්, එය තමා හොඳින් රැක ගත යුතු ය. තමා පළමුව ගුණවත් වී සෙසු අයගේ පහසුව වෙනුවෙන් කටයුතු කළ යුතු ය.

තමා සමාජයට අනුන්ට හිරිහැරයක් කළේ නම් එහි විපාකය තමා විසින් විඳිය යුතුය. සත්පුරුෂයා තමාට මෙන්ම සෙසු අයටත් යහපතක් ම සිදු කරන්නේ ය. එසේම තමාගේ ක්‍රියාවල පිරිසුදු බව හා අපිරිසිදු බව රඳා පවතින්නේ තමා තුළම ය. යමෙක් තමාගේ සැප කැමැතිව සෙසු අයට හිංසා කිරීම බෞද්ධ පිළිවෙත නොවේ. මෙවැනි බුදුරජාණන් වහන්සේගේ දේශනාවන් අපගේ ජීවිතවලට තව තවත් සමීප කර ගනිමින් උදාර මිනිසුන් වශයෙන් ජීවත් වෙමු.

වසංගත සමයේ අපගේ ජීවිතවලින් මූර්තිමත් වූ ගුණාංග, යහපුරුදු, සිරිත් විරිත් සැමදා නොනැසී ආරක්ෂා කර ගැනීම බෞද්ධයාගේ ජීවිතයේ වගකීමක් බව සිහියේ තබා ගනිමු. එවිට ධර්මයෙන් ම අපව ආරක්ෂා කරයි.

# ජීවන අත්දැකීම් ඇසුරින් බුද්ධ වචනය වටහා ගන්න



**දිනක් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් හමුවූ ඡන්න නම් පරිබ්‍රාජකයා උන්වහන්සේ අමතා “ඔබ වහන්සේ රාගයේ ආදීනව දැක එය ප්‍රහීණ කිරීමට උගන්වන්නේදැයි” විමසී ය. එයට පිළිවදන් දෙමින් ආනන්ද තෙරුන් වහන්සේ තමන් වහන්සේ රාගයේ ආදිනව දැක දැන එහි ප්‍රහාණය පනවන බව දේශනා කළහ.**

අංගුත්තර නිකායේ තික නිපාත ආනන්ද වග්ගයේ ඇතුළත් පළමු සූත්‍රයෙහි පුද්ගල සන්තානගත රාග, දෝස, මෝහ යන අකුසල සහගත චිත්තවේගයන්ගේ ක්‍රියාකාරී ස්වභාවය පියවර තුනක් යටතේ ආනන්ද තෙරුන් වහන්සේ විසින් පැහැදිලි කරනු ලැබ තිබේ. ඒ අතුරින් රාගය පිළිබඳ පමණක් මෙහිදි සාකච්ඡා කරනු ලැබේ. එම විවරණය ද්වේෂය හා මෝහය සම්බන්ධයෙන් ද පොදු ය. එබැවින් නුවණැති පාඨකයාට එක් කරුණක් පමණක් ගෙනහැර දැක්වීම අවබෝධය පිණිස ප්‍රමාණවත් වේ. බුද්ධ වචනය වටහා ගත යුත්තේ ජීවන අත්දැකීම් පාදක කරගනිමින් ය. දහම තම අත්දැකීම් මගින් වටහා ගන්නා තරමට පංචකාම ලෝකයේ යථා ස්වභාවය දැක ප්‍රඥාවෙන් කළකිරීම ඇතිකරගත හැකි ය.

## රාගය අකුසල මූලයකි


ලෝභ නැතහොත් රාග යනුවෙන් හැඳින්වෙන චිත්ත වේගය අකුසල මූලයකි. එමගින් නිපැයෙන්නේ අකුසල චර්යාවන් ය. සිත පිරිසුදු කොට ප්‍රඥාව අවදිකරගැනීමෙහිලා එය සාකල්‍යයෙන් ම බැහැර කිරීම අවශ්‍ය වේ. ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් වහන්සේගේ පැහැදිලි කිරීමට අනුව රාගය මට්ටම් තුනකින් ක්‍රියාත්මක වේ.

“රාගයෙන් රත් වූ (රත්තෝ) එයින් මඩනා ලද (අභිභූතෝ) එයින් ගැවසීගත් සිත් ඇති (පරියාදින්නචිත්තො) තැනැත්තා තමාට අහිත පිණිස සිතයි. අනුන්ට අහිත පිණිස සිතයි. තමන්ට මෙන්ම අන්‍යයන්ට ද අහිත පිණිස සිතයි. චේතසිකමය වූ දුක් දෙම්නස් වින්දනය කරයි.” මෙම පළමු විග්‍රහයේ ඇතුළත් වන්නේ පුද්ගල සන්තානගත රාගය අකුසල චෛතසිකයක් ලෙස අභ්‍යන්තර මනස තුළ ක්‍රියාත්මක වන ආකාරයයි. රාගයෙන් සිත රත්වූ, එයින් මඩනා ලද පුද්ගලයා තමාට අහිත පිණිස කල්පනා කරයි. අන්‍යයන්ට අහිත පිණිස කල්පනා කරයි. තමාට මෙන් ම අන්‍යයන්ට ද අහිත පිණිස කල්පනා කරයි. එය ඔහුගේ රාගානුගත චින්තනයේ පළමු ස්වභාවයයි.

දෙවනුව ඒ හේතුවෙන් මානසිකව දුකට වේදනාවට පත්වෙයි. මේ සියල්ල සිදුවන්නේ සන්තානගතව ය. ආනන්ද තෙරුන් විසින් රාගය පිළිබඳ කෙරෙන පළමු විවරණය සඳහා භාවිත කොට ඇති “සිතයි (චෙතෙති)” යන්නෙන් එය තවදුරටත් පැහැදිලි වේ. මෙය වෙනත් ආකාරයකින් පසන්නේ නම් පළමු කොටසින් අවධාරණය වන්නේ රාගයෙන් මැඩුණු පුද්ගලයාගේ සාමාන්‍ය මානසික ස්වභාවයයි.

## බාහිර ක්‍රියාකාරිත්වය

ආනන්ද තෙරුන්ගේ විවරණයේ එන දෙවැන්නට අනුව රාගයේ බාහිර ක්‍රියාකාරිත්වය පැහැදිලි වේ. එනම් පුද්ගල මනසේ පවතින රාගය කායික වාචසික හා මානසික චර්යා මගින් ප්‍රකාශයට පත්වීම හෙවත් එහි බලපෑම නිසා තිදෙරින් ඊට අදාළ දුශ්චරිත වල නිරත වීමයි. “රාගයෙන් රත් වූ (රත්තෝ) එයින් මඩනා ලද (අභිභූතෝ) එයින් ගැවසීගත් සිත් ඇති (පරියාදින්නචිත්තො) තැනැත්තා කයින් දුශ්චරිත ක්‍රියාවල නිරතවෙයි. වචනයෙන් දුශ්චරිත ක්‍රියාවල නිරත වෙයි. මනසින් දුශ්චරිත ක්‍රියාවල නිරත වෙයි”. මිනිසා විසින් සිදුකරනු ලබන ලිංගික අපරාධ හා දුරාචාරය මේ සඳහා නිදසුන් කොට දැක්විය හැකි ය. බොහෝ කාම අපරාධ වලට මුල්වන ප්‍රධානතම මානසික සාධකය ලිංගික රාගයයි. රාගය යනුවෙන් අදහස් වන්නේ ලිංගික කාමය පමණක්ම නොවන බව මෙහිදි මතක තබා ගත යුතුවේ. රාගය යන්න බුද්ධවචනය තුළ යෙදී ඇත්තේ අතිශය පුළුල් අර්ථයකින් ය. ලිංගික රාගය එහි එක් අංශයක් පමණි. සූත්‍රාගත විවරණය අනුව දෙවැන්නෙන් අදහස් වන්නේ පුද්ගලයාගේ බාහිර චර්යාවයි. එයින් රාග නම් චිත්තවේගයේ බාහිර ප්‍රකාශනය හෙවත් බාහිරව ප්‍රකට වීම පැහැදිලි වෙයි.



කොළඹ විශ්වවිද්‍යාලයේ
බෞද්ධ අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත, ආචාර්ය
**උඩුහාවර ආනන්ද හිමි**

රාගය පිළිබඳ ආනන්ද තෙරුන්ගේ තෙවන විවරණය යථාවබෝධය හේවත් ප්‍රඥාව හා සම්බන්ධ වේ. “රාගයෙන් රත් වූ (රත්තෝ) එයින් මඩනා ලද (අභිභූතෝ) එයින් ගැවසීගත් සිත් ඇති (පරියාදින්නචිත්තො) තැනැත්තා ආත්මාර්ථය යථා පරිදි නොදකියි. පරාර්ථය යථාපරිදි නොදකියි. උභයාර්ථය ම යථා පරදි නොදකියි (යථාභූතං නප්පජානාති). ඒ හෙයින් රාගය අන්ධ බව ඇතිකරන්නේ ය. (රාගය අන්ධ ය). ප්‍රඥාව නැමැති ඇස යටපත් කරන්නේ ය. අනුවණ බව ඇතිකරන්නේ ය. ප්‍රඥාව නැතිකරන්නේ ය. දුකට අයත් වන්නේ ය. නිවීම පිණිස හේතු නොවන්නේ ය.” යනුවෙන් විවරණය කොට තිබේ. මේ අනුව රාගය පුද්ගලයාගේ යථාවබෝධයට මෙන්ම ප්‍රඥාවට බාධා පමුණුවන්නකි. රාගයෙන් අන්ධ වූ පුද්ගලයාට යමක් සම්බන්ධයෙන් සත්‍ය හෝ ඇත්ත ස්වභාවය නිවැරදිව හඳුනාගත නොහැකි ය. එයට හේතුව එම තැනැත්තා රාගය හේතුවෙන් අන්ධ වී ඇති හෙයිනි. ඔහුගේ ප්‍රඥාව නැමැති ඇස නොපෙනෙන හෙයිනි. ප්‍රඥාව යටපත්කර ඇති හෙයිනි. රාගයෙන් මුළාවී ඇති හෙයින් එවැන්නෙකුට දුක් දෙම්නසින් යුක්තව කාලය ගෙවීමට සිදුව තිබේ. රාගයෙන් රත් වූ කෙනෙකුට නිවීමක්, මිදීමක්, සිසිල් වීමක් අපේක්ෂා කළ නොහැකි ය. මේ අනුව රාගය පිළිබඳ තෙවන විවරණයෙන් එය ප්‍රඥාවට බාධකයක් වන අයුරු, යාථාවබෝධය වළක්වන අයුරු පැහැදිලිවේ.

> රාගයෙන් රත් වූ, එයින් මඩනා ලද, එයින් ගැවසීගත් සිත් ඇති තැනැත්තා තමාට අහිත පිණිස සිතයි. අනුන්ට අහිත පිණිස සිතයි. තමන්ට මෙන්ම අන්‍යයන්ට ද අහිත පිණිස සිතයි. දුක් දොම්නස් වින්දනය කරයි.

## මිදීමේ මඟ

මෙසේ රාගයේ ක්‍රියාකරිත්වය හා එහි ආදීනව මැනවින් දැන දැක එය ප්‍රහාණය කිරීමට උපදෙස් දෙන බව ආනන්ද හිමියෝ පැවසූහ. ඉක්බිති ඡන්න පරිබ්‍රාජකයා එයින් මිදෙන මග හා එයට අදාළ ප්‍රතිපදාව කවරේදැයි ආනන්ද තෙරුන්ගෙන් විමසී ය. රාගයේ ක්‍රියාකාරී අවස්ථා තුන විවරණය කළ ආනන්ද තෙරණුවෝ ඡන්න පරිබ්‍රාජකයාට එය ප්‍රහාණය කරන ඒකායන මාර්ගය හා පිළිවෙත ලෙස දැක්වූයේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එම පිළිවෙත අනුගමනය කිරීමෙන් රාගයෙන් මිදිය හැකි බව සහතික කොට පැවසූහ.

මතුපිටින් සරල යැයි පෙණුන ද ආනන්ද තෙරුන්ගේ රාග, දෝස, මෝහ පිළිබඳ විවරණය අතිශය ගැඹුරු මනෝවිද්‍යාත්මක පදනමකින් යුක්ත වේ. රාගය මට්ටම් තුනකින් ක්‍රියාත්මක වන ආකාරය එයින් විවරණය කර තිබේ. පළමු මට්ටමෙන් රාගික පුද්ගලයාගේ අභ්‍යන්තර සිතිවිලි හා අදහස්වල සාමාන්‍ය ස්වභාවය පැහැදිලි වේ. රාගයෙන් රත්වූ පුද්ගලයා සිතන ආකාරය එසේ නොවේ යැයි කිසිවෙකුටත් පැවසිය නොහැකි ය. රාගය හා සම්බන්ධ පංචකාම ලෝකයට අයත් වස්තුකාම හා කිලෙස කාම තම සිතැඟි පරිද්දෙන් අත්පත් කරගත නොහැකි නිසා පුද්ගලයා මානසික ව දුකට පත්වේ. තමා සිත් ගත් පංචකාම වස්තූදිනා ගැනීමේ අරගලයේදි පුද්ගලයා අතිශය දරුණු හා සැහැසි අයුරින් ක්‍රියාත්මක වන බව ඇතැම් කාම අපරාධ හා සම්බන්ධ සිදුවීම් පිටුපස ඇති මානසික සාධක ගැඹුරින් විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි වේ.

## පුද්ගල චර්යාව

පුද්ගල චර්යාව කෙරෙහි මනසේ ඇති බලපෑම මෙතරම් ගැඹුරින් විවරණය කර තිබෙන්නේ බුදු දහමේ පමණි. එබැවින් එම විවරණය බටහිර ලෝකය මවිතයට පත්කිරීමට හේතුවී තිබේ. මනස පවිත්‍ර කිරීමෙන් පුද්ගලයාගේ චර්යාව ද පිරිසිදු වන බවත්, මනස අපවිත්‍ර වීමෙන් පුද්ගල චර්යාව දූෂිත වන බවත් බුදුරදුන්ගේ ඉගැන්වීමයි. ආනන්ද තෙරුන්ගේ අවසන් විවරණයෙන් පෙන්වා දෙන්නේ රාගය ප්‍රඥාව යටපත් කරන ආකාරයයි. ප්‍රඥාව උදාකරගැනීම බුදුදහමේ අවසාන අරමුණයි. එය මස්තකප්‍රාප්ත වන්නේ ආශ්‍රව ක්ෂය කිරීමෙන් ය. රාග, දෝස, මෝහ ආශ්‍රව ධර්මයෝ ය. එයින් මිදුණු සිත ප්‍රඥාවේ ආලෝකයෙන් ආලෝකමත් වේ. බුදුරදුන් මෙන්ම රහතන් වහන්සේලා ද එම ප්‍රඥාවේ ආලෝකය උදා කරගත් උතුමෝ වෙති. එම ආලෝකය උදාකරගත හැකි මාර්ගය හා ප්‍රතිපදාව අරිඅටඟි මගයි.



# සංසිඳුණු සිත



බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

**ඉවසීම බෝධිසත්ව උතුමන් විසින් පුරුදු කරනු ලබන පාරමිතාවකි. එය දස පාරමිතා අතර ඛන්ති පාරමිතාව හෙවත් ශාන්ති පාරමිතාව හැටියට පෙන්වා දී තිබෙනවා. ධර්මයෙන් විග්‍රහ කරන්නේ නම් "යථාවබෝධය ලැබෙන විට ඉවසීම නම් වූ නුවණ, ඤාණය ස්වභාවයෙන් ම සිත තුළ ඇතිවන බවයි.**

මෙය ධර්මානුකූලව සඳහන් කළොත් "සබ්බේ සංඛාරා අනිච්චාති" යන්නට ඇතුළත් කර ගන්න පුළුවන්. සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යය, දුක්ඛය, අනත්තයට යටත් ය කියන වචන පෙළින් අපිට තේරුම් ගන්න පුළුවනි. අපගේ ජීවිතය හට අරගෙන, බිඳී නැති ව යන්නේ ය. යමක් හට අරගෙන බිඳී නැතිව යන්නේ නම්, එය ස්ථිර නොවන්නේ ය. එය නිරන්තර වෙනස්වීමකට පත්වෙන්නේ නම් එය මගේ කියා හෝ මම වෙමි කියා හෝ මගේ වසඟයේ, මම කැමැති පරිදි පවත්වා ගැනීමක් ඇත්තේ ය යනුවෙන් ගැනීමට බැරිය. සිතෙහි දරා ගැනීමට බැරිය. මේ අදහස ඉතා ම මැනවින් තේරුම් ගැනීම යථා භූත ඤාණයයි. ඒ යථාභූත ඤාණය පහළ වන විට සම්මත ලෝකය තුළ අප කරන කියන සෑම දෙයක් ම කැමැති වූව ද, ඇකැමැති වූව ද ඒවා ඒ ආකාරයෙන් ම දැන ගැනීමට අවශ්‍ය වෙනවා. එනම් යහපත් වූ දේ යහපත් ලෙස දකිනවා. එහෙත් ඒවා මගේ ය. මම වෙමි. මට ඕනෑ ආකාරයෙන් පවතිනවා ය කියන හැඟීම සිතෙන් දැඩිව ගන්නේ නැහැ. එතැන දී අදහස් කරන්නේ ලෝභය සංසිඳවීමයි. ඒ වගේ ම යම් වස්තූන්, පුද්ගලයන් හා සිතිවිලි වෙනස්වීම නිසා අපේ සිතෙහි අකමැති බවක් ඇතිවෙන්න පුළුවන්. තමන් කැමැති දෙයක් එසේ නොපැවතී ම වෙනස්වීමයි. එය සංස්කාර වස්තූන්ගේ ස්වභාවයයි. අන්න ඒ වෙනස්වීමේ දී සිතෙහි ගැටීමක් තරහවක්, ව්‍යාපාදයක් ඇතිකර ගන්නේ නැතිවීම අර යථාවබෝධයෙන් ඇතිවන ඵලයක්. යම් ආකාරයෙන් අවබෝධ කර ගන්නා විට ම ඉවසීමේ ගුණය ඇතිවෙනවා. ඉවසනවා යන අදහසින් පෙන්නුම් කරන්නේ, තමන්ට යමක් කරගන්න, කියා ගන්න බැරි වූ විට ඕනෙ දෙයක් සිදුවුණා දෙන් කියන අදහසින් නිශ්ශබ්දව සිටීම ම නොවෙයි. සමාජමය වශයෙන් බැලූ විට අන් අයගේ නපුරු වචනවලට නපුරු වශයෙන් ප්‍රතිචාර නොදක්වා. නපුරු ක්‍රියාවලට නපුරු ක්‍රියාවෙන් ප්‍රතිචාර නොදක්වා සංසුන් ව සිටීම හොඳයි. නමුත් ධර්මානුකූල අදහසින් නම් සිතේ තරහව, වෛරය, කේන්තිය, නොරුස්නා බව සිතෙහි දරාගෙන ඉවසනවා කියන අදහස පෙන්නුම් කරමින් කතා නොකොට, ක්‍රියා නොකොට සිටීම වැදගත්කොට සලකන්නේ නැත. වැරැදි ලෙස කතා කිරීම හැසිරීම නොකොට යුතු දෙයක්. එය මතුපිට අර්ථයයි. නමුත් ධර්මානුකූල අදහස නම් සිතෙහි ඇතිවන තරහව, වෛරය, ක්‍රෝධය, නපුරුකම් කිරීමට ඇතිවන සිතිවිලි පාලනය කර ගැනීමයි. අවසානයේ සංසිඳවා ගැනීමයි. මෙයයි යමක් තතු තතු ආකාරයෙන් දැනගන්නා විට ඇතිවන නුවණ, ඉවසීමේ ගුණය හැටියට පෙන්නුම් කළේ. මෙය විදර්ශනාවයි. යමක් ප්‍රිය වුණත්, ප්‍රිය ස්වභාවය සමඟ කටයුතු කරනවා. ධර්මානුකූල ව කටයුතු කරනවා. සීලයේ පිහිටා කටයුතු කරනවා. නමුත් තදින් ඇලීමක් ඇති කර ගන්නේ නැහැ. අකමැති අරමුණකට මුහුණ දුන්නත් අකමැති බව දකිනවා. නමුත් එයට නරක ලෙස තරහ, වෛරය, ඊර්ෂ්‍යාව සමගින් වචනයෙන් ක්‍රියාවෙන් හෝ සිතිවිලිවලින් ප්‍රතිචාර දක්වන්නේ නැහැ. එයට හේතුව හට අරගෙන බිඳී යන වස්තූන් ය, යන අදහස යථාවබෝධයෙන් දැනගෙන සිත තුළ අකුසල කර්ම රැස්නොකොට ගැනීමට තමා තුළ ඇති හැකියාවයි. මෙය කරණීය මෙත්ත සූත්‍රයේ "සක්කෝ" වචනයෙන් පෙන්වා දී තිබෙනවා. මේ සඳහන් කළේ ගැඹුරු ධර්ම විවරණයයි.

සරල ලෙස සඳහන් කරන්නේ නම්, මේ උතුම් ධර්ම විවරණය කුඩා කල පටන් ඕනෑම කෙනෙකුගේ ජීවිතය තුළ පුරුදු කර ගත යුතු ගුණයකි. උපතින් ම ලැබෙන ස්වභාවය නම් කැමැති අරමුණේ ඇලීමත්, අකමැති අරමුණේ ගැටීමත් ය.


පුංචි ම දරුවෙක්, අම්මාගේ උණුසුමට ළංවීමට කැමැතියි. අම්මාගේ උණුසුම නොවූ විට හැඬීමට පත්වෙනවා. ඒ උණුසුම නැතිවීම නිසා ඇතිවන අකමැත්ත නිසයි, කුසගින්න දැනෙන විට කිරි බීමට කැමැති වෙයි. එහෙත් කුසගින්න නම් වූ අකමැති සිතිවිලි පහළවන විට කෑ ගසා හඬන්නට, දඟලන්නට වේ. එය ස්වභාවයෙන් ඇතිවන සිදුවීමක්. මනුෂ්‍යයන්ට පමණක් නොව තිරිසන් සත්වයන්ටත් එය පවතිනවා.

මේ නිසා පළමුවෙන් අප ඉහත සඳහන් කළ ධර්ම විවරණය අනුව වැඩිහිටියන්, මව්පියන් විසින් ඉවසීමේ ගුණය ධර්මානුකූල අදහසකින් පුරුදු කරගත යුතුයි. එය අවබෝධයෙන් ඇති කරගන්නා වූ ඉවසීමයි. එනම් ලෝභයක්, ද්වේෂයක්, මෝහයක් මුල් කර ගත් තරහව, වෛරය හෝ දැඩි ආශාවන් ඇති නොවන ආකාරයෙන් සිත සංසිඳවා ගැනීමයි. ඉවසීමේ ගුණය හැටියට ධර්මයේ පෙන්වා දෙන්නේ. එය ඔබේ ජීවිතවලටත් පැහැදිලියි. යමක් හැබෑවට සමාජ සම්මතය තුළ යහපත් වූ දේ පවා තදින් ඇලෙන්න යෑමේ දී විපත් විය හැකියි. එතනදිත් සඳහන් කරන්නේ කොයිතරම් කැමැති වුණත් ඔබට ඒවා පවා පරිහරණය කිරීමේ දී ඉවසීමක් තිබිය යුතු බවයි. ඕනෑවට වඩා කලබල වී සම්මතයේ පවතින යහපත් වූ දේට පවා ඇලෙන්නට, බැඳෙන්නට යෑම නො ඉවසීමේ ගුණය නිසයි. "නුඹේ පවතිනා නො ඉවසීම නිසා ම නුඹට ලැබෙන්න තිබුණු දේ නුඹෙන් නැතිව ගියා. "ලැබුණ දේ නුඹ විනාශ කර ගත්තා" කියන තැනක පවතිනවා. ඒ වගේ ම අනවබෝධයෙන් කටයුතු කරන විට තමන් අකමැති දේට මුහුණපාන්නට සිදුවෙනවා. එනම් අන් අයගේ රැවුම්, ගෙරවුම්, තාඩන, පීඩන, නපුරු, වචන, පරුෂවචන, කේළාම් ආදී වශයෙන් මේ සියල්ලක් කෙරෙහි ම දැඩිව තමාගේ සිත තුළ තරහ, වෛරය ඇති වෙනවා. එයට වචනයෙන්, සිතිවිලිවලින්, ක්‍රියාවෙන් විවිධ ආකාරයෙන් ප්‍රතිචාර දක්වන්නට යාමත්, එය නො ඉවසන ගුණයක්. සමාජය තුළ වඩාත් ම නො ඉවසීම හැටියට පෙන්නුම් කරන්නේ එයයි. ඒවා ඉදිරියෙහි සිතේ ස්වභාවය කෙසේ වෙතත් වචනයෙන්, පරුෂ වචනයෙන් හෝ වෙනයම් ආකාරයේ සැරපරුෂ ආකාරයෙන් බොරුකීම්වලින් ප්‍රතිචාර දක්වන්නේ නැති නම් ගහ බැණ ගැනීම්, නපුරුකම් කිරීමේ වැරැදි ලෙස හැසිරීම් ආදියෙන් ක්‍රියා කරන්නේ නැති නම් එය ඉවසීම හැටියට සමාන්‍ය ලෝකයා පෙන්වා දෙනවා. නමුත් ඉහත සඳහන් කළ ධර්ම විවරණයෙන් සිතින් ම අවබෝධයෙන් අකුසල කර්ම රැස් නොවන ආකාරයෙන් සිතෙහිත්, වචනයෙහිත්, ක්‍රියාවෙත් ඇති කර ගන්නා වූ පාලනය සංසිඳීම ඉවසීමේ ගුණයයි.

**ඉතිරි කොටස ඇසළ පුර අටවක පෝද පත්‍රයේ පළවේ**

**දීපා පෙරේරා**

**රහතන් වහන්සේගේ ජීවිත පැවැත් ම සාමාන්‍ය අපට වටහා ගැනීමට අසීරු යි. එතරම්ම සැහැල්ලු යි. සරලයි. නිදහස්. මේ ලෝකය තුළ ඉතාමත් ම නිදහසේ ජීවත් වන්නේ රහතන් වහන්සේ යි. ඒ රහතන් වහන්සේලා සතර, සතිපට්ඨානය තුළයි ජීවත් වෙන්නේ. උන්වහන්සේලා තෘෂ්ණාවට ඇලෙන්නේ නෑ. විල අතහැර යන හංසයන් මෙන් කුඩා මහත් හැම දෙයක් ම අත්හැර දානවා. කයින් යහපත් ක්‍රියා ඇති ඉතා යහපත් වචන කතා කරන, යහපත් සිතුවිලි සිතන නිකෙලෙස් රහතන් වහන්සේ වැඩසිටින පරිසරය පවා ලස්සනයි.**



# සුනීත මහරහතන් වහන්සේගේ උදානය

**අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි ව මහරහත්භාවයට පත් වූ සුනීත තෙරුන් වහන්සේගේ පෙර ජීවිත කතාව මෙසේ යි.**

උන්වහන්සේ පෙර බුදුරජාණන් වහන්සේ හමුවේ ප්‍රාර්ථනා සිදුකොට ඒ ඒ භවයේ දී බොහෝ පින්දහම් සිදු කරමින් දෙව්, මිනිස් දෙගතියේ උපත ලැබුවා. බුද්ධ ශූන්‍ය කාලයක සිටු නිවසක ඉපිද, තරුණ වියේ දී තම යහළුවන් සමඟ ක්‍රීඩා කරමින් සිටින අවස්ථාවක එක් පසේ බුදුරජාණන් වහන්සේ නමක් පිඬුසිඟා වඩිනවා මේ තරුණයා දුටුවා. ඔහු පසේ බුදුරජාණන් වහන්සේ වෙත ගොස්

"මේ මුළු සිරුරේ ම තුවාල ඇති අයෙක් මෙන් ශරීරය ම වසාගෙන පිඬුසිඟා යාමේ කවර ප්‍රයෝජනයක් ද? කෘෂිකර්මය, වෙළෙඳාම ආදිය කරමින් තමන්ගේ ජීවිකාව කරගෙන, තමන් යමක් උපයාගෙන ජීවත් වීම අකැප ද? ඔබ එසේ කිරීමටත් අකමැතිනම් නිවෙස් තුළ ඇති මළමුත්‍රා අපද්‍රව්‍ය බැහැර කරමින් කසළ ශෝධකයෙක් ව හෝ ජීවත් වෙන්න. මෙසේ යදින්න එපා"

යැයි කීවා.

ඔහු සිදුකරගත් එම පාපකර්මය නිසා බොහො කාලයක් නිරයේ ඉපදී අනන්ත අප්‍රමාණ දුක් වින්ඳා. එයින් චුත ව මිනිස් ලොව ඉපදෙන ඉපදෙන බොහෝ ආත්මවල කසළ ශෝධක කුලයේ ඉපිද දුක් වින්ඳා.

අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශාසනය බබළන කාලයේ ඔහු නැවත කසළ ශෝධක සැඩොල් කුලයේ සුනීත නමින් ඉපදුණා. කුඩා කාලයේ සිට ඔහු නිවෙස්වලට ගොස් ඒ නිවෙස්වල එකතුවෙන අශුචි කරගසාගෙන ගොස් ඒවා ඉවත් කරමින් ජීවිකාව ගෙන ගියා. තමන්ට කුස පිරෙන්න ආහාරයක්, අඳින්නට පිරිසුදු ඇඳුමක් ඔහුට ලැබුණේ නැහැ. දිනපතා ම බොහෝ කුසගින්නේ අපිරිසුදුවයි ඔහු ජීවත් වුණේ.

දිනක් අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් ලොව දෙස බැලූ සේක. සුනීතගේ චිත්ත අභ්‍යන්තරයේ ඇති කුසල ශක්තිය කළයක දැල් වූ පහනක් මෙන් බබළමින්, අරහත්වය පිණිස ඇති පින උන්වහන්සේ දුටු සේක.

රාත්‍රිය ඉක්ම ගොස් ඉර උදා වුණා. පෙරවරුවේ භාග්‍යවතුන් වහන්සේ සිවුරු පෙරවා භික්ෂූන් වහන්සේ පිරිවරාගෙන රජගහනුවරට පිඬු පිණිස වැඩියා. සුනීත අසුචි ඉවත් කරන වීදියට වැඩම කළ බුදුරජාණන් වහන්සේ සුනීතගේ ඉදිරියට වැඩම කළා. සුනීත දඒ ඒ නිවෙස්වලින් ඉඳුල්, මළමුත්‍රා, කැලි කසළාදිය රැස්කරගෙන කුඩයක දමාගෙන කදක් මෙන් එය බැඳගෙන කරතබාගෙන බුදුහිමි වඩින මාවතට ම පිවිසුණා. තමාගේ ඉදිරියට භාග්‍යවතුන් වහන්සේ ඇතුළු ආර්ය මහා සංඝරත්නය වඩිනවා දුටු සුනීත ඉතාම කලබලයට පත්ව, කිසිවක් කරකියා ගත නොහැකිව ඉවත්වීමට මාවතේ ඉඩද නැති නිසා කසළ කද බිත්තිය පසෙක තබා ගෞරවයෙන්, බියෙන් දෑගිලි බැඳගෙන බිත්තිය පැත්තට හැරී සිටියා.

සුනීත ගේ ජීවිතයේ ඇති කුසල මූලයන් දැක ඔහුට අනුකම්පා කළ භාග්‍යවතුන් වහන්සේ සුනීත ඉදිරියේ ම වැඩ සිටියා.

බියටත්, ලජ්ජාවටත් පත් සුනීත ජාතියෙන් ද, කර්මයෙන් ද ඉතා පහත් තමන්ට මෙසේ කාරුණික ව තමන්ගේ නම කියා අමතන ශාස්තෘන් වහන්සේ ගැන මහත් ගෞරවයක් හට ගත්තා.

"සුනීත මේ දුක්ඛිත ජීවිතයෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? පැවිදිවීමට කැමැති ද?" යැයි විමසා සිටියා. ශාස්තෘන් වහන්සේගේ වදන් ඇසූ සුනීත අමෘතයෙන් අභිෂේක කරන ලද අවස්ථාවක මෙන් මහත් උදාර වූ ප්‍රීති සොම්නසට පත්වුණා. දෑගිලි බැඳගෙන සුනීත මෙසේ කියා සිටියා. "භාග්‍යවතුන් වහන්ස, මා වැන්නවුන් ද මේ බුදු සසුනේ පැවිදි කරන සේක් නම්, මම පැවිදි නො වී සිටින්නේ කුමන කරුණකට ද? භාග්‍යවතුන් වහන්ස, මා පැවිදි කරන සේක්වා" යැයි පවසා සිටියා. ශාස්තෘන් වහන්සේ "එව මහණ " යැයි වදාළ සේක. ඒ සමගම ඒහි භික්ඛුභාවයෙන් පැවිදි උපසම්පදා දෙක ම ලැබූ සුනීතට සෘද්ධියෙන් පා සිවුරු ලැබුණා. මහා තෙර නමක් මෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියා.



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඥාණානන්ද හිමි**

භාග්‍යවතුන් වහන්සේ සුනීත තෙරුන් විහාරයට කැඳවාගෙන ගොස් කමටහන් දී වදාළා. උන්වහන්සේ පළමුව අෂ්ඨසමාපත්ති හා පංචඅභිඥා උපදවාගෙන පසුව විදසුන් වඩා ෂඩ් අභිඥාලාභී තෙරුන් වහන්සේ නමක් බවට පත්වුණා. උන්වහන්සේ වෙත පැමිණි ශක්‍ර දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද, වන්දනා කළා. සුනීත මහ රහතන් වහන්සේ උදානයකින් තමන් වහන්සේ පිළිබඳව මෙසේ වදාළා.

මම ඉපදුණේ අඩුකුලයේ පවුලක. හරිම දුප්පත්. හරියට කෑමක් බීමක්වත් තිබුණේ නැහැ. මගේ රස්සාවත් හරිම පහත් එකක්. වැසිකිළිවල අසූචි බැහැරට ගෙනයන එකයි මම කළේ.

මිනිසුන් මා පිළිකුල් කළා. පරිභව කර, නින්දා කළා. ඉතින් මම ඉතා යටහත් සිතින් බොහෝ දෙනෙකුට වැඳගෙනයි හිටියේ.

නමුත් මට පුදුමාකාර වාසනාවක් තිබුණා. එදා රජගහනුවරට ස්වාමීන් වහන්සේලා පිරිවරාගෙන මහා වීර වූ සම්බුදු සමිඳුන් වඩිනා ආකාරය මම බලාගෙන හිටියා.

අසූචි කද පැත්තකින් තිබ්බා. උන්වහන්සේ සිරිපතුල් වැඳ ගන්නට ළං වුණා. එතකොට ඒ පුරුෂෝත්තමයා මම ගැන අනුකම්පා කරලා වඩින ගමන නරත කරලා හිට ගත්තා.

මම ශාස්තෘන් වහන්සේගේ සිරිපතුල් වන්දනා කළා. පැත්තකින් හිටියා. හැමදේට ම වඩා උතුම් පැවිදි බව මටත් ලබාදෙන්න කියලා මම ඉල්ලා සිටියා.

හැම දෙනා ගැනම අනුකම්පා පිරුණ මහා කාරුණික ශාස්තෘන් වහන්සේ පින්වත් භික්ෂුව මෙහෙට එන්න කියා මට වදාළ සේක. ඒක තමයි මගේ උපසම්පදාව.

මම ආරණ්‍යයෙහි තනිවමයි ඉන්නේ. කිසිම කම්මැලිකමක් නැහැ. බුදු සමිඳුන් මට කියා දුන් ආකාරයට මම කටයුතු කළා.

රාත්‍රියේ පළමු යාමයේ පුබ්බේනිවාසඥානය ලබා ගත්තා. මැදියම් යාමයේ දිබ්බචක්ඛු ඥානය පිරිසුදු කර ගත්තා. රාත්‍රි පහන් වන යාමයේ අවිද්‍යා අන්ධකාරය නැත්තට ම නැති කළා.

එදා හිරු නැග එද්දී සක් දෙවිඳුන්, මහ බඹුන් මා වෙත පැමිණ වැඳ නමස්කාර කළා.

ඔබ ශ්‍රේෂ්ඨ පුරුෂයෙක්. ඔබට නමස්කාර වේවා! උතුම් පුරුෂය ඔබට නමස්කාර වේවා! දුක් රහිත මුනිඳුනි, ඔබේ සිත තුළ කිසිම ආශ්‍රවයක් නැහැ. ඔබ ලෝකයාගේ පුද පූජාවන්ට සුදුස්සෙක්.

මා පිරිවරාගෙන සිටින දෙව් පිරිස් දුටු ශාස්තෘන් වහන්සේ සිනහ පහළ කළා. ඉන් පස්සේ මේ කරුණ වදාළා.

කෙලෙසේ තැවීමෙනුත්, බඹසර ජීවිතයෙනුත් , සංවරකමෙනුත්, ඉන්දිය දමනයෙනුත් තමයි බ්‍රාහ්මණයෙක් වන්නේ. මේ ඉන්නේ ඒ උතුම් බ්‍රාහ්මණයෙක්".

නයනා නිල්මිණී

බුදුසරණ
35, ඞී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
පොසොන් අමාවක 2020.06.20

## ලද දෙයින් සෑහීම

ජීවිතයේ පරම ධනය සතුට වන බව ය, බුදු දහමේ ඉගැන්වෙන්නේ. සතුටින් ජීවත් වීමට සියයල්ලෝ කැමති වුව ද සතුට සොයා ගොස් දුකෙහි වැටෙන්නෝ අපමණ වෙති. බොහෝ දෙන සතුට මනින්නේ මිල මුදල් වලිනි. වෙනත් ධන සම්පත් වලිනි. ඒ නිසා ම අපමණ ධනය ගොඩ ගසා ගනිති. එහෙත්, සෑහීමකට පත් නොවෙති. තව තවත් සොයා යති.

ඒ අධිකතර ආශාව තුළ ඒ පුද්ගලයාට හොඳ නරක නොපැහැදිලි ය. දෑස් අන්ධ ය. අන්ධ දෙනෙතින් තමන්ගේ ගොඩ වැඩි කර ගන්නට කවර හෝ උපක්‍රම යොදන්නේ ය. සමාජය තුළ අප බොහෝ විට අත් විඳින්නේ මේ අධිවේගයෙන් යන ගමන තුළ වන අකටයුතුකම් ය. පුද්ගල වශයෙන් මෙන් ම පාරිසරික වශයෙන් ද වන විනාශයන් ය. ලෝකය පුරා පැතිරී ගිය කෝවිඩ් වසංගත උවදුර ද දීර්ඝ කාලයක් පුරා වර්ධනය වූ ඒ අමානුෂිකකමේ ම ප්‍රතිඵලයක් ලෙස සිතිය හැකි ය.

තමන්ගේ දියුණුව, තම දූ දරුවන්ගේ නෑදෑ හිත මිතුරන්ගේ දියුණුව උදෙසා යැයි කවර හෝ උපක්‍රමයකින් පින් පව් නොතකා, යුතු අයුතුකම් නොතකා මේ යන ගමන තුළ ආධ්‍යාත්මික ව පිරිහෙන්නේ තමන් ම බව බොහෝ දෙනාට වැටහෙන්නේ බොහෝ කල් ගෙවී ගිය පසු ය. ඒ ද, මරණ මඤ්චකයේ දී ය.

ඉහිරුණ කිරට හඬා වැලපීමෙන් පළක් නොවන්නේ ය. අපට නිවැරැදි වන්නට ජීවිත කාලය තුළ බොහෝ අවස්ථාවන් උදාවේ. ළමා වච්විය, තරුණ විය, වැඩිහිටි, මහලු යන මේ කවර අවස්ථාවක හෝ වරද වටහාගෙන නිවැරැදිවීමට පුළුවන.

"සෑහීමට පත්වීම" එහිදී ප්‍රධාන තැනක් ගනී. යම් දෙයකින් සෑහීමට පත් නොවන තාක් කෙනෙකුට තමන්ගේ ජීවන ප්‍රපදව නිවැරැදි කර ගැනීම අපහසු ය. ඒ තුළ අයහපත් බොහෝ දේ නිර්මාණය වන බැවිනි.

බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ වීරියාරම්භ වර්ගයේ දී දේශනා කොට වදාළේ නූපන් අකුසල් දහම් ඉපදීමටත්, උපන් කුසල් දහම් පිරිහීමටත් මහෙච්ඡතාවය හා සම අන් එකදු දහමක් නොදකින බව ය.

ලද දෙයින් සෑහීමකට පත් නොවන පුද්ගලයාගේ ජීවිතය හිස් ය. භෞතික ව කෙතරම් දේ ගොඩ ගසා ගත්ත ද, ඇතුළ ාන්තය තුළ නිරන්තරයෙන් ගොඩ ගැසී පවතින තෘෂ්ණාව, මානය, බිය, අනුන් ඉක්මවා යාමේ ආශාව, වෛරය, ක්‍රෝධය ඒ පුද්ගලයා ආගාධයට ඇද දමයි. ඒ තුළ සිදු කරගන්නා අකුසලය බරපතළ ය. අප බොහෝ දෙනෙක් නොදැනුවත්ව ම ගමන් කරන්නේ මේ මග ම බව පෙනෙන්නේ සමාජ ගත ජීවිතයේ අත් විඳින දේ තුළ ය. එහෙත් බෞද්ධ සමාජයක එවැනි පරිසරයකට ඉඩක් නැත.

බෞද්ධයා යන ගමන පිරිසුදු විය යුතු ය. කරන කියන දේ වැඩ දයක වන්නේත්, අවැඩදයක වන්නේත් අප සිතන පතන දේ අනුව ය. සිතිවිලි පිරිසුදු විය යුතු, පිරිසුදු කරගත යුතු වන්නේ එහෙයින් ය.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ලෙස, නූපන් කුසල් දහම් ඉපදීමටත්, උපන් අකුසල් දහම් පිරිහීමටත් හේතුවන අල්පේච්ඡතාව වැනි එකදු දහමකුදු නොවේ. එහෙයින් අප අල්පේච්ඡතාවය ම පුරුදු පුහුණු කළ යුතු ය. ලද දෙයින් සෑහීමට පත්වන කල ජීවිතය පහසු ය. සිතිවිලි ද පිරිසුදු ය. වෛරය, කෝපය, මානය, ඊර්ෂ්‍යාව, පළි ගැනීමේ සිතිවිලි නූපදින්නේ ය. කෙනෙකු ඉක්මවා යාමේ අදහස් නූපදින්නේ ය. හොඳ නරක හඳුනන එවැනි පුද්ගලයා තමන්ට ද අනර්ථ, අනුන්ට ද අනර්ථ දේ නොකරන්නේ ය. තමන් කරන කියන දැයෙහි වගකීම ද ඵලවිපාකය ද තමන්ටම බව දැන ජීවන ප්‍රතිපදාව සකසා ගන්නේ ය.

# කොරෝනා වසංගතය හෙළි කළ

# බෞද්ධ සම්ප්‍රදාය



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, ආචාර්ය

**ඕමල්පේ සෝභිත නා හිමි**

**අප මේ ගෙවා දමන්නේ ලෝකයම සලිත කළ අඳුරු කාලපරිච්ඡේදයක්. පසුගිය දින කිහිපය දෙස ආපසු හැරී බැලුවහොත් ලංකාව පමණක් නොවෙයි සමස්ත ලෝකයම බරපතළ අර්බුධයකට මුහුණ දුන්නා.**

කොරෝනා නැතිනම් කොවිඩ් 19 වෛරසය මුල්කරගෙන රටක් විදිහට අපිත් බරපතළ තත්ත්වයකට මුහුණ දුන්නා. එතැනදී අප කවුරුත් මහන්සි ගත්තේ මේ උවදුරින් තමන් ආරක්ෂා වෙන ගමන් අනෙක් අයත් ආරක්ෂා වෙන ක්‍රමවේදයකට මුහුණ දීමටයි. අද අප මාස තුනකට පස්සේ සුබවාදී ලෙස හිස ඔසවන්න පටන් අරන්. සාර්ථක ලෙස මේ උවදුරෙන් මිදෙන්න හැකියාව උදා කරගත්තා.

මේ සටහන තබන මොහොතවන විටත් භූතානයෙන් එකම මරණයක්වත් නැහැ. මොංගෝලියාවෙන් එකම මරණයක්වත් නැහැ. ලාඕසය, කාම්බෝජය, වියට්නාමයත් එහෙමයි. අවම තත්ත්වයක් ලෙස බැලුවොත් මියන්මාරය, තායිවානය වගේ රටවල දෑතේ ඇඟිලි ගණනටත් අඩුවෙන් මරණ වාර්තා වුණේ. ලංකාවේ එකොළොස් දෙනයි. තායිලන්තයේ පමණක් මරණ 58 ක් වාර්තා වුණා.

මේ සියලු රටවල කොරෝනා වයිරස ආසාධිත තත්ත්වයන්ට මුහුණ දීලා සාර්ථකව හිස එසවූ රටවල්. මේක හරිම අපූරු, ඒ වගේම පුදුම සාර්ථකත්වයක් බව ඔබට පෙනෙන්න පුළුවන්.

තවත් පැත්තකින් අපි ගමු ඇමරිකාව. මේ වන විට ලක්ෂ යට වඩා මරණ සංඛ්‍යාවක් වාර්තා වෙනවා. අපේ අසල්වැසි රට ඉන්දියාවේ තත්ත්වය එන්න එන්නම අයහපත්. ලෝකයේ අතිශයින්ම දියුණුයැයි සම්මත අධි තාක්ෂණික බලය තිබෙනවා යැයි විශ්වාස කරන, වෛද්‍ය තාක්ෂණය ඉතාම දියුණු යැයි ඔවුන් සිතන යුරෝපය හා බටහිර රටවල තත්ත්වය ඉතාම ඛේදජනක තත්ත්වයන්ට පත්වුණා. සිරුරු වළ ලන්න හෝ ආදාහනය කරගන්න තැන් නැති වුණා. ඒක හරියට බෞද්ධ සාහිත්‍යයේ එන විශාලා මහනුවර තුන්බිය තත්ත්වයක් වගේ. තැන තැන මළ කඳන් පිරුණු, දුක වේදනාව කළකිරීම, සංතාපය මහා පරිමාණයෙන් ඉහවහා ගිය අන්ත අසරණ තත්ත්වයකට පත්වූ ස්වරූපයක් අපි දැක්කේ.

නමුත් එය එහෙම වනවිට අප දකිනවා යට කී රටවල ඉතාම පැහැදිලි සාර්ථකත්වයක්. මොකක්ද මේ විශේෂත්වය. කොරෝනා වෛරසයට ඉතා සාර්ථක ව මුහුණ දී මරණ සංඛ්‍යාව ඉතාම අවම ව සිදු වූ සියලුම රටවල් බෞද්ධ රටවල්.

> **බෞද්ධ රටවල තිබුණු සාර්ථකත්වයට බලපෑ ප්‍රධාන කාරණය තමයි මේ විනය ගරුකත්වය. හික්මීම. එය අපට ඉබේ පහළවුණු දෙයක් නොවෙයි. බෞද්ධ හැදියාව මුල්කරගෙන, ශිෂ්ටාචාරය හා සංස්කෘතිය මුල් කරගෙන ජනතාව තුළ පැළපදියම් වූ, ජනතාවට ආවේණිකව පුරුදු පුහුණු වුණු සහ දයාද වුණු විනය ගරුකකමයි.**

මේ බෞද්ධ රටවල තිබුණු සාර්ථකත්වයට බලපෑ ප්‍රධාන කාරණය තමයි මේ විනය ගරුකත්වය. හික්මීම. එය අපට ඉබේ පහළවුණු දෙයක් නොවෙයි. බෞද්ධ හැදියාව මුල්කරගෙන, ශිෂ්ටාචාරය හා සංස්කෘතිය මුල් කරගෙන ජනතාව තුළ පැළපදියම් වූ, ජනතාවට ආවේණිකව පුරුදු පුහුණු වුණු සහ දයාද වුණු විනය ගරුක කමයි. හැදිච්ච කමයි. නමුත් දැන් බලන්න ඇමරිකාව ලොක්ඩවුන් කළ වෙලේ එහි ජනතාව නිදහස ඉල්ලා පාරට බැස්සා. උද්ඝෝෂණ කළා. තවත් පැත්තකින් ඉන්දියාවේ පොලීසි හැසිරෙන විදිහ බලන්න. මිනිසුන් පාලනය කරන්න නීතිය ක්‍රියාත්මක කරන ආකාරය.

මෙහිදී අපට පෙනෙන දෙයක් තිබෙනවා. යම් සමාජයක දියුණුව හෝ පරිහානිය මැනිය හැක්කේ වෙන කුමකින්වත් නොවෙයි. ඒ සමාජය තුළ ක්‍රියාත්මක වන විනය ගරුක තත්ත්වය මතයි.

මෙතැනදී එක උදාහරණයක් අවධි කරන්නම්. චීනයෙන් ඇසෙන මේ කතාව හරි අපූරු දයාදයක්. චීනයේ හිටියා එක්තරා අධිරාජයෙක්. මින් නම් අධිරාජයා කාලයේ ඇසෙන මේ කතාව අපිට කියා දෙන අරුත බලන්න. මින් අධිරාජයේ සමයේ චීනයේ ජීවත්වුණා අපූරු දර්ශනිකයෙක්. ගුරුවරයෙක්, කොන්ෆියුසියස් කියා.

එක්තරා දවසක මින් අධිරාජයා යනවා කොන්ෆියුසියස් තුමා බැහැදකින්නට අධිරාජ්‍යා අහනව කොන්ෆියුසියස්ගෙන් රටක යහපත වෙනුවෙන් අනුගමනය කළයුතු පිළිවෙත් තුනක් කියන්න කියලා.


ඔහු සඳහන් කරනවා පළමුවෙන්ම රජතුමනි ආර්ථිකය ශක්තිමත් ව තබාගන්න. දෙවැන්න ආරක්ෂ ක ක්‍රමවේදය හොඳින් තබාගන්න. තෙවැන්න සදචාරය හා විනයගරුක බව රැක ගන්න කියලා.



14පිටුවට....

වසන්ත ජයසිංහ ආරච්චි

# දේව දූතයන් දැක අකුසලයෙන් මිදෙන්න



අම්බලන්ගොඩ, කහව ගල්දූව
ආරණ්‍ය සේනාසනයේ
කම්මට්ඨානාචාර්ය
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද
**කහගොල්ලේ සෝමවංශ හිමි**

**දේව දූතයෝ තිදෙනෙක් ගැන බුදුන් වහන්සේ පහදා දුන්නා. ඇතැම් කෙනෙක් සිතෙන්, කයෙන්, වචනයෙන් පව් කර, මරණින් මතු නරකාදියට වැටෙනවා. ජීවත්ව සිටියදී පිනක් දහමක් කළේ නැහැ. බුදුන් වැඳීම, මව් පියන්ට සැලකීම කළේ නැහැ. යහපත් ව ජීවත් නොවී මව් පියන්ට, ස්වාමි දියණියට, ස්වාමියාට, දරුවන්ට, කරදර ආදිය කරමින් නොයෙක් පාප කර්ම සිදු කළා. එය කාය, වාග්, මනෝ දුස්චරිත යනුවෙන් සඳහන් කරනවා.**

## නිරයේ විපාකය බරපතළ යි

එලෙස පාප කර්ම කර මරණින් මතු නරකාදියේ උපත ලබනවා. නිරය පාලක යමපල්ලෝ දෑතින් අල්ලාගෙන යම රජ්ජුරුවන්ට හමුවට පමුණුවනවා. ‘දේවයන් වහන්ස , මොහු මවට,පියාට,ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට, වැඩිහිටියන්ට සැලකුවේ නැහැ, පිනක් දහමක් කළේ නැහැ යනුවෙන්. දේවයන් වහන්ස, මොහුට කැමැති දඬුවමක් දෙන්න කියනවා. එවිට යම රජ්ජුරුවෝ මෙලෙස අසනවා. ‘නුඹ දැක තිබෙනවාද, පළමු දේව දූතයා? නැත ස්වාමීනි, “නුඹ මනු ලොව සිටියදී ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් වයස අවුරුදු අසූව , සියය හෝ එයට වැඩි ගණනක් ජරා ජීර්ණ ව, නැඟිට ගන්නට නොහැකිව කෑ ගසනවා, ආතුරයෙක් ව, කෙස් ටික පැසී, දසත් වැටී , ඇඟ රැලි වැටී සිටිනවා නුඹ දුටුවේ නැතිද?” යනුවෙන් විමසනවා.

එහෙමනම් නුඹට සිතුණේ නැතිද මේ තත්ත්වයට තමාත් පත්ව පිනක් දහමක් කළ යුතු බව. එහෙම සිතුණේ නැහැ ස්වාමීනි, නුඹ වචනයෙන්, සිතෙන්, කයෙන් පව් කර ප්‍රමාද විහරණයෙන් වාසය කර, දැන් නුඹ පැමිණ සිටින්නේ එහි විපාක විඳින්න යි.

මව් පියන්ට, සහෝදර සහෝදරියන්ට, මිත්‍රයන්ට, ඥතීන්ට , දෙවියන්ට , ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට සැලකුවේ නැහැ. නුඹ දරුණු පාප කර්ම කර තිබෙනවා යනුවෙන් පැවසුවා. නුඹ දෙවන දේව දූතයා දුටුවාද? නැත ස්වාමීනි. ඇයි? නුඹ මනු ලොව සිටියදී ආබාධ වලින් පෙළී ගිය, ගිලන් ව සිටි, වැසිකිළි කැසිකිළි එක්තැනක කරගෙන නැඟිටගන්න බැරිව කෑ ගසන කෙනෙකු දුටුවේ නැතිද?

දුටුවා ස්වාමීනි. එහෙමනම් ඔබට ඒ මොහොතේවත් සිතුණේ නැතිද, අනේ! මාත් මෙවැනි තත්ත්වයට පත්වෙනවා යනුවෙන්. රෝගීව දුක් විඳින්න සිදු වී කෑ ගසන්න වෙනවා , හොඳ කළ යුතු බව දන්නේ නැති ද?

මගේ ප්‍රමාදයක් ස්වාමීනි, මට කරගන්න බැරි වුණා.

නුඹගේ ප්‍රමාදය නිසා සිතෙන්,කයෙන් , වචනයෙන් හොඳ දේ කළේ නැහැ, එහෙමනම් ඔබට මහා දරුණු විපාක ලැබෙනවා.

## ඉදිමී ගිය මළ සිරුරත් පාඩමක්

‘මනු ලොව සිටියදී නුඹ තුන්වන දේව දූතයා දුටුවේ නැති’ ද?

‘නැත ස්වාමීනි”



‘නුඹ මනු ලොව සිටියදී ඉදිමී, නිල් පැහැ ගැන්වී , සැරව ගලන, පණුවන් ගසා ඇති මෘත සිරුරක් දුටුවේ නැති ද? “දුටුවා ස්වාමී”. එහෙමනම්, ඔබට සිතුණේ නැති ද ඒ තැනැත්තා මෙන් තමා ද මරණයට පත්ව ඉදිමී , කුණුවී , පණුවන් ගසන බව.

සිතුණේ නැහැ. ස්වාමීනි.

එය ද ප්‍රමාදයක් බව පැවසුවා.

නුඹ සිතෙන්, කයෙන්, වචනයෙන් පව් කළා. පිනක් දහමක් නොකර ප්‍රමාදවී පව් කළා. මව් පියන්ට සහෝදර සහෝදරියන්ට ඥතීන්ට සැලකුවේ නැහැ. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට , දෙවියන්ට සැලකුවේ නැහැ. ඔබට දරුණු පාප කර්ම තිබෙනවා. ඒ නිසා දරුණු විපාකයක් විඳිය යුතු යි යනුවෙන් පැවසූ විටම යම පල්ලන් පැමිණ මොහුට පංචවිධ බන්ධනයක් කරනවා. යකඩ උල්වලින් දෑතට, දෙපාවලට, පපුවට විද දරුණු දුක් ලබා දෙනවා. ඇදගෙන ගොස් වැයෙන් රගිනවා. උල තබනවා. ලෝදිය පොවනවා. ලෝහ ගුලි ගිල්වනවා, හිස පහළට, දෙපා ඉහළට තබා වැයෙන් රගිනවා, ගින්නෙන් දිලෙන අඟුරු පර්වත මත විසි කරනු ලබනවා. මේ මත නැංවීම, බැස්සවීම නිරතුරුව ම සිදු කරනු ලබනවා. උතුරන ලෝ දිය මත හිස ඔබ්බවා නැවත දෙපා ද දමයි. මෙලෙස අති භයානක ඝෝර කටුක දුක් දෙනු ලබයි. මෙහි විඳින දුක සීමාවක් නැහැ. සතර කොණේ ඇති දොරටු සතරෙන් පැන යන්නට සූදානම් වුවත් ඒවා නැවත වැසී යනු ලබනවා. මෙලෙස නරකාදියෙහි විඳින දුක සීමාවක් නැහැ.

මෙලෙස පාපයන්ට ගොදුරු වුණේ මනු ලොව සිටියදී පාපයන් සිදු කළ නිස යි. ඒ නිසා මනු ලොව සිටින ඕනෑම කෙනෙක් මවට පියාට, සහෝදර සහෝදරියන්ට, නෑදෑ හිත මිතුරන්ට , වැඩිහිටියන්ට සලකන්නේ නැතිනම්, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට සලකන්නේ නැතිනම්, බුද්ධ, ධම්ම , සංඝ රත්නත්‍රයට සලකන්නේ නැතිනම්, අගෞරව කරනවා නම්, සත්ත්ව ඝාතන ආදී පස් පව් කරනවා නම්, සූදුව, දුරාචාරය කරනවා නම්, කිසි දිනක සැනසුමක් නැහැ. නරකාදියට යා යුතු ම යි. එහිදී නඩු විභාගයෙන් පව් කළ බව ඔප්පු වූයේ නම්, ඒ මොහොතේ පටන් ගිනි ජාලාවක් මධ්‍යයේ දුක් විඳිය යුතු යි. එහි විඳින දුක සීමාවක් නැහැ. කෑ ගසා විලාප නගා පැන යන්න හදනවා. කුමන ලෙසකින්වත් යන්නට බැහැ. කළ පව් දරුණු වැඩි යි. විපාක දරුණු යි. ඒ නිසා පින්වතුනි, පැවිදි, ගිහි, රජෙක් වුව ද, කොයි කවුරු වුව ද කිසිම පාපයක් කරන්නට එපා.

## සියලු සම්පත් ලබන මග පහසු යි - පිරිසුදු යි

මේවා හොඳින් දැන කියාගෙන හොඳින් පන්සිල් රැක , පෝයට අටසිල් ගෙන, පන්සලට යන්න එන්න, හොඳින් බුදුන් වඳින්න, බණ අසන්න, දානමය පින්කම් , භාවනා ආදිය කර ගන්න. මව් පියන්ට වැඩිහිටියන්ට හොඳින් සලකන්න. මෙලෙස පින්දහම් කළොත් මනු ලොව, දෙව් ලොව දෙකෙහි ම අති විශාල සම්පත් ලැබෙනවා. සියලු සම්පත් ලබා ගන්න පුළුවන් වන්නේ සිත , කය , වචනය ආදියෙන් පින් දහම් කළොත් පමණ යි. සිත හොඳනම්, සිත පිරිසුදු නම්, මේ කියන ලද කුසල ධර්මයන් රැස් කළොත්, දාන, ශීල, භාවනා වශයෙන් යමෙකුට මරණින් මතු යහපත් භවයක් ලැබිය හැකි යි. මනු ලොව, දෙව් ලොව උපත ලබන්න පුළුවන්. භාවනා කළොත් බඹ ලොව උපත ලබන්න පුළුවන්.

## සිත, කය , වචනයේ සංවර බව


එසේනම්, දේව දූත සූත්‍රයේ දැක්වෙන පළමු දේව දූතයා, දෙවන දේව දූතයා, තුන්වන දේව දූතයා යනුවෙන් අපමා යි මෙලෙස සඳහන් කරන්නේ. වයසට ගිය කෙනෙක්, ජරාවට පත්වුණ රෝගී වූ අයෙක්, මරණයට පත්ව මෘත සිරුරෙන් ලේ වැගිරෙන, සැරව වැගිරෙන අයෙක්. මේ අවස්ථා තුන ඇසට දකින්න, කනට ඇසෙන්න තියෙනවා. මේ ගැන කල්පනාවෙන් සැවොම පවට ගිජු නොවී , සිතෙන් , කයෙන්, වදනෙන් පව් නොකර යහපත් දේ කරන්න. බුදු, පසේ බුදු , මහ රහතන් වහන්සේ අපට යා යුතු මඟ හොඳින් පහදා දුන්නා. නිවන් මඟ ගොස් සුගතියක වාසයෙන් , අපායට යන දොරටු වසා දමා ගන්න. ඒ සඳහා සිත, කය , වචනය සංවර කරගත යුතු ම යි.

මනු ලොව ඇතැමුන් දුගී දුප්පත් ව ආහාර ඇඳුම් පැළඳුම් නැතිව පෙළෙනවා. අද කාලයේ වැනි දරුණු වසංගත රෝගවලින් පෙළෙනවා. මේ පාපයේ විපාකය යි. මේ ගැන හොඳින් කල්පනා කර සැම දෙනාම පිනට දහමට ගුණයට නැඹුරු වන්න. අපායට බිය වී තම සිත දමනය කර, හැකිතාක් දාන, ශීල, භාවනා, කර දිනපතා ම නළලත බිම තබා හොඳින් බුදුන් නමඳින්න. පිරිසුදුවට සම්බුද්ධ පූජාවන් පවත්වා ගන්න. මේ පිනම අපා දුකෙන් නිදහස් වෙන්නට හේතු වෙයි. කාටත් මෙලෙස සතර අපා දුකෙන් නිදහස් ව නිවන් පසක් කරගන්නට හේතු වාසනා වේවා !

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

සෙන් කතා

# භූතයා එළවීම



මහාචාර්ය
**ඉත්තදෙමළියේ ඉන්දසර නා හිමි**

**එක්තරා පුද්ගලයෙකුගේ බිරිඳ බරපතළ රෝගී තත්ත්වයකට පත්වූවා ය. ඇය මරණ මංචකයේ දී තම ස්වාමිපුරුෂයා අමතමින් "මම ඔබට හුඟාක් ආදරෙයි. මට ඔබ අතහැර යන්න බැහැ, මම කැමති නැහැ ඔබව අවිශ්වාස කරන්න, මට පොරොන්දු වෙන්න මම මියගිය පසු වෙනත් ගැහැනියක් ආශ්‍රය නොකරන බවට, හැබැයි ආශ්‍රය කළොත් මම ඔබ ළඟ හොල්මන් කරනව" යනුවෙන් පවසා ඇය මිය පරලොව ගියා ය.**

ඇයගේ මරණයෙන් පසු මාස හත අටක් පමණ ගතවනතුරුම මරණයට පත්වීමට පෙර ඇය කියූ දේ ඔහුගේ මනසේ රැව් පිළිරැව් දෙමින් පැවතිණි. එම නිසා ඔහු කාන්තාවක් දෙස නිකමටවත් බැලුවේ නැත. නමුත් පසුව ඔහු කෙරෙහි ඇල්ම හෙලූ කාන්තාවක් සමඟ ආදරයෙන් බැඳුණි. කලකට පසුව විවාහවීමට තීරණය කර, ඔහු ඇය තම නීත්‍යනුකූල බිරිඳ කර ගත්තේ ය. විවාහ වූ දින රාත්‍රියේ පෙර බිරිඳ භූතයෙකු සේ ඔහු වෙත පැමිණියා ය. පොරොන්දු කඩ කිරීම පිළිබඳව ඇය ඔහුට දෙස් පැවරුවා ය. සෑම දිනක ම රාත්‍රී ඇය ඔහු වෙත පැමිණ ගර්හා කළා ය.

බිරිඳ මරණයට පත්වන දිනයේ ඔහු සමඟ කතා බහ කළ සියලු දේ වචනයෙන් වචනය ඔහුට සිහිපත් කළා ය. එදා ඇය ඇඳෙහි වැතිර සිටි ආකාරය, අමාරුවෙන් වචන ගැලපූ ආකාරය, තමන් ඇය දෙස බලා සිටි ආකාරය ඇතුළු සියල්ල භූතයා ඔහුට පෙන්වීය. එදා ඒ සිදුවීම් සියල්ල ඇහෙන දකින ඔහුට රාත්‍රියට නින්දක් නම් අහලකටවත් එන්නේ නැත. භූතයාගෙන් ඇතිවන සිතේ අවුල ඔහු නින්දෙන් ඈත් කර දැමුවාය.

අලුත් විවාහ ජීවිතයේ බලාපොරොත්තු සුන් වූ ඔහු මේ සඳහා තම ගම සමීපයෙහි ජීවත් වූ සෙන් ගුරුතුමාගෙන් උපදෙසක් ලබා ගැනීමට අදහස් කෙළේ ය. ඒ අනුව ඔහු සෙන් ගුරුතුමා මුණ ගැසීමට ආශ්‍රමයට ගොස් සියලු කරුණු කාරණා මුල සිට අගට පැහැදිලි කළේ ය.

ඉතා සාවධානයෙන් සියල්ල අසා සිටි සෙන් ගුරුතුමා මේ ඉතා දක්ෂ බලගතු භූතයෙකැයි කීවේ ය.

"හා, එහෙමද?"

විශ්මයාර්ථයෙන් කියූ ඔහු ඇය මා කියූ සහ කළ සියලු දේ සහ වූ පොරොන්දු ආදිය ද මා කරන දේවල් පිළිබඳව ද හොඳටම දන්නවා යැයි කී ය.

සෙන් ගුරුතුමා මඳක් සිනා සී "එපමණ දක්ෂ භූතයෙක් දැකීම ගැන ඔබ ආඩම්බර විය යුතුයි, කෙසේ වුවත් ඊළඟ දවසේ භූතයා පැමිණි විට කුමක් කළ යුතුදැයි මම ඔබට කියා දෙන්නම්".

පසුදින රාත්‍රියේ ද භූතයා පැමිණියේ ය. ගුරුතුමා උපදෙස් ලබා දුන් ආකාරයට "උඹ හුඟාක් බුද්ධිමත් භූතයෙක්, උඹ දන්නව මම කරන හැම දෙයක්ම, උඹෙන් මට සඟවන්න බැහැ. උඹට පුළුවන් නම් මම අහන ප්‍රශ්නයට පිළිතුරු දීපන්, මම මේ සම්බන්ධය නතර කරල මගේ ජීවිතේ ඉතිරි කාලය තනිවම ජීවත් වෙනව".

"උඹේ ප්‍රශ්නය අහපන්" භූතයා පිළිතුරු දුණි.

ඔහු බිම තිබූ ගෝනියෙන් මෑ ඇට මිටක් අතට ගත්තේ ය. "මගේ අතේ හරියටම මෑ ඇට කීයක් තියෙනව ද?" ඔහු විමසී ය.

පිළිතුරක් නැත. භූතයා නොපෙනී ගියේ ය. ඉන්පසු කිසි දිනෙක භූතයා පැමිණියේ නැත.

මෙයින් අපට ලබා ගත හැකි ආදර්ශය වන්නේ භූත, අවතාර, හොල්මන් යනු මිනිසාගේ මනස තුළ මිනිසා විසින්ම ඇති කර ගනු ලබන්නා වූ භ්‍රාන්තියක් පමණක් බවයි.





# හෙළ ජාතික අභිමානය

**ශ්‍රී ලංකා ධරණීතලය අපේ නිජබිමයි. ඉතිහාසයේ සිටම මේ රට බොහෝ ආක්‍රමණයන්ට ගොදුරු වුණා. රට, ජාතිය, ආගම රැක ගන්නට අපේ මුතුන් මිත්තන් බොහෝ කැප කිරීම් කළා. ජීවිත පරිත්‍යාග කළා. එසේ ආරක්ෂා කර දුන් අපේ රට, අපේකම රැක ගැනීමේ වගකීම පැවරෙන්නේ අපටයි. එය පුංචි දරුවාගේ සිට වැඩිහිටියා දක්වාම පැවරෙන යුතුකමක්. වගකීමක්. කවර හේතුවක් නිසාවත් ඒ යුතුකම්, වගකීම්වලින් මඟ හැර සිටින්නට පුළුවන් කමක් නෑ.**

අතීතයේ අපේ මාතෘ භූමියට හිමිව තිබුණ තැන මොන වගේ ද? දැන් හිමි වී තිබෙන තැන මොන වගේ ද? මේ පින්වත් දරුවන් ඉන්නේ මොනවගේ තැනක ද? මෙතැනින් ඉදිරියට අප විසින් සිදු කළ යුත්තේ මොනවා ද? මේ ගැන හොඳින් දැනුම්වත් වෙන්නට ඕනෑ.

ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියන්නේ අපේ මේ පුංචි රටට කියලා අප හැමෝම දන්නවා. ඉන්දියන් සාගරයේ පමණක් නොවෙයි. සප්ත මහා සාගරයේ ම, මේ මුළු මහත් ලෝකයේ ම තිබෙන වටිනා ම රට මේ ලංකා ධරණීතලයයි.

දරුවනේ, වෙළඳ ව්‍යාපාර සඳහා මධ්‍යස්ථානයක් ලෙස මුළු ලෝකයට ම භාවිත කළ හැකි සුදුසු ම ස්ථානය පිහිටා තිබෙන්නේ අපේ රටේ යි. මුහුදු ගමන් මාර්ගවල දී නැව්වලට ඉන්ධන ලබා ගැනීමට, නාවිකයන්ට ගිමන් නිවා ගන්නට පුළුවන් සේද මාවතේ ඉතා ම වැදගත් සන්ධිස්ථානයක තමයි අපේ රට පිහිටා තිබෙන්නේ.

දරුවනේ, හෙළයින්ට තිබෙන්නේ ඉතා දිගු ප්‍රෞඪ ඉතිහාසයක්. ඉතිහාසයේ මේ රට අල්ලා ගන්නට, යටත් කර ගන්නට මොන තරම් ආක්‍රමණ සිදු වුණත්, යුද ගැටුම් ඇති වුණත් අපේ මුතුන් මිත්තන් මේ රට දිවි හිමියෙන් ආරක්ෂා කර ගත්තා. ඒ වගේ ම රට සශ්‍රීක කළා. ඒ හැම දේටම ඔවුන්ට ශක්තියක් වුණේ සම්බුදු දහමයි. සම්බුදු දහමේ ආභාෂයත් සමඟ හෙළ දීපය මහා ශක්ති සම්පන්න වුණා. ලෝකයටම පරමාදර්ශය සපයන රටක් බවට පත්වුණා.

ගෞතම බුදුරජාණන් වහන්සේ පමණක් නොවෙයි මේ මහා භද්‍ර කල්පයේ පහළ වූ කකුසඳ, කෝනාගමන, කාශ්‍යප, සතර බුදුවරයන් වහන්සේම ලක් දෙරණට වැඩම කළා.

දරුවනේ, අපේ මුතුන් මිත්තන් තුළ අසමගිකම් තිබුණේ නෑ. භේද භින්න වුණේ නෑ. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, විචිකිච්ඡාව වගේ හැඟීම්වලින් සිත් අපිරිසුදු කර ගත්තේ නෑ. ධාර්මිකයි. සාමකාමියි.

ඒ වගේම අපේ ශ්‍රේෂ්ඨ රජවරු දසරාජ ධර්මයට අනුව රට පාලනය කළා. සම්බුදු දහම පණ වගේ ආරක්ෂා කළා. දානයෙන්, ප්‍රිය වචනයෙන්, සමානාත්මතාවෙන්, අර්ථ චර්යාවෙන් ජනතාවට සංග්‍රහ කළා. අපේ දුටුගැමුණු මහ රජතුමා, එළාර රජු පරාජයට පත් කළ පසු ඔහු වෙනුවෙන් සෑයක් ඉදි කළා. ඒ දෙමළ ජනතාවට ගරු බුහුමන් කිරීම උදෙසායි. රජතුමා පවා ඒ අසලින් ගිය මොහොතක ඊට ගරු කරලයි පිටව ගියේ. එතරම් සමානාත්මතාවයක් තිබුණා. ඉතින් රට වැසියන් තුළ රජවරු කෙරෙහි ලොකු විශ්වාසයක් තිබුණා.

ඒ වගේම අපේ මාතෘ භූමියට හොඳ ආර්ථික වැඩ පිළිවෙළක් තිබුණා. රට සහලින් ස්වයංපෝෂිත වුණා. ගස්වැල් එළ බර වුණා. නෑ කියන්න දෙයක් තිබුණේ නෑ. හැම ගෙවත්තක ම වගා කළා. ලුණු කැටය පිටරටින් ගෙන එනතුරු බලා සිටියේ නෑ. අපේ මුතුන් මිත්තන් අපේ දෙය අගය කළා. අපේකම රැක ගන්නට වෙහෙස වී වැඩ කළා. පිටරට සිරිතට ගැති වුණේ නෑ.

ඒ වගේ ම අපට විශිෂ්ට තාක්ෂණයක් තිබුණා. මීට වසර හතළිස් දහසකට එහා අපේ රටේ ඉතා දියුණු දුනු, ඊතල භාවිත කළ බවට පසුගියද පාහියන්ගල දී සොයා ගත්තා. රාවණා රජුගේ ඉතිහාසයට ගියත්, දඬු මොනර යන්ත්‍රය නිෂ්පාදනය කරන්නට තරම් දියුණු තාක්ෂණයක් තිබුණා. අදටත් විදේශිකයන් පවා මවිත කරන දියුණු තාක්ෂණයෙන් යුතු වෙහෙර විහාර, හෙළ කලා ශිල්ප, වාරි තාක්ෂණය අපට ඉතිහාසයෙන් උරුම ව තිබෙනවා.

දරුවන් අසා තිබෙනවාද? ඇඹිලිපිටිය ප්‍රදේශයේ පිහිටා තිබෙන අටකලන්පන්න ගම ගැන. ඒ ගමට නම හැදුණේ ඒ කාලයේ ආරක්ෂාවට ආයුධ අටක් සෑදූ නිසයි. අටකලන්පන්න ගමට ආසන්න ව විශාල ගල් කුහරයක් පිහිටා තිබෙනවා. ස්වභාවික ව හමා එන සුළඟින් යකඩ රත් කිරීමට, යකඩ උණු කිරීමට ගිනි දල්වා ගැනීමට එහි දියුණු තාක්ෂණික ක්‍රමවේද භාවිත කළ බවට අදටත් සාධක තිබෙනවා.

බෝසත් දරුවන්ට

ඒ වගේ ම අපට හොඳ හෙළ වෙදකමක් තිබුණා. අද තිබෙන්නේ ඒ හෙළ වෙදකම නොවෙයි. ආයුර්වේද වෙදකම. එය උතුරු ඉන්දියාවෙන් ආ ක්‍රමවේදයක්. ඊළඟට තිබෙනවා සිද්ධායුර්වේද කියලා දකුණු ඉන්දියාවෙන් ආ ක්‍රමවේදයක්. අපේ වෙදකම කියන්නේ හෙළ වෙදකමයි. දරුවනේ, ඌව, වෙල්ලස්ස කැරැල්ල කාලයේ දී හෙළ වෙදකම දන්නා වෛද්‍යවරු හැම දෙනාම වාගේ මියගියා. හෙළ වෙදකම ඉගෙන ගත්තේ භාවනා කරලා. ඒ භාවනාවලින් ලැබෙන සංඥා උපයෝගී කරගෙනයි. අපේ ඒ මුතුන් මිත්තන් තමන් උගත් හෙළ වෙදකම ගැන පුස්කොළ පොත්වල ලියා තැබුවා. සුදු අධිරාජ්‍යවාදීන් ලංකාවෙන් යන විට ලංකාවේ තිබූ වටිනා දේ නැව් මගින් බ්‍රිතාන්‍යයට ගෙන ගියා. එසේ ගෙන ගිය නැවක තිබූ පුස්කොළ පොත්වල නාමාවලියක් හමු වී තිබෙනවා. එහි වෙළුම් දෙළහක් අන්තර්ගතයි. සාමාන්‍යයෙන් කෙනෙකුට ඔසවන්නට පවා අපහසුයි. දරුවනේ, නාමාවලිය පමණක් එවැනි තත්ත්වයක නම් අපට අහිමි වුණු වටිනා පුස්කොළ පොත් ප්‍රමාණය මොන තරම් වන්නට ඇති ද? ඉතින් අපේ හෙළ වෙදවරු මිය ගියා. ඔවුන් ලියා තිබූ පොත් අපට අහිමි වුණා. ඒ පොත්වලින් ඉගෙන ගන්නට සිටිය පරම්පරාවේ අයට ඉගෙන ගන්න නොහැකි වුණා.

පසුගිය දිනවල කොරෝනා වයිරසය හමුවේ අප මොනවද භාවිත කළේ. ආයුර්වේද ක්‍රම නොවේ. බටහිර වෛද්‍ය ක්‍රමවේදයන් නොවේ. හෙළ වෙදකමයි. අප කොත්තමල්ලි වතුර පානය කළා. නිවෙස්වල කොහොඹ අතු එල්ලුවා. කහ දියර ඉසිමින් විෂබීජහරණය කළා. මේ ක්‍රමවේද අතීතයේ සිටම අපේ මුතුන් මිත්තන් භාවිත කළා. කොරෝනා වගේ වයිරසයන්ට පමණක් නොවෙයි. වෙනත් බරපතළ තත්ත්වයන්ට පවා මුහුණ දෙන්නට හැකි වෛද්‍ය ක්‍රම තිබුණා.



මහනුවර හන්තාන සිරි ධම්මරතන ත්‍රිපිටක ධර්මායතනාධිපති රාජකීය පණ්ඩිත
**පූලියද්දේ සුධම්ම හිමි**

පුංචි ඔබ අනාගතයේ වැඩිහිටියන් බවට පත්වෙනවා. අපට උරුම, අපේ දේ සොයා ගොස්, අධ්‍යයනය කොට ඒවා රැක ගන්නට උත්සාහ කළොත් ඔබත් රටට ණය නොවන පුරවැසියෙක් බවට පත්වෙනවා.

කලින් කලට අපේ රට ආක්‍රමණය කළ පිරිස් අපගේ ප්‍රෞඪ ඉතිහාසය මකා දමන්නට උත්සාහ කළා. අපේ පොත් පත් අපට අහිමි කළා. ඒවායේ තිබූ දේ ඉගෙන ගැනීම අහිමි කළා. අලුතින් පොත පත ලියවුණා. ඒවාට විෂය නිර්දේශය ඇතුළත් කළා. අධ්‍යාපන ක්‍රමය කියලා.

දරුවනේ, හෙළයන්ට අධ්‍යාපන ක්‍රමයක් තිබුණේ නෑ.

'කුසල්' කියන වචනයට මුලින් 'අ' යොදන්න. අකුසල් වෙනවා.'

'පිරිසුදු' කියන වචනයට මුලින් 'අ' යොදන්න. 'අපිරිසුදු' වෙනවා.

'ධ්‍යාන' කියන වචනයට මුලින් 'අ' යොදන්න. අධ්‍යාන වෙනවා. මෙයයි අපේ 'අධ්‍යාපන' ක්‍රමය. දරුවනේ හෙළයන්ට තිබුණේ ධ්‍යාන වැඩීමෙන් ඉගෙන ගන්නා ක්‍රමවේදයක්. භාවනා කර, මානසික ශක්තියක් ඇති කරගෙන, ගුරුවරයා ඉදිරියේ හොඳින් දහරමණ්ඩිය ගොතාගෙන භාවනානුයෝගී ව ඉගෙන ගන්න ක්‍රමවේදයක්. ඒ තුළ ශිල්පය හොඳින් ධාරණය වුණා. මතක සිටියා. අද වගේ සටහන් ලීවේ නෑ. පරිගණකවලට අන්තර්ගත කළේ නෑ.

මානසික ශක්තීන් සමඟ, ධ්‍යාන වැඩීමෙනුයි ඉගෙනුම ලැබුවේ. ත්‍රිපිටකය කියන්නේ අසූහාර දහසක් වූ ශ්‍රී සද්ධර්මය වන අතර, මේ ධර්මස්කන්ධයම කට පාඩමින් අරගෙන ආවේ.

අතීතයේ අපේ ඉගෙනීම් ක්‍රියාවලිය තිබුණේ පන්සලත් සමඟ. පාසල තිබුණේ පන්සලේ. දහම් පාසල තිබුණේ පන්සලේ. ගමේ සමිති සමාගම් තිබුණේ පන්සලේ. මෙරට ආක්‍රමණය කළ පිරිස් ඒ සියල්ල විනාශ කළා. ඔවුන් ගම, පන්සලෙන් දුරස් කළා. ඇයි? අපේ මිනිසුන්ට හිතන්නට පුරුදු කළේ පන්සලෙන් නිසා. එය නැති කළ විට අධිරාජ්‍යවාදීන්ට ඔවුන්ගේ අදහස් උදහස්වලින් අපේ හිස පුරවන්නට පහසු වුණා.

ඉස්සර හැම දරුවෙකුටම අරමුණක් තිබුණා. අනාගතයේ මම මේ වගේ කෙනෙක් වෙනවා කියලා. ඒත් අද සාමාන්‍යපෙළ, උසස් පෙළ කරන කාලය වන විට දරුවන්ට අරමුණක් නෑ. කවුරු වේවිද කියලා. ඇයි? අධ්‍යාපන ක්‍රමවේදයේ හැටි. කිසිදු අරමුණකට යන්න දෙන්නේ නෑ.


පැරණියේ අපේ පුංචි දරුවො නින්දට ගියේ කිරි අම්මා කිරි අත්තා ළඟයි. (ආච්චි – සීයා) ඉතින් මුනුබුරු මිනිබිරියන්ට නින්ද යන තුරු මේ දෙන්නා කතාන්දර කියා දුන්නා. ඒ කතාවල සිටියේ දුටුගැමුණු මහ රජතුමා, මහා පරාක්‍රමබාහු රජතුමා, මහසෙන් රජතුමා ආදී වීරවරු. ඉතින් දරුවන් නින්දට ගියේ ප්‍රෞඪ ඉතිහාසයක් තුළ සිතින් සැරිසරමින්. උදයට නැගිට්ටේ මම දුටුගැමුණු වගේ රජ කෙනෙක් වෙමි, අනගාරික ධර්මපාලතුමා වගේ කෙනෙක් වෙමි වැනි අරමුණුවලින් හිස පුරවාගෙනයි.

ඒත් අද දරුවන්ගේ සිත්තුළ ඉන්නේ ස්පයිඩර් මෑන්ලා, සුපර් මෑන්ලා. වැනි කාඩ්බෝඩ් වීරවරු. මේ තමයි අධ්‍යාපන ක්‍රමවේදයේ ප්‍රතිඵල. සිතලා වැඩ කරන්නට පුළුවන් කිසිම කෙනෙක් මේ අධ්‍යාපන රටාව තුළ අපට ලැබෙන්නේ නෑ. මේ තත්ත්වය වෙනස් කිරීමට නම් ධ්‍යාන වඩා ඉගෙන ගන්නා ක්‍රමවේදයක් හදගත යුතු වෙනවා.

ඒ සඳහා අවශ්‍ය ශක්තිය, සාධක අපට ඕනෑ තරම් තිබෙනවා. අපි අපේ ඉතිහාසය සොයා යමු. ඉතිහාසයෙන් ඉගෙන ගනිමු. අපේ රට, අපේ දැය, සම්බුදු දහම සුරකින දරු පිරිසක් වන්නට අධිෂ්ඨාන කර ගනිමු. අප ඉදිරි බුදුසරණ කලාපයන් තුළින් ඒ ගමන් මග ගැන කතා කරනවා.

රමණී සුබසිංහ

# පින් බලාපොරොත්තු වන්නෝ



**රේරුකානේ චන්දවිමල නා හිමි**

**හැකි තාක් පව්කම්වලින් වැළකී පින්දහම් කළා වූ සත්පුරුෂයෝ ද සමහර විට මරණාසන්නයේ දී මෙලොව ඇති දේවලට ආශාව ඇතිවීම නිසා පරදත්තූප ජීවික ප්‍රේත ව උපදිති. ඒ පරදත්තූප ජීවික ප්‍රේතයෝ සා පිපාසා සන්සිඳුවා ගත හැකි පමණට බත් පැන් නො ලබන්නෝ ය. විළි වසා ගැනීමට වස්ත්‍ර නැත්තෝ ය. වාසය කිරීමට ගෙවල් නැත්තෝ ය. ඔවුහු ඉතා දුක්ඛිතයෝ ය. ඒවා ලබා ගැනීම සඳහා ඔවුන්ට කළ හැකි දෙයක් ද නැත්තේ ය.**

ඔවුනට ඒවා ලබා ගැනීමට ඇත්තා වූ එක ම ක්‍රමය තමන්ගේ ඥාති

මිත්‍රාදීන් දෙන පින් අනුමෝදන් වීම ය. එබැවින් ඔවුහු පින් ගැනීමට ස්වකීය ඥාතීන් වෙත පැමිණෙති. සමහර විට පෙර ජාතිවල නෑ වූ ප්‍රේතයෝ ද පින් ගැනීමට එති. බිම්සර රජතුමාගේ පෙර ජාතියක දී නෑයන් වූ දහස් ගණනක් ප්‍රේතයෝ බුද්ධාන්තරයක් මුළුල්ලෙහි බලාපොරොත්තුව සිට එතුමා වෙත පින් ගැනීමට පැමිණියෝ ය.

ප්‍රේතත්වයට පැමිණ සිටින තමාගේ ඥාතීන්ට සංග්‍රහ කිරීමට ආහාර පානාදිය ලබාදීමට ජීවතුන්ට ඇත්තා වූ එකම ක්‍රමයත් ඔවුන් උදෙසා පින් කොට ඒ පින් ඔවුනට අනුමෝදන් කරවීම ය. එබැවින් බෞද්ධයෝ පෙර පටන් ම මියගිය ඥාතීන් උදෙසා පින් කොට ඔවුනට පින් අනුමෝදන් කරවති.

ජීවත්ව වෙසෙන කල්හි තමාට හිතවත් ව සිටියා වූ ඥාතීන් හා මිත්‍රයන් මළ කල්හි අමතක කොට නො හැර ඔවුනට කළ හැක්කා වූ උපකාරයක් කිරීම මනුෂ්‍ය ධර්මයකි. මිය ගිය හිතවතුන් අමතක කිරීම, ඔවුන් ගැන නො සලකා සිටීම අසත් පුරුෂ කමෙකි. එබැවින් මිය ගිය මාපියා දී ඥාතීන් උදෙසා පින් කොට සැම දෙනා විසින් ම පින් දීම කළ යුතු ය. මිය යන සැම දෙනා ම ඥාතීන්ගෙන් පින් ගැනීමට බලාපොරොත්තු නො වෙති. බලාපොරොත්තු වන්නෝ ප්‍රේත වූවන් පමණකි. එහෙත් මිය ගිය තැනැත්තා උපන් තැන දත නොහෙන බැවින් මිය යන සැම දෙනා ම උදෙසා පින් කොට බෞද්ධයෝ පින් දෙති. කවරකු උදෙසා පින් කළත් පින් අනුමෝදන් කරවන අයට එය ලැබුණත් නො ලැබුණත් කළ තැනැත්තාට එහි විපාකය ලැබෙන බැවින් මිය ගිය කවරෙකු උදෙසා පිනක් කළත් විපාකය ලැබෙන බැවින් මිය ගිය කවරෙකු උදෙසා පිනක් කළත් එය නිෂ්ඵල ක්‍රියාවක් නො වේ. එසේ කිරීමෙන් තමාගේ යුතුකම ඉටු කළා ද වන්නේ ය. පින් අනුමෝදන් වන පරදත්තූප ජීවික ප්‍රේතයන්ට එහි ඵලය එකෙණෙහි ම ලැබෙන්නේ ය.

එහෙත් එක් දෙයක්. දන් දීමෙන් ලැබෙන පිනෙන් ප්‍රේතයන්ට සැම දෙය ම ලැබෙන්නේ නොවේ. එබැවින් ඔවුනට ආහාර ලැබීම සඳහා කොට්ට, මෙට්ට, ඇඳ, පුටු, ඇතිරිලි ආදිය ද දන් දී පින් දිය යුතු ය. බිම්සර රජතුමා ආහාර පානයන් දන් දී දුන් පින අනුමෝදන් වීමෙන් ඥාති ප්‍රේතයෝ බත් පැන් ලැබූහ. එහෙත් හැඳීමට වස්ත්‍ර නො ලැබුවෝ ය. වස්ත්‍ර නො ලැබූ ඔවුහු එදින රාත්‍රියේ නැවතත් නග්න ව රජතුමාට පෙනී සිටියෝ ය. පසු දින රජතුමා වස්ත්‍ර දන් දී ඔවුනට පින්දිණ. එයින් ඔවුහු වස්ත්‍ර ලැබූහ. බෞද්ධයන් මළවුන් උදෙසා දන් දෙන කල්හි එක් වරකට වුවමනා නො කරන තරමට බොහෝ ව්‍යංජනවලින් හා නෙයෙක් කැවිලි, පෙවිලි, පලතුරු ආදියෙන් යුක්ත කොට වස්ත්‍ර සහිත ව පිඟන්, කෝප්ප, පැදුරු, කොට්ට සහිතව දන් දීමට පුරුදු වී තිබෙන්නේ ප්‍රේතයන්ට සියල්ල ම ලබා දීම සඳහා ය.

බෞද්ධයාගේ අත්පොතෙනි

# වෙහෙරගල අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමය

පුරාණ ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප



**ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රබල ලෙස මහායාන බුදුසමයේ බලපෑම ඇති වූයේ ක්‍රිස්තු වර්ෂයෙන් අටවන සහ දහවන සියවස් අතර කාලයේ දී ය. ශ්‍රී ලංකාවේ අතිවිශාල හා මහා පරිමාණ බෝධිසත්ව ප්‍රතිමා අයත් වන්නේ මේ කාලයට ය. දඹේගොඩ හා වැලිගම අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමා ඒවාට අයත් පිළිම ගෙවල් තුළ පිහිටුවා තිබුණි. මීට ඉහතදී අපි මෙම ප්‍රතිමා දෙක පිළිබඳ විමසා බැලුවෙමු.**

වෙහෙරගල අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමය අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ය. මේ පිළිබඳ මහාචාර්ය ලීලානන්ද ප්‍රේමතිලක මහතා මෙසේ සඳහන් කරයි. මෙම හිඳි පිළිමය ලෝකඩ වලින් නිර්මාණය කර, රන් ආලේපිත කර තිබේ. මෙහි උස සෙන්ටිමීටර් 49.8 කි. ශ්‍රී ලාංකික කලාව තුළ බෝධිසත්ව ප්‍රතිමාවල හිඳි ඉරියව්වේ ප්‍රචලිත ක්‍රමය බවට පත්වී ඇත. මෙම බෝධි සත්වයන් වහන්සේ හිඳ සිටින මහානුභාව සම්පන්න ඉරියව්ව වූ මහාරාජ ලීලාසන සහ සරල ලාලිතාසනය ඔසවා ගෙන සිටින දකුණු අතෙහි කටක හස්ත මුද්‍රාව නිරූපණය කර තිබේ. ඇතැම් විටෙක එහි රතු නෙළුමක්ද තිබෙන්නට ඇත. එය අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේගේ ආධ්‍යාත්මික උදව සංකේතවත් කරන අංගය යි. මෙම ප්‍රතිමාව සරසා තිබෙන්නේ මුනිවරයකුගේ සරල වස්ත්‍රාභරණයෙනි. මේ බෝධිසත්වයන් වහන්සේ පැළඳ සිටින්නේ ජටාමකුටයකි. එහි මුදුණේ ඇතැම් කොටස් එම ප්‍රතමාවේ උරහිස තෙක් වැටී තිබේ.

*(ශ්‍රී ලංකාවේ ලෝකඩ මූර්ති කලා උරුමය – ප්‍රධාන සංස්කාරක මහාචාර්ය ලීලානන්ද ප්‍රේමතිලක පි. 31- කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි 1995)*

මෙම බෝධිසත්ව පිළිමය නිරූපණය කර ඇති අන්දමට දකුණු පාදය ආසනය මතද වම් පය පහතට හෙළා සිටින ලෙසින් නිර්මාණය කර තිබේ. වම අත වම් පයේ කලවයට පිටුපසින් සිටින සේ ආසනය මත තබාගෙන ඇත. මෙම ප්‍රතිමාවට අයත් ඇඳුම ඉතා කෙටි එකකි. එම ඇඳුම ඉදිරිපසින් පහළ ආසනය මත වැටී එල්ලා වැටෙන ලෙසින් නිර්මාණය කර ඇත. අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිම රැසකම අමිතාභ බුදුරජාණන් වහන්සේගේ සමාධි පිළිමයක් නිර්මාණය කර තිබේ. මේ බව ඉතා පැහැදිලි ලෙසින් දඹේගොඩ අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමයෙහි දක්නට ලැබේ. මෙම ලෝකඩ ප්‍රතිමාවෙහි ජටා මකුටයේ ඇති හිඩසෙහි ද එවැනි රුවක් මැණික් ගලෙන් නිමවා තිබෙන්නට ඇතැයි සැලකේ. මෙම ප්‍රතිමාවෙහි උඩුකය ආවරණය කර ඇති සළුව උත්තර සාටකය ලෙස මූර්ති ශිල්පීහු හඳුන්වති. දූත් වළලු පැළැඳ ඇති සේ නෙලා ඇති මෙම පිළිමය මදක් දකුණට නැමී සිටින සේ නිර්මාණය කර ඇත. එසේ නැවී සිටින ආකාරය අනුව උඩුකයෙහි ශරීරයේ රැළි ද ඉතාමත් ස්වභාවික ලෙසින් නිර්මාණය කර ඇත. මෙම බෝසත් පිළිමය වෙහෙරගලින් හමුවූ නිසා වෙහෙරගල අවලෝකිතේශ්වර බෝධි සත්ව පිළිමය ලෙසින් හැඳින්වේ. අනුරාධපුරයේ සිට ත්‍රිකුණාමලය දෙසට ඇති මහා මාර්ගයෙහි හැට දෙවැනි සැතපුම් කණුව අසලින් දකුණට හැරී මද දුරක් ගිය විට මෙම පිළිමය සහ තවත් ලෝකඩ බුදුපිළිම සහ තවත් පිළිම රැසක් හමුවී ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 1968 වර්ෂයේදී පිළිම ගෙයක් සෑදීම සඳහා අත්තිවාරමක් කපද්දී මෙම පිළිමය සහ තවත් බොහෝ ලෝකඩ නිර්මාණ රැසක් හමුවිය. ඒවා අතර හිඳි බුදුපිළිම, හිටිපිළිම රූකම් සහිත පා දෙකක්, සිරස් පතක්ද හමුවිය. මේ සියල්ලම ලෝකඩ වාත්තු ක්‍රමය යටතේ නිර්මාණය කර රන් ආලේප කර ඇත.

*(හෙළ කලා විස්කම් – සිරිසමන් විජේතුංග පි. 91-93 -2010)*

අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේ පිළිබඳ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමියෝ බුදුවරු සහ බෝසත්වරු නම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් කරති.

“අවලෝකිතේශ්වර බෝසතුන් හට බොහෝ උපමා රූපක ඇත. එයින් වඩාත් ප්‍රචලිත වන්නේ උන්වහන්සේ සංස්කෘත භාෂාවෙන් හඳුන්වා ඇති පද්මපානි (නෙළුම් මලක් උසුලන්නා) යන ලෝකේශ්වර (ලෝකයේ ශ්‍රේෂ්ඨයා) යන පද දෙකය. ගිණිකොන දිග ආසියාවේ වැඩිපුරම උන්වහන්සේ හඳුන්වන්නේ මේ නම් වලිනි. ප්‍රතිමා නිර්මාණ ශිල්පයේ දී උන්වහන්සේගේ මුද්‍රා ගැනීම් හා සම්බන්ධ සුවශේෂ ක්‍රියාකාරකම් මූර්තිමත් කිරීම සඳහා විවිධ ක්‍රමවේදයන් යොදා ගෙන ඇත. සාමාන්‍යයෙන් එකඟත්වයකට පැමිණ ඇත්තේ මෙම අවලෝකිතේශ්වර පූජා විධිය ආරම්භ වූයේ ඉන්දියාවේ වයඹ දිග දේශ සීමාවලින් බව ය. අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ සම්භාව්‍ය ගැන සෙවීමට බොහෝ විද්වතුන් පරිශ්‍රමයක් දරා ඇත. එහිදී විද්වතුන් වැඩි දෙනෙක් කල්පනා කරනු ලබන්නේ මහායාන දේව සමූහයා කිසියම් ආකාරයකින් හින්දු දේව විශ්වාස තාන්ත්‍රික ඉගැනවීම් ආදියෙහි බලපෑම් ද උපයෝගි කරගෙන සකස්වන්නට ඇති බවයි.

*බුදුවරු සහ බෝසත්වරු සාහිත්‍යමය සහ ප්‍රතිමා විද්‍යාත්මක විවරණයක්) මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නා හිමි 2015)*

පුරාණ ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප අතරේ ලෝකඩ වාස්තු ශිල්පය අපේ පැරැණි මූර්ති ශිල්පීන් කොතරම් දක්ෂ අන්දමින් යොදාගෙන තිබේද යන්න පිළිබඳ ලොව ඉතා ප්‍රකට භාවයට පත්වූ ප්‍රතිමාවක් ලෙසින් මෙය සැලකේ.



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ

## මෙවර වස් විසීම අගෝස්තු 04 වැනිදා

2020 අගෝස්තු මස තුන්වැනි (03) සඳු දින යෙදී තිබෙන නිකිණි පුර පසළොස්වක පොහෝ දින මහා සංඝයා වහන්සේ පොහොය කොට අගෝස්තු මස හතරවැනි (04) කුජ දින පෙරවස් විසීම සැප්තැම්බර් මස පළමු කුජ දිනට යෙදෙන බිනර පුර පසළොස්වක පොහෝ දින පොහොය කොට සැප්තැම්බර් දෙවැනි (02) බුධ දින පසුවස් එළඹීම. ඔක්තෝබර් මස තිස් එක්වැනි ( 31 ) ශනි දිනට යෙදී ඇති අධි වප් පොහෝ දිනයෙහි පොහොය කොට එදින ම පෙරවස් පවාරණය. නොවැම්බර් මස විසිනව වැනි (29) රිවි දින (ඉරිදා) වප් පුර පසළොස්වක පොහොය දින පොහොය කොට එදින ම පසුවස් පවාරණය සිදු කිරීමට නියමිතය.

## පර පණ නොනසමු



පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන පාඨයේ තේරුම වන්නේ පරපණ නැසීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි යන්නයි. පරපණ නැසීම යනු අනුන්ගේ ජීවිතයක් විනාශ කිරීමයි. සමහරු සතුන් මැරීම විනෝදාංශයක් කරගනෙ ඇත. ඔවුන් නො දන්නවා වෙන්නට පුළුවනි. එය විශාල පාප ක්‍රියාවක් බව එක් අවස්ථාවක ළමුන් විසින් ගල් මුල්වලින් ගසමින් ගැරඩියෙකුට හිංසා කරනු දුටු බුදුරදුන් එය නොකරන ලෙස ළමුන්ට අවවාද දුන් සේක.

**ගයානි ශශිකලා හේරත්**
11 ශ්‍රේණිය
ශ්‍රී ප්‍රේමානන්ද දහම් පාසල – ටැකැව හෙට්ටිපොළ

## තෙරුවන්



තෙරුවන නම් බුද්ධ රත්නය, ධර්ම රත්නය හා සංඝ රත්නයයි. මෙම උතුම් වස්තූන් ත්‍රිත්වය ත්‍රිවිධ රත්නය, තුනුරුවන යන නම්වලින් හැඳින්වෙයි. මෙම වස්තූන්ට "රත්නය" යන වචනය යෙදීමට හේතු පහක් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. පළමුව විසිතුරු බවයි. බුදුරජාණන් වහන්සේ ගැන සලකන විට දී දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් විසිතුරුය. උන්වහන්සේගේ ඥානය මෙන් ම අවබෝධ කරගත් ධර්මය ද, සංඝ රත්නය ද විසිතුරුය. දෙවැන්න ඉතා අගනා බවයි. මේ ලෝකයේ හෝ වෙනත් ලෝකයක යම් වස්තුවක් තිබුණ ද තුනුරුවන තරම් ඒ කිසිවක් නොවටී. කිසිදු දෙයකට සමාන නොවන යන අදහස තෙවැන්නයි. තමන් වහන්සේ විසින් ධර්මය අවබෝධ කරගෙන වදාළ ධර්මය ද, ඒ මග යන ආර්ය මහා සංඝයා ද එසේම ය. බුද්ධෝත්පාද කාලයක් පහළ වන්නේ ඉතා කලාතුරකිනි. බුදු කෙනෙකුන් පහළ වුවහොත් පමණක් ධර්මය පහළ වන අතර එයින් සංඝරත්නය පහළ වෙයි. හතර වැන්න එයයි. පස්වැන්න නම් උසස් පුද්ගලයන් පරිහරණය කිරීම යන අදහසයි.

**පිටිපන යසස්සි තිලක හිමි**
4 ශ්‍රේණිය
ප්‍රඥානන්ද මහා පිරුවන
මහරගම

## සුරපුරකි මව් රට

මහාවැව් විල් පොකුණු සදවා
මහා ගල් කැටයමට හරවා
ලොවේ ලක්දිව එකලු කරනට
යෝධ නිරිඳුන් විරිය දැරුවා

මගේ මව්බිම අලංකෘත කර
කුඹුරු කෙත්වතු සාරවත් කර
සමනොළ ගිරි හිසින් පහළට
මහා ගංගා පාර හැදුවා

රැඳී සිටිමින් දෙව් විමානෙක
අකුරු කරමින් පුංචි කොළයක
ලොවේ සුන්දර මුතු ඇටය ගැන
පුංචියට පද දෙකක් ගෙතුවා



**ඕෂධී කණිකා ශ්‍රී විද්‍යාතිලක**
රතනපාල දහම්පාසල
බලංගොඩ

# සදහම් අරණ



සංස්කරණය
**නයනා නිල්මිණී**

## පරිසරය සුරකිමු



පරිසරය යනු අප අවට ඇති ගස් හා වැල් ය. ඒ වගේම සතුන් ය. පරිසරය සුරකීමට පුංචි අපටත් දයක විය හැක. පැළයක් සිටුවා එය නිසි ලෙස නඩත්තු කිරීමට පුංචි කල පටන් ම පුරුදු විය යුතු හොඳ ගුණාංගයකි. අපට ජීවත්වීමට අවශ්‍ය ඔක්සිජන් ලැබෙන්නේ ද, මේ මිනිසුන් විනාශ කරන පරිසරයෙනි. පරිසරය සුරකීමට අපට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැක. ඒ අතරින් තම උපන්දිනයන් සැමරීම සඳහා අපට වටිනා පැළ යක් සිටුවා පරිසරය සුරකීමට පුංචි අපට දයක විය හැක. පරිසරය මගේ ජීවය යි.

**ඒ.එම්.චනුදි සිතුමිණි**
4 ශ්‍රේණිය ශ්‍රී සෝමානන්ද දහම් පාසල

## ගුරු උපහාර

සිසු කැළැ වෙත දිදී නිතරම — අවවාද
ගුරු කැළ වෙත නොමැත කිසි විට — අවලාද
නැති කල බොහෝ සිසු කැලකගේ — මතභේද
ජීවය ස්වර්ණනම් ගුරු වඳිනෙමි — පාද

සෝභිත නමින් ගම් පියසම එළිය — කල
පාසල දහම් බබළයි මෙහි සියලු — කල
සුවහස් සිසු කැලගෙ ජීවිත එළිය — කළ
මේ වැනි ගුරුන් උපදීවා සියලු — කල

බාධක ඇතත් නැණ නුවණින් ජය — ගන්නේ
සිසු නැණ වඩන්නයි නිතරම — වෙහෙසෙන්නේ
බුදු දම රකින මේ වැනි ගුරු — උතුමන්නේ
පායුග වඳින්නයි නැවතත් සිත් — දෙන්නේ

වෙහෙසුන නිසා මගෙ දෑසත් — පාදන්න
ගුරු පිය නිරෝගීමත්ව ම — වැජඹෙන්න
අවසර දෙන්න උපහාරය — නවතන්න
මාගෙන් පිදෙන තුති මල් මිට — පිළිගන්න

**ඩී.බී. ඉරේෂා මධුවන්ති**
10 ශ්‍රේණිය
ශ්‍රී සෝභිත දහම් පාසල – කිරිඉබ්බන්ආර

## අපේ දහම් පාසල

සම්බුදු පහස ලත් පුද බිම — කතරගම
ලොවේ පතල දෙව් නිජබිම — කතරගම
යාල වන පියස මායිම — කතරගම
අපේ බෝධිරාජ දම් පාසල — කතරගම

විහාර අධිපති රතනාලංකාර හිමි විදුහල්පති — වන්නේ
ගුරු මණ්ඩලේ කැපවීමෙන් අපේ දම් ගුණදම් සපුරන්නේ
සියය ඉක්මවූ සොයුරු සොයුරියන් සිප් හල — බබළන්නේ
දම්පාසල් තරඟ ඉසව් ජය ලැබ අප — සැනසෙන්නේ

රට දැය සමයෙ ඉදිරියෙ තිර බල — මුලුව
සමාජ මොහඳුර දුරලන පහනේ — ගිනිසිළුව
සව් සත සෙත පරිසරයට කරුණා මෙත් — හුරුකෙරුව
සැම කල් දිනේවා දම් පාසල් අපේ දම් — මව




**ශකිණි ඉමල්ෂා**
10 ශ්‍රේණිය
ශ්‍රී බෝධිරාජ දහම් පාසල
කතරගම

## රාහුල පොඩි හාමුදුරුවෝ

රාහුල කුමරු උපන් දිනයේම සිද්ධාර්ථ බෝධි සත්ත්වයන් වහන්සේ ගිහි ගෙය හැරද ගියහ. යළි උන්වහන්සේ කිඹුල්වත්පුර රජ මාළිගයට වැඩියේ බුද්ධත්වය ලැබීමෙන් පසුව ය. ඒ වන විට පුංචි රාහුල කුමරුගේ වයස අවුරුදු හතකි. බුදුරදුන් සමීපයට ගිය රහල්කුමරු බුදු හිමිගේ දෑතෙහි එල්ලී උන්වහන්සේ හා විහාරයට ගිය රාහුල කුමරු පසුව පැවිදි බව ලැබීය. පුංචි රාහුල හිමි කීකරුය. නිරතුරු ගුරුවරුන්ගේ අවවාදයන්ට ගරු කළහ. ශික්ෂාකාමී ය. දිනක් බුදුහිමි රාහුල හිමි වැඩ සිටි කුටියට වැඩියහ. දුර සිට බුදු හිමි වඩිනා බව දුටු රාහුල හිමි බුදු පා දෝවනයට පැන් තැබූහ. කුටිය වෙත වැඩි බුදු හිමි පා දෝවනයෙන් පසු පනවා තිබූ අසුනේ වැඩ හිඳි පුංචි රහල් හිමියන් මෙලෙස අසන්නට විය. "රාහුලය කැඩපතින් ඇති ප්‍රයෝජනය කුමක්ද? ස්වාමීනි එය අවශ්‍ය වනුයේ තමා විමසා බලන්නටය. රාහුල ඔබ නිවැරැදි ය. රාහුල එසේම ඔබ යම් ක්‍රියාවක් කරයි ද, වචනයෙන් යමක් කියයි ද, සිතින් යමක් සිතයි ද, ඒ හැම විටම වඩාත් පරික්ෂාවෙන් යළි යළිත් සොයා බලා ඒවා කළ යුතු ය.


**කිරිඉබ්බන්ආරේ අමිලධම්ම හිමි**
05 ශ්‍රේණිය
ශ්‍රී අභිනවාරාමය – මුල්ලේරියාව

### සාලිකේදාර ජාතකය



**දීත්ම සජාර ජයසිංහ**
3 වන ශ්‍රේණිය
සිරි නිමලසිරි ඉංග්‍රීසි දහම් පාසල – පොල්පිටිමූකලාන

### සුන්දර ගම්මානය



**නාලක තිලක හිමි**
2 වන ශ්‍රේණිය
ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙන
මහරගම

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

| | |
|---|---|
| සම්පූර්ණ නම | :- ................................................ |
| පාසල / දහම් පාසල | :- ................................................ |
| ඉගෙනුම ලබන ශ්‍රේණිය | :- ................................................ |
| ලිපිනය | :- ................................................ |
| දුරකථන අංකය | :- ................................................ |

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

# තෙමසකට පෙර අපවත් වී වදාළ වෙඬරුවේ විජිත හිමියෝ

**පොල්ගස්ඕවිට, හෙරලියාවල, ශ්‍රී සුධර්මාරාමය, මාලබේ ශ්‍රී සිද්ධාර්ථ බෞද්ධ මධ්‍යස්ථානය යන උභය විහාරාධිපති ව වැඩ විසූ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ කාරක සභික, වෙඬරුවේ විජිත ස්වාමීන් වහන්සේ අපවත් වී 2020 ජූනි මස 18 දිනට තෙමසක් සපිරෙයි.**

රාජපක්ෂ මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා හා හේරත් මුදියන්සේලාගේ සේකර මැණිකේ යන දෙපළට දාව 1964 මැයි 14 දින තෙල්දෙනිය වෙඬරුව ගම්මානයේ දී විජේරත්න බණ්ඩා නමින් මෙම කුල කුමරු ජන්ම ලාභය ලැබී ය. 1979 මාර්තු 01 දින උපන් ගමේ ම කිරි විහාරය නම් වූ විහාරස්ථානයේ දී වෙඬරුවේ විජිත නමින් පැවිදි බිමට ඇතුළත් විය.

විජිත හිමියන්ගේ ගුරු හිමියන් වූවේ ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක ධූරය දැරූ රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති විද්‍යා විශාරද වෙඬරුවේ අනෝමදස්සී නාහිමිපාණෝ ය.

පැවිදි වීමෙන් පසුව ගුරු හිමියන් වැඩ සිටි හෙරලියාවල ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරස්ථානයට වැඩම කරමින් ශාසනික සේවාවට එක්විය.

හොරණ විද්‍යාරත්න පිරිවෙන්හි දී භික්ෂූන් වහන්සේ නමක වශයෙන් උගත යුතු බණ දහම් හා වත් පිළිවෙත් හදාරනු ලැබී ය. දහම් සිප් සතර හදාරා අවසන් කර 1984 පෙබරවාරි 11 දින කෝට්ටේ සංඝ සභා උපෝසථාගාරයේ දී උතුම් උපසම්පද ශීලයෙහි පිහිටවනු ලැබී ය.

අනෝමදස්සී අනුනාහිමියෝ 1988 වසරේ දී අපවත්වීමෙන් පසුව විහාරස්ථානයේ විහාරාධිපති බවට පත් විය. පැවිදි හිමිනමක් ලෙසින් පුරා හතළිස් වසරක් උන්වහන්සේ වෙතින් සිදුවූ ආගමික, ශාසනික හා සමාජ මෙහෙවර තවත් දශක ගණනාවක් දායක කාරකාදීන්ගේ සුවිශේෂී ඇගයුමට ලක් වන්නාහ.

තම ගුරු හිමියන් ජීවත්ව සිටියදී ම 1987 දී එම විහාර බිමේ නව සංඝාවාසය සහිත උපෝසථාගාරය ගොඩනංවනු ලැබුවේ උන්වහන්සේ මැදිහත් වීමෙනි. අනතුරුව පුරාණ බෝරුක වටා දර්ශනීය අටවිසි බුදු කුටි සහිත බෝධි ප්‍රාකාරයක් ඉදිකළ අතර 2008 දී සමාධි බුද්ධ ප්‍රතිමාවක් ද පරිත්‍යාගශීලී අනුග්‍රාහකයකුගේ දායකත්වයෙන් වෙන්ව ස්ථාපිත කරන ලදී. පැරණි බුද්ධ මන්දිරය 2000.11.22 දින ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත පුරාවිද්‍යා සංරක්ෂණ ස්ථානයක් ලෙසින් වැඩිදියුණු විය. ඉඩකඩ ප්‍රමාණවත් නොවූ නව බුද්ධ මන්දිරය 2018 දී පුළුල් කර වහළයට නව සිතුවම් යොදා පිළිසකර කරන ලදී. 2011 වසරේ දී පැරණි සංඝාවාසය ඉවත් කර ධාතු මන්දිරය සහිත දාන ශාලාවක් හා දෙමහල් සංඝාවාසයක් ගොඩනැංවීම උන්වහන්සේගේ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රතිඵලයකි. වේදිකාවක් සහිත ධර්ම මන්දිරයක් 2019 දී ගොඩනංවනු ලැබුවේ රාජ්‍ය අනුග්‍රහය ද පරිත්‍යාගශීලීන්ගේ ආධාර ද එක්කර ගනිමිනි.



1947 වර්ෂයේ ආරම්භ කරන ලද ශ්‍රී සුමනතිස්ස දහම් පාසල ද උන්වහන්සේගේ මූලිකත්වයෙන් නව පණක් ලදහ. මේ සමඟම මාලබේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමියන් අපවත්වීමෙන් පසුව මාලබේ බෞද්ධ මධ්‍යස්ථානය ද විජිත හිමියන්ගේ විහාරාධිපතිත්වයට පත්විය. අගහිඟකම් පිරි දූ දරුවන්ට පොත්පත් ප්‍රදානය, වැතර රෝහල හා පිළිකා රෝහලට අවශ්‍යතා පිරිනැමීම, ගංවතුර වැනි විපත්වලදී ගම්වාසීන්ට සංග්‍රහ කිරීම, වාර්ෂික ව සිදුකරන දළදා මන්දිරයේ පුද පූජා උන්වහන්සේගේ ආගමික හා සමාජ මෙහෙවරයන්ට සාක්ෂි සපයනු ලබයි. සිය ගුරු හිමියන් අපවත්වීමෙන් පසුව සෑම වසරකදී ම අපවත් වූ නොවැම්බර් 26 දින කෘතවේදී ගුණානුස්මරණ පුණ්‍යෝත්සව පවත්වනු ලැබූ බව ද අමතක නොකළ යුත්තකි. දායක කාරකාදීන්ට වැඩි බරක් නොදී මෙවන් අතිවිශාල වටිනාකමකින් යුත් කාර්ය භාරයක් ඉටු කිරීම විශ්මය ජනක බව ද නොකියා නොහැක. හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමය විහාරස්ථානයක් සතුවිය යුතු සකලවිධ අංගෝපාංගයන්ගෙන් සමන්විත දැකුම්කළු පුද බිමක් ලෙසින් අද විරාජමාන වනුයේ උන්වහන්සේගේ මනා කළමනාකාරිත්වයත්, මානසික මෙන්ම කායික ශ්‍රමය පවා වැය කිරීමේත් ප්‍රතිඵල ලෙසිනි.

තෙමස් පූර්ණ පුණ්‍යෝත්සවය ජූනි 15 දින ආරම්භ වේ. 15, 16, 17 තෙදින පස්වරු 7.00 ට දම් දෙසුම් සංවිධානය කර ඇත. වෙඬරුවේ උපාලි අනු නාහිමි, මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නාහිමි, මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමි ඒ සඳහා ඇරයුම් ලැබ තිබේ. ජූනි 18 දින දවල් ආචාර්ය ඉත්තෑපාන ශ්‍රී ධම්මාලංකාරාභිධාන මහා නායක හිමිපාණන් වහන්සේ ප්‍රධාන පනස් නමකට අධික සංඝරත්නය විෂයෙහි සංඝගත දක්ෂිණාවකි.

වත්මන් භාරකාර විහාරාධිපති පණ්ඩිත මකුරුප්පේ සෝමාලංකාර හිමියන්ගේ උපදෙස් හා මගපෙන්වීම් මත සිදුකෙරෙන මෙම පුණ්‍යෝත්ස්වය විහාරස්ථ දායක පිරිස් විසින් සංවිධානය කෙරේ.

පොල්ගස්ඕවිට සමූහ
**සෝමරත්න පන්නිල**

## කොරෝනා වසංගතය හෙළි කළ...

8 පිටුවෙන්....

එවිට අධිරාජයා විමසනවා 'හොඳයි මේ කාරණා තුනම වැදගත්. හැබැයි මෙයින් එකක් අඩුකරනවා නම් කුමක්ද එය කියා. ඔහු කියනවා එහෙමනම් ආර්ථිකය ඉවත් කරන්න කියා. හොඳයි අනෙක් කරුණු දෙකෙන් කුමක්ද ඉවත් කරන්නේ කියා අධිරාජයා කොන්ෆියුසියන්ගෙන් විමසනවා. ඔහු කියා සිටින්නේ එහෙනම් ආරක්ෂාව කියන දේ ඉවත් කරන්න කියලා. ඔන්න ඔය මොහොතේ ඔහු මහ හයියෙන් සිනාසී කොන්ෆියුසියස්ගෙන් ප්‍රශ්න කරනවා. ආර්ථිකය හා ආරක්ෂාව නැතුව ඉන්න රටක මිනිසුන්ගේ සදාචාරය විතරක් රැක්කම කොහොමද මිනිස්සු ජීවත් වෙන්නේ, කන්නේ බොන්නේ කියලා.

මෙන්න මේ මොහොතේ ඔහු දෙන පිළිතුර හරි අපූරුයි. මහරජ ආර්ථිකය නැතත්, ආරක්ෂාව නැතත් සදාචාරය පවතිනවා නම් ඒ රටේ මිනිස්සු ගැන කිසිම සැකයක් නැහැ. ඔවුන්ට ආර්ථික ශක්තිය වගේම ආරක්ෂාව ලැබෙනවා. හැබැයි ඉතිං සදාචාරය නැතුව අනෙක් කරුණු දෙක තිබුණා කියලා රටකට කිසි සුගතියක් නෑ. ඒක හරියට සූබරයෝ, ගවයෝ වගේ. මිනිසුන් හැදෙයි. නමුත් මනුස්සකම ඉතුරු වෙන්නේ නැහැ කියලා.

මනුස්සකම පිරිහුණු, නැතිවුණු තැන ආර්ථිකය හෝ ආරක්ෂාව පැවතිලා කුමටද? ඒ නිසා මනුස්සකම, සංවේදිකම රැඳුණොත් අනෙක් හැමදේම පවතියි. මෙතැනදී අපට හිතන්න දෙයක් තියෙනවා. යම් රටක ජනතාව දියුණු යැයි තීරණය කරන්නේ ආර්ථිකය නිසාවත් ආරක්ෂාව නිසාවත් අධි තාක්ෂණික ක්‍රමවේද හා උස්ව නැගුණු ගොඩනැගිලි නිසාවත් නොවෙයි. සියල්ල තීරණය වන්නේ සදාචාරාත්මක හා විනය ගරුකත්වය මතයි. එහෙම නොවුණොත් සමාජය, ශරීරය වැඩුණු සූබරයන් හා සමානයි. තමන්ගේ අම්මා තාත්තා හඳුනන්නේ නැහැ. හොඳ නරක දන්නේ නැහැ. පරිහානිය වටහා ගන්න පුළුවන් නේද?

ඉතින් මේ කාරණාව හරිම වැදගත්. බෞද්ධ ආර්ථිකය වගේම බෞද්ධ සමාජ විද්‍යාත්මක පදනම මත පිහිටමින් අපි කටයුතු කිරීම. මේ සදාචාරය හෙවත් හික්මීම දෙන බුදුන් වහන්සේගේ දේශනාවන් තුළ තියෙන්නේ 'විනයෝ නාම ශාසනස්සායි' යනුවෙන්. මේ සමස්ත සමාජ රටාව පිහිටලා තියෙන්නේ විනය මතයි.

මෙය අපේ පැරණි සම්ප්‍රදායේ තියෙනවා. 'විද්‍යා දදාති විනයං' කියලා. ඒ කියන්නේ විද්‍යාව කියන්නේ උගත්කම විෂය ඥානය, ශිල්ප ශාස්ත්‍ර දැනීම. මේ සියල්ලේ අවසන් ඵලය වන්නේ විනය හෙවත් හික්මීමයි.

අද දරුවන් ඉගෙන ගන්නේ ඇයි. ඇහැව්වොත් කියන්නේ සහතික ගන්න. ඊට පස්සේ හොඳ රැකියාවක් කරන්න. දෙමව්පියෝ මොකද කරන්නේ ජනප්‍රිය පාසල් හොයන් යනවා. ශිෂ්‍යත්ව විභාගවලට දරුවන් නොමරා මරණවා. ඇයි හොඳ රැකියාවක් ගන්න. රැකියාවක් නම් ලැබෙයි, සහතිකත් ලැබෙයි. හැබැයි ඒ පුද්ගලයා අම්මා තාත්තා හඳුනන්නේ නැතිනම් හොඳ නරක දන්නේ නැතිනම් මොකක්ද ඇති එලේ. අපි දැනගතයුතුයි ඉගෙනගත යුත්තේ හොඳ පුරවැසියකු වීමටයි. තමන්ටත් අනුන්ටත් අයහපත් නොකොට යහපත සලසාගෙන සමාජයට පරිසරයටත් යහපත් ව ජීවත් වීමටයි. බුදුන් වහන්සේ තීරණය කළා යහපත් සමාජයක් ගොඩනගන්න නම් මුලින්ම විනය හික්මීම ගොඩගන්න අවැසියි කියා. ඒ නිසයි විනය ශික්ෂාපද පැනෙව්වේ.

මේ විනය ගරුත්වයේ යහපත ඉතා මැනවින් අපි දැක්ක ඓතිහාසික අවස්ථාවක් අපි මේ මුහුණ දුන්න කොරෝනා ව්‍යසන තත්ත්වය. එතැනදී අපිට අද සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට හේතුවූයේ බෞද්ධ සමාජය තුළ පැවැති විනය ගරුකත්වයයි. මා සඳහන් කළ රටවල සාර්ථකත්වයට බලපෑවේ මේ බෞද්ධ සමාජ පරිසරයයි.

අපි බෞද්ධයන් විදිහට පුරුදු වෙලා තියෙනවා මෙත්තා කාය කම්ම, මෙත්තා වචී කම්ම, මෙත්තා මනෝ කම්ම කියන දේට. යහපත් හැසිරීම, යහපත් වචන වගේම යහපත්ව සිටීම කියන ගුණ දහම් වලට. අපි හුරුවුණු සමාජයක්. මෛත්‍රී භාවනාවෙන් අප කරන්නෙත් ඔය දේමයි. තමන්ට මෙත් වඩල ඉන්පසු අපි අනෙක් අයට මෙත් වඩනවා.

මෙන්න මේ සාධකය මුල් කරගෙන කොරෝනා කාලේ අපිට ලැබුණු සෞඛ්‍ය නීති අපි අකුරට පිළිපැද්දා. අදටත් අපි පිළිපදිනවා. තමන්ගේ යහපතට එය අකුරට පිළිපදින විට එය පවුලටත්, ඉන්පසු සමාජයටත්, රටටත් ගෙනාවේ සුබ ප්‍රතිඵලයක් විතරමයි. ආත්මාර්ථකාමී කම්, අන්තවාදී කම් සමහර අය තුළ පැවතුණත් බොදුනුවන් තුළ අපි එය දැක්කේ නැහැ. මෙ විශිෂ්ඨ ප්‍රතිඵලයේ සාර්ථකත්වය එයයි.

මෙයින් අපට පැහැදිලියි මිනිසුන් තුළ සදාචාරවත් බවත්, හික්මීමත් ගොඩනැගුණු රටක් විදිහට කෙතරම් ශක්තිමත්ද කියලා. මේ ව්‍යසනයේ ජයග්‍රහණය එයයි. ඒ නිසා යහපත් ජීවන චර්යාවෙන් ජීවත් වන්නට හැකිනම්, බෞද්ධ සාරගර්භ තුළ රැඳෙන්නට හැකිනම් අපට මෙලොවත් සැනසෙන්ට හැකියි. පරලොවත් සැනසෙන්නට හැකියි.


# Buddhism as a Psychological solution for the modern legal separation of Marriages

**Marriage is one of the universal social institutions and it is a social convention, an institution created by man for the well-being and happiness of man, to differentiate human society from animal life and to maintain order and harmony in the process of procreation.**

It is closely connected with the institution of family. In fact, family and marriage are complementary to each other. Marriage can have different implications in different cultures. As an Asian country, in Sri Lanka marriage is such a respectable bond that it contributes to having a harmonious society. But presently there are more than 400 divorce cases on trial in courts per day. As the result of that those men, women and mainly children are facing both physical and mental problems as they fail in their lives. The Buddha gave good advice on how to maintain peace and harmony in the home between husband and wife in order to achieve a happy married life. The Buddhist views on marriage are very liberal in Buddhism, marriage is regarded entirely as a personal and individual concern, not as a religious duty. Buddhism indicated that the lay disciples should organize their life so that there is a successful and complete family without any cause for conflict. There are many suttas such as Manapakaikasutta, Vyaggapajjasutta, Ittibandhanasutta,Puri sabandhanasutta, SigalovadaSutta, Samajiv Sutta, Pa hmasavásasutta present many examples and points for discussion about "Buddhism as a psychological solution for the modern legal separation of marriages".

Legal separation of the marriage is named as Divorce. A divorce is a formal ending of a marriage. It is more permanent than a separation and involves a legal process. If someone gets a divorce, that means the marriage is officially over. There are many disadvantages of the Divorce. Divorce ends marriages, Divorce hurts, Divorce costs money, Divorce reduces living standards, Divorce changes personal relationships and Divorce hurts children. According to my research information getting divorce of the parents is highly effecting to the psychological development of the children.

However, separation or divorce, although uncommon for Buddhists, is not prohibited. It is accepted.If a couple enters into marriage and adheres to Buddhism's ethical prescriptions for marital and family life, that divorce becomes a non-issue. If a couple refuses to follow the ethical prescriptions, is unable to live in peace, harmony, and mutuality with one another, or in the event of extreme circumstances, such as adultery or violence, it is preferable for the marriage to be broken than for the marriage to destroy the couple or the family. Men and women must have the liberty to separate if they really cannot agree with each other. Separation is preferable to living a miserable family life for a long period of time for both partners and innocent children. The Buddha further advises in Parabhavasutta, old men not to have young wives as the old and young are unlikely to be compatible, which can create undue problems, disharmony and downfall.




**Kundasale Subhagya Meheninwahance**
Lecturer, Religious course coordinator;
Intercollegiate Sri Lanka Education Affiliated to the University of Peradaniya

A good marriage should grow and develop gradually from understanding and not impulse, from true loyalty and not just sheer indulgence. The institution of marriage provides a fine basis for the development of culture, a delightful association of two individuals to be nurtured, and to be free from loneliness, deprivation and fear. In marriage, each partner develops a complementary role, giving strength and moral courage to one another, each manifesting a supportive and appreciative recognition of the other's skills. There must be no thought of either man or woman being superior; each is complementary to the other, in a partnership of equality, exuding gentleness, self-control, respect, generosity, calm and dedication. Marriage itself should have as its foundation loving kindness or 'metta', the wish for others to be happy, and in so being, acts an environment for the cultivation of the same. Furthermore, marriage helps one to improve one's karma and karmic tendencies, for it acts as a framework within which one can refrain from sexual misconduct, the fourth of the five precepts.

The ideal Buddhist couple would be Nakulapita and Nakulamata who were devoted disciples of the Buddha and who had been happily married for many years. According to their story faithfulness, mutual love and compassion and being each other's spiritual mentor and teacher, would be the recipe for an enduring and enriching relationship. According to the Buddha's understanding and teachings, if a husband and wife love each other deeply and have similar kamma, they may be able to renew their relationship in the next life too. The Buddha also said that the strong affinity two people feel towards each other might be explained by them having had a strong love in a previous life. "By living together in the past and by affection in the present, love is born as surely as a lotus is born in water". This idea is elaborated in the Mahavastu: "When love enters the mind and the heart is joyful, the intelligent man can say with certainty that 'This woman has lived with me before' ".

## Conclusion

**Marriage is a partnership of two individuals and this partnership is enriched and enhanced when it allows the personalities involved to grow. Divorce is not necessarily the only outcome from a broken or damaged marriage. There are other solutions contained within the teachings of the Buddha. Following Buddhist teachings will lead to a happy and fulfilled marriage. It provides guidance and pathways to reconciliation should disharmony and unpleasantness occurs. It speaks of loving kindness, mental awareness, dedication and an inner calm which can be seen as having a psychological background and effect.**



# පහන් සිතක කවි

## ලොකු හාමුදුරුවෝ

දී හැම විටම ඔවදන් පෙරටුවෙහි    සිටී
නායක හාමුදුරුවෝ ලෙඩ ඇඳෙහි    සිටී
ජීවය අයැද බෝ හිමි අබියසෙහි    වැටී
දයක පිරිස හෙළුවා දුක් කඳුළු    කැටී

දෙවියන් බුදුන් වෙත දුක් මුසු පුවත    කියා
සැදැහැතියෝ දුවති තෙල් මල් සුවඳ    සොයා
අවසන් බෝධි පූජාවට ලකුණු    තියා
දැල් වූ පහන් සැඩ සුළඟට නිවී    ගියා

හුදු දන වෙත දහම් දෙසමින්    සුපසන්න
ගොරතර සසර භවයෙන් උන්    මුදවන්න
ගෞරවනීය හිමියනි උජු    පටිපන්න
යළි බුදු පුතෙකු වී මේ බිම    උපදින්න

**කුසුම් බෝධිමුල්ල**
ශ්‍රී බුද්ධරක්ඛිත දහම් පාසල - බෝධිමුල්ල



## තුන්ලොව දිනූ සේක

බුදු වන බවට සලකුණු දැක සිහින    පසින්
මිදුමට කෙලෙස් තිර අදිටන තැබුවෙ    තිසින්
වැඳුමට දහම් කඳ සත වෙත ස තර    දෙසින්
සිදු විය මාර සෙන් පැරදුම කුලුණු    බසින්

වනසා ලෝ සතුන් කප් කෙළ විඳපු    දුක
සනසා සියලු සත දම් ඔසුවකින්    එක
සුන් කර කෙලෙස් මර සෙන් පුන් පෝ    දක
තුන් ලොව දිනූ ගුරු පිරිනිවි වැඩි    සේක

**ටී. එල්. විශ්මිත ගයාෂාන්**
නාවල

ජයග්‍රාහී කවිය

## සමරමු මිහිඳු හිමි

පියරජු ඇරයුමෙන් දන වෙත බැඳුන    පෙමින්
හිමියනි මිහිඳු වැඩි ලක දම් සුවඳ    ලමින්
පෝයට පොසොන් බුදු සිරිපා ළඟට    වෙමින්
සමරමු මිහිඳු හිමි පුද මල් සුවඳ    දමින්

හෙළ බොදු කලා තිමවුම් රටතොට    මැවුනී
දගැබ් පිළිම ළඟ හෙළ දන දණ    නැමුනී
දහමට පිනට ලැදි සැම බුදුමඟ    ඇදුනී
අනුබුදු මිහිඳු හිමි දෙසූ දම් රට    දිලිනී

වට්ටාරම **ටී. ඇම්. පොඩිරාළහාමි**
ඉඹුල්ගස්දෙනිය

## අනුසස්

බුදුරුව ඉදිරියේ ඇති    පරමල්
අස්කිරීමේ පින නම්    මතරම්
බෝ විහාර මළුව වැනි    ඇමදුම්
අනුසස් ලැබෙයි අති    මතරම්

**අදිත්තා මෙහෙණිය**
හෝකන්දර



සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

## අනියත බව

**දෙපෝය වැඩියේ ඊයේ    දවසෙයි**
**බෝපත් හැලිලා රටා    නිමාවෙයි**
**පහන් වැටේ සිළු මියඳුන    ගානයි**
**මලසුන මත මල් පරවුණ    පාටයි**

**සියල්ල වෙනසක හැඩරුව    අරගෙන**
**කාලෙ ගෙවෙන හැටි සිහියෙන් දැනගෙන**
**පොඩි හාමුදුරුවො බුදු ගෙයි    හිඳගෙන**
**බවුන් වඩනවා සිත සන්සුන්    වෙන**

**අමුණුගොඩ කුසුමා ප්‍රේමරත්න**
කුරුණෑගල

## කොවිඩ් සිතිවිලි

**නොඅඩුය ධන බලය බටහිර රට    වලට**
**සුලබය උපකරණ රෝහල් බිම්    වලට**
**දුබලය මිනිස්කම අපගේ මෙන්    එහෙට**
**මරණය පත් කරයි ලෝවැසියන්    දුකට**

**ලොව අනියත ය තිලකුණ දෙස යොමු    වන්න**
**දුක නියතයකි කෝවිඩ් ගැන ගොනු    වන්න**
**දින දෙක තුනක් තුළ මර බිය මුසු    වන්න**
**මිනිසා කළ වරද කිමදැයි විම    සන්න**

**වෛද්‍ය සුනිල් අතුකෝරල**
මණ්ඩාවල



## හොඳ නොහොඳ

ඉසිකෝ මානයෙන් සිත කෙලෙසන්න    එපා
මුසාවාදයට නම් යොමු වෙන්න    එපා
මනසින් පහත් අය ලෙස හැසිරෙන්න    එපා
කළ ගුණ කෙලෙසවත් අමතක කරනු    එපා

හොඳ දිවි පෙවෙතකට යහ මඟ කියා    දී
දරුවන් යවා නිසි උපදෙස් ලබා    දී
කරමින් රට දැයට සුබ දේ සලසා    දී
විස්සයි විස්ස සමරමු විසි එකේ    දී

**අමරා අලහකෝන්**
කිරිඳිවැල

## පරම නිදහස

රූපය කිමැයි තේරුම් ගත් දිනෙක    යමෙක්
ඇතිවෙයි ඇසේ නිදහස නොමැතිවම    දුකක්
හඬ තේරුම් ගනී නම් යම් අයකු    දිනක්
සවනින් ලබන නිදහස වේ අසුරු    මිණක්

තනිව සරන දුර ඕනෑ තරම්    යන
සිරුර නොමැත ලෙන තුළ ඇති ලැගුම්    ගෙන
අරුම සිතක නිදහස ලැබුවොතින්    පින
අමර සුවය එය වේ මැයි නිවන්    යන

මිරිජ්ජවිල **සිරි දන්තනාරායන**

## බෝපත් සෙවණ

රන්වන් දළුලන බෝපත් සෙවණ    යට
නිල්වන් කොළලන බෝපත් සෙවණ    යට
සහනය ගෙනෙයි සම්දේ ඔබ නෙතුමානේ සිටින    විට
නිවන තමයි අන් සරණක් නැත    අපට

**කේ. ඒ. එන්. එන්. කහඳව**
ගම්පහ

## ආයු බෝ වේවා!

හමුද ත්‍රිත්වය ඇතුළු රෝහල් සැම සියලු    දෙනා
වෛහෙසදරා ගුණ නුවණින් සැවොම එක්ව වැඩ    කෙරුණා
කොරෝනාව පැරදවූ රට උතුම් ම ශ්‍රී ලංකාව    වුණා
මෙහැම ඇතුළු රටේ සැවොම සියක් ආයු බෝ    වේවා !

**ඥණවතී කරන්නාගොඩ**
හොරණ

## කවි කිවිඳියනට සතර පෝදාට ම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**



## විළඳ – මී පැණි පූජාව 25 දා
## රුවන්වැලි මහා සෑ මළුවේ දී

ප්‍රථම ආහාර සම්බුද්ධ පූජාව වන ‘තපස්සු – භල්ලුක ‘ වෙළෙඳ දෙබෑයන් පිදූ ‘විළඳ මී පැණි පූජාව ‘ සිහිගන්වමින් දසවන වරටත් ‘විළඳ – මී පැණි පූජාව‘ ජූනි 25 වනදා උදේ 6.30 සිට අනුරාධපුර රුවන්වැලි මහා සෑ මළුවේ දී පැවැත්වේ.

විළඳ – මී පැණි රැගත් අසිරිමත් ගැල් පෙරහරක් අලුයම දෙකට පමණ ගමන් අරඹන අතර මෙම පින්කමේ අරමුණ වන්නේ එදා සම්බුද්ධ පූජාවට මී පැණි ලබා ගත් මී මැස්සන් හෝ මී පැණි රැගත් ගැලක බැඳි ගොනකු හෝ තවමත් සසරේ සැරි සරනවා නම් ඔවුන්ට පින් අනුමෝදන් කිරීම ය. තව ද මෙවර පින්කමට ලැබෙන මී පැණි ආයුර්වේද සංස්ථාවට ලබා දෙන අතර පින්කමේ නිර්මාතෘ කඳුළුගමුවේ සුමනතිස්ස හිමියන් ,අනුශාසක අඹන්වැවේ පියරතන හිමියන් සහ ප්‍රධාන සංවිධායක ත්‍රිපිටක ධර්මවේදී ගෝනපීනුවල චන්ද්‍රරතන හිමියෝ ද ඇතුළු ගිහි, පැවිදි, ප්‍රදේශවාසී රැසකගේ අනුග්‍රහය ද ලැබෙනු ඇත.

බුදුසරණ
**පහන් සිතක කවි**

BCC

| | | |
|---|---|---|
| **සම්පූර්ණ නම** | :– | ................................................ |
| **ලිපිනය** | :– | ................................................ |
| **දුරකථන අංකය** | :– | ................................................ |

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**

තිස් වසරක යුද්ධය මැද
නාගදීපය රැකගත්
නා හිමියන්ගේ කතාව
7 කොටස

# නාගදීපයට නාවික හමුදා කඳවුරක්



**කුඩා කල සිටම දඟකාර දිවියක් ගත කළ පද්මසිරි මැන්දිස් නාගදීප විහාරයේ දී නවදගල පදුමකිත්ති නමින් පැවිදි කළ ද පොඩි හාමුදුරුවන්ගේ දඟකාරකම් නම් අඩු වූයේ නැත. දිනපතාම නායක හාමුදුරුවන්ගෙන් පහර කෑමට උන් වහන්සේට සිදු විය.**

පදුමකිත්ති හිමියන් ස්නානය පිණිස වැඩම කෙළේ 'ළිඳවත්ත' නම් විහාරස්ථානයේ සිට තරමක් දුරින් පිහිටි ළිඳකට ය. එය කාන්තාවන් පවා ස්නානය කරන ළිඳකි.

ළිඳට වැඩම කරන පොඩි හාමුදුරුවන්ට වතුර අදින්නට සිදු වූයේ නැත. දූපතේ දෙමළ කාන්තාවන් පොඩි හාමුදුරුවන් නානකඩය ඇඳගත් පසු වතුර ඇද නාවන්නට විය. සබන් ගෑම, කුණු ඇතිල්ලීම පවා දෙමළ කාන්තාවන් විසින්ම සිදු කරන ලදී. පැයක් පමණ පොඩි හාමුදුරුවන් එසේ නහවන දෙමළ කාන්තාවන් දෙමළ ගී පවා ගායනා කෙළේ නාවන අතරේ ය. පොඩි හාමුදුරුවන්ට එසේ කවුරුත් ආදරේ කරන්නට විය. එක් කාන්තාවක් විසින් පොඩි හාමුදුරුවන් නැහැවීම පිණිස ලොකු පිටි ටින් එකකින් තැනූ බාල්දියක් ද වෙන් කර තිබුණි.

පැවිදිවීමෙන් පසුව පොඩි හාමුදුරුවන්ගේ හොඳම දෙමළ මිතුරා බවට පත් වූයේ සිවා ය. විහාරස්ථානයට ආසන්න ව පදිංචිව සිටි සිවා පන්සලේ සුළු වැඩවලට සහාය වූයේ ය. ඒ වෙනුවෙන් ධම්මකිත්ති නායක හාමුදුරුවෝ දිනකට ශත 10ක් සිවාට ලබා දුන්හ. පන්සලේ වැඩි කාලයක් රැඳී සිටි සිවා පොඩි හාමුදුරුවන්ට දෙමළ පවා ඉගැන්වූයේ ය.

දහවල් දානයෙන් පසුව නායක හාමුදුරුවෝ මඳ වේලාවක් සැතපෙති. ඊට පෙර පදුමකිත්ති හිමියන්ට ධර්ම පොතක් පිටපත් කරන්නැයි අණ කරති. නායක හිමියන් පවසන පරිදිම පදුමකිත්ති පොඩි හාමුදුරුවෝ ඉක්මනින් ධර්ම පොතක් පිටපත් කර සිවා සමඟ සෙල්ලමට එක්වීමට කටයුතු කරති.

එකල නාගදීපයේ 'කට්ටුමරම්' නමින් කුඩා යාත්‍රාවක් තිබුණි. එයින් ප්‍රධාන වශයෙන් කෙළේ නාගදීපයට යන එන මඟී යාත්‍රාවල පතුලේ පිරෙන ජලය ඉවත් කිරීමයි. නායක හිමියන් සැතපුණු විට පදුමකිත්ති හිමියෝ සිවා හා ගොස් එම යාත්‍රාවේ ටික දුරක් හබල් ගාමින් යති. මුහුදේ ඈතට නොගිය ද පදුමකිත්ති හිමිගේ සිවුර තෙත බරිත විය.

"සිවුර තෙමුණේ මොනව වෙලාද?" නායක හාමුදුරුවෝ විහාරස්ථානයට පැමිණෙන පදුමකිත්ති හිමි වෙත බැණ වැදුණාහ.

"සතෙක් ජරා කරා, ඒක නිසා හේදුවා"

"මොන වතුරෙන්ද හේදුවෙ" නායක හිමියෝ සිවුරේ තිබුණු වැලිකැට කිහිපයක් දැක විමසූහ.

"ළිඳේ වතුරෙන්" පදුමකිත්ති හිමියෝ ඇගට පතට නොදැනී කීහ.

පසුදින ද යාත්‍රාවට නැඟී මුහුදේ වෙරළ සමීපයෙන් යාත්‍රා කර ගොඩබැස විහාරස්ථානයට යෑමට සැරසෙනවාත් සමඟ ම මහත වේවැල් පහර කීපයක් පදුමකිත්ති හිමිට වැදුණි. නා හිමියන් පදුමකිත්ති හිමි මුහුදේ යාත්‍රා කරනු දැක වේවැල ද රැගෙන වෙරළේ බලා සිටියහ. වේවැල් පහර කාගෙනම පදුමකිත්ති හිමියෝ විහාරස්ථානයට දුවමින් වැඩම කළහ.

"සිවා කට්ටුමරමෙ බැමි කපල විසි කරල දාපන්" නා හිමියෝ විහාරස්ථානයට වැඩම කරමින් සිවාටම පැවසූහ. ඔහුද ඒ ලෙසින්ම කටයුතු කෙළේ ය. එසේ වුවද පසුදිනද සිවා සමඟ ගොස් කට්ටුමරමෙ කොට දෙකක් එකතු කර ඒවා එක්කර බැඳගෙන මුහුදේ ඔරු පදින්නට පදුමකිත්ති හිමියෝ කටයුතු කළහ. යාත්‍රාව නිසි පරිදි බැඳ නොතිබූ හෙයින් එහාට මෙහාට වැඩියෙන් පැද්දුණේ ය. හදිසියේම ආ සුළං හා රළ පහර නිසා යාත්‍රාව ගැඹුරු මුහුද දෙසට ඇදී ගියේ ය. දෙදෙනාටම දවල් තරු පෙනුණි. කරන්නට කිසිවක් නොවී ය.

සිවා වහාම සරම ගළවා අතට ගත්තේ ය. ඔහු අමු නිරුවතිනි. එක් කෙළවරක් සිවා අත ය. අනෙක් කෙළවර පදුමකිත්ති හිමි අත ය. දෙදෙනාම එකතුව සරම රුවලක් මෙන් අල්ලා ගත්හ.

අටවා ගත් යාත්‍රාව වෙරළට එන විට වැඩම කළ සිටි නා හිමියෝ පදුමකිත්ති හිමියන් බෙල්ලෙන් අල්ලා ගත්හ. පසු පසට මෙන්ම පිටට හොඳ හැටි වේවැල් පහර දුන්හ. පහරදීම නතර වූයේ වේවැල කැඩුණු පසු ය.

යාත්‍රාව ගෙන යන ලෙස නා හිමියෝ විහාරස්ථානයට පැමිණි සිටි දෙමළ වැසියකුට පැවසූහ. ඔහු එම කොට සහිත යාත්‍රාව රැගෙන ගියේ ය. එයින් පසු පදුමකිත්ති හිමියන්ට තිබූ ලොකුම ප්‍රශ්නය මුහුදේ ගමන් කරන්නේ කෙසේද යන්නයි.

මේ අතර යාපනයේ නගරාධිපතිවරයා වූ ඇල්ෆ්‍රඩ් දෙරේඅප්පා මහතා ඝාතනය කළ බවට ජනතාව කතා කරන්නට වුවද පොඩි හාමුදුරුවන්ට එය එතරම් තේරුම් ගියේ නැත.

දින කිහිපයකට පසුව සිවා විහාරස්ථානයට දුවවිත් පොඩි හාමුදුරුවන්ට පැවසුවේ ලොකු තල්මුලක් මුහුදේ ගසා ගෙන විත් ඇති බැවින් එයින් බෝට්ටු පැදිය හැකි බවයි. දහවල් දානයෙන් පසුව නායක හිමියන් සැතපෙන්නට වූ පසුව දෙදෙනාම වෙරළට ගියහ. විශාල තල් මුල මුහුදට දමා දෙදෙනා එහි එල්ලී යන්නට උත්සාහ කළ මුත් තල් මුල කැරකෙන්නට විය. අඩි 10කට වඩා එයින් යන්නට නොහැකි විය. දෙදෙනාම හොඳට තෙත බරියම් විය.

මේ ලෙසින් පදුමකිත්ති පොඩි හාමුදුරුවන්ගේ දඟකාරකම්වල නම් අඩුවක් නොවී ය. 1977 වසර උදා විය. ඒ වන විට පොඩි හාමුදුරුවන්ට අවුරුදු 16කි. දෙරේ අප්පා ඝාතනයෙන් ඒ වන විට වසර දෙකක් පමණ ගත වී තිබුණි. උතුරේ තැන් තැන්වල කලබල ඇති වන බව පොඩි හාමුදුරුවන්ට ආරංචි විය. අවි ගත් දෙමළ තරුණ පිරිස් කලහකාරී ලෙස හැසිරෙන බවට ආරංචි විය. ඒ නිසා යාපනයේ සිංහල ජනතාවට විශාල ගැටලු ඇති වූ අතර ඔවුන් පදිංචි ව සිටි නිවාස පවා කොල්ල කෑ බවට වාර්තා වීම නිසා නා හිමියන්ට යාපනයට වැඩම නොකරන ලෙස ආරක්ෂක අංශවලින් උපදෙස් ලැබී තිබුණි. ඒ අතර යාපනයේ නාග විහාරය ගිනිතැබූ කලහකාරීහු එහි තිබූ දේපළ ද කොල්ල කෑහ. එවකට යාපනය මහ දිසාපතිවරයා ලෙස කටයුතු කෙළේ ලාල් විජේපාල මහතා ය. ඔහු සිංහල දෙමළ සියලු ජනතාව සමඟ ඉතා හොඳ මිත්‍රශීලීත්වයක් තිබූ අයෙකි. ඔහු විශාල වෙහෙසක් ගත්තේ මේ කලහකාරීත්වය පාලනය කිරීමට ය.

නාගදීපයේ සිංහල දෙමළ ජනතාව අතර නම් කලහකාරීත්වය ගැටලුවක් නොවී ය. නායක හාමුදුරුවන්ට කවුරුත් ගරු කළහ. නායක හාමුදුරුවන්ද ජනතාව සමඟ ඉතා හොඳින් සුහද ව කල් ගෙවූ නිසා නාගදීපයේ කිසිදු කලබලයක් සිදු නොවුණි.

ඒ කෙසේ වුවත් නාගදීපයට ද මේ කලබල තත්ත්වය ඇති වෙනු ඇතැයි සිතමින් එවකට ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් නාගදීපයට නාවික හමුදා කඳවුරක් ස්ථාපිත කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණි. නාගදීපයේ ලොකු හාමුදුරුවෝත් පදුමකිත්ති පොඩි හාමුදුරුවෝත් මේ සියලු කරුණු දැන ගත්තේ සති අන්ත ඉරිදා පුවත්පත්වලිනි. ඒ කාලයේ නාගදීපයේ ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියා නොකළ හෙයින් සියලු ප්‍රවෘත්ති දැන ගැන්මට තිබුණු එකම මාර්ගය පුවත්පත් පමණි. විශේෂයෙන්ම එකල සිට නාගදීපයට අනිවාර්යතේ ම මිල දී ගත් පුවත්පතක් වූයේ 'සිළුමිණ' පුවත්පතයි.



නාගදීපයට පැමිණි නාවික හමුදා කණ්ඩායමේ නිලධාරියකු සමඟ පදුමකිත්ති හිමි එදා

නාවික හමුදාවේ කතාව සැබෑ කරමින් නෞකා කිහිපයකින් නාවික නිලධාරීහු විශාල පිරිසක් නාගදීපයට පැමිණියහ. ඔවුන් පැමිණ කඳවුරු ඉදි කරන අයුරු පොඩි හාමුදුරුවෝ, සිවා සමඟ බලා සිටියේ නායක හාමුදුරුවන්ට නොපෙනෙන ලෙසිනි. එසේ වුවත් අද තරම් තාක්ෂණය දියුණු නොවූ එකල එක්වරම ඔවුන්ට නවාතැන් ගැනීමට ස්ථාන සකස් කර ගැනීම පහසු නොවීය. මේ නිසා ඔවුන් වැඩි පිරිසක් නේවාසිකව සිටියේ විහාරස්ථානයේ ධර්ම ශාලාවේය. නාවික හමුදාවේ 1000ක පමණ පිරිසක් ඒ අනුව කඳවුරු බඳින ලදී.

**(මතු සම්බන්ධයි)**

**තාරක වික්‍රමසේකර**

# උත්සාහය හා කැපවීමට
# දෛවය ද වෙනස් කළ හැකියි



කවරයේ කතාව

**එදා, භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ රජගහ නුවර කෝමාරභච්ච ජීවක නම් රාජකීය වෛද්‍යවරයා පිදූ අඹ උයනේ. රජගහ නුවර මහධන සිටාණන්ගේ මුණුබුරු මහා පන්ථක සහ චූල්ල පන්ථක සොහොයුරන් දෙදෙනා සාසනයේ පැවිදි වුණා.**

මහා පන්ථක සාමණේරයන් වහන්සේ බවුන් වඩා නොබෝ කලකින් ම මහ රහතන් වහන්සේ නමක් වුණා. එහෙත් චූල්ල පන්ථක සාමණේරයන් වහන්සේට සාර මසක් උත්සාහ කළත් එක් ගාථාවක් කට පාඩම් කර ගත නොහැකි වුණා.

"ඔබට නුවණ මදකම නිසා මහණකමින් තිසි ඵල ලබා ගැනීමට නොහැකියි. එ නිසා ආරාමයෙන් නික්ම නිවසට ගොස් ගිහිව ජීවත් වන්න" මහා පන්ථක තෙරණුවෝ පැවසුවා.

දුකට පත් ව, අසරණ ව ආරාමයෙන් පිටව යන සාමණේරයන් වහන්සේට මහා කාරුණික භාග්‍යවතුන් වහන්සේ පිහිට වුණා. නැවත ආරාමයට කැඳවාගෙනවිත් උන් වහන්සේගේ සිතේ ස්වභාවය අනුව දිය යුතු කමටහනක් ලෙස සුදු රෙදි කඩක් දී 'රජෝ හරණං, රජෝ හරණං' කියමින් පිරිමදින්නට කියා දුන්නා. පසුව අතේ දහඩියට කිලිටි වූ රෙදිකඩ මෙන් සිත අපිරිසුදු වන බව නුවණින් මෙනෙහි කළ චූල්ලපන්ථක සාමණේරයන් සිවු පිළි සිඹියාපත් රහතන් වහ්නසේ නමක් වුණා. ඒ බව දම් සභාවේ භික්ෂූන් අතර කතාබහට ලක් වුණා. භාග්‍යවතුන් වහන්සේ මෙම කතා පුවත මූලික කරගෙන චූල්ලපන්ථක තෙරුණේ අරභයා මෙම ජාතක කතාව දේශනා කළා.

බරණැස් නුවර බ්‍රහ්ම දත්ත රාජ සමයේ අප මහා බෝසතාණෝ සිටු පවුලක ඉපිද 'චූල්ලසෙට්ඨි' නමින් ප්‍රසිද්ධ ධනවතෙක් වුණා. ඔහු ඉතා නුවණැති, ව්‍යක්ත, සියලු නිමිති දන්නා කෙනෙක්. දවසක් රාජ සේවයට

යන අතරතුර පාරේ වැටී සිටි මළ මී කුණක් දැක, ඒ මොහොතේ පිහිටි ග්‍රහ තාරකා අනුව නැකැත් විමසා බලා "නුවණැති උත්සහවත් යම් කෙනෙකුන් මේ මී කුණ ලදෙත් ඔහුට මහා පෝසතෙකු විය හැකි" බව පැවසුවා. ඒ බස් අසා සිටි දුගී මිනිසෙක් මී කුණ විකුණා මුදලක් උපයා පොහොසතෙක් වන්නට සිතුවා. මළ මීයාත් අරගෙන විකිණීමට තැනක් සොයමින් යන අතර බළලෙක් ඇති කරන කඩයක් දැක මී කුණ දී වී ඇට දෙක හමාරක මුදලක් ලබුවා. මොහු සැමවිටම දියුණු වන්නට උපායන් සිතමින් නුවණ මෙහෙයවා කල්පනාවෙන් වැඩ කළා.


ඉන් පසුව එම මුදලින් උක් සකුරුත්, වතුර කළයක වතුරත් ගෙන ගොස් මහන්සි වී මල් කඩාගෙන නුවරට ගෙන එන අයට මඟ හිඳ සංග්‍රහ කළා. සතුටට පත් මල් මාලාකාරයින් මල් මිට මිට දී ගියා. ඒවා විකුණා ගත් මුදලිනුත් දෙවන දවසේ උක් සකුරුත්, වතුරත් ගෙන මල් උයනටම ගොස් මල් කඩන මිනිසුන්ට දුන්නා. සතුටු සිත් ඇති මල්කාරීන් ගස්වල මල් භාගයක් කඩා ගෙන භාගයක් ඉතිරි කොට ගියා. ඒ මල් විකුණා කහවනු අටක මුදලක් ලැබුවා. කිහිප දිනක්ම මෙලෙස මුදල් ඉපැයුවා.

එක් මහා වැසි සුළං දවසක රාජ උද්‍යානයේ ගස්වල කොළ හා අතු කඩා වැටුණා. ඒවා ඉවත් කරන්නට අපොහොසත් වුණ උයන් පල්ලා ළඟට ගොස් "මිත්‍රය මේ උයනේ වැටුණු ගස් හා අතු මට දෙන්නේ නම් මේ සියල්ල ඉවත් කොට පිරිසුදු කර දෙන්නෙමි." කියා



අනුරාධපුර
කුට්ටම්පොකුණ විහාරාධිකාරී
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**

සිටියා. උයන් පල්ලාත් "එසේ නම් මෙය පිරිසුදු කොට දර ගනුව " යි කැමැත්ත දුන්නා. පසුව ළමුන් සෙල්ලම් කරන පිට්ටනියකට උක් සකුරුයි පැනුයි ගෙන ගොස් සෙල්ලම් කරන ළමුන්ට දී සිත් දිනා ගත්තා. ඔවුන් ද කළ උපකාරයට සරිලන්නට උයනට විත් සුළඟට වැටුණු අතු ඉති සියල්ල ඉවතලා පිරිසිදු කොට දර ටික උයන් දොරටුව ළඟ ගොඩ ගැසුවා. පසු ව දර සොයා ආ රජ ගෙදර කුඹල් කරුවකුට එම දර විකුණා සොළොස් කහවනුවක් සහ වළං පන්සියයකුත්



ලැබුවා. එම වළං ද විකිණීමෙන් සූවිස්සක ධනයක් ඉපැයුවා.

ටික දිනකින් ඔහු තවත් උපායක් කල්පනා කරන්නේ නුවර දොරටුව කිට්ටුවම එක් පැන් සලක් සාදා ගෙන තණ කොළ කපා ගෙන එන පන්සියයක් පුරුෂයන්ට පිපාසෙට පැන් වත්කොට දුන්නා. ඒ මිනිසුන්,

'මිත්‍රය ඔබ අපේ පිපාසය දුරු කර බොහෝ උපකාර කළා. අපෙන් උවමනා උදවුවක් ඇත්නම් කියව. අපි එය ඉටු කරන්නෙමු." කීවා.

"දැන්ම උවමනාවෙක් නැත. අවශ්‍යතාවක් පැමිණී කළ ඔබ සොයා එන්නෙමි. එවිට කළ මනා උදව්වක් කරන්න." උපාය දන්නා වූ චූල්ලන්තේවාසික කීවා.

ගොඩ වෙළෙඳුන් මෙන්ම මුහුදු වෙළෙඳුන් ද හිතවත් කර ගන්නට නොබෝ කලකින් ම ඔහු සමත් වුණා. දිනක් වෙළෙඳ නායකයාගෙන් "හෙට අශ්ව වෙළෙන්දෙකු පන්සියයක් අසුන් ගෙන වෙළඳාමේ එනවා" යි යන බස අසන්නට ලැබුණා. එය ඇසූ ඔහු වහා තණ ගෙන එන්නවුන් සොයා ගොස් කියන්නේ


'යහළුවෙනි, අද මට ඔබලාගෙන් තණ මිටිය මිටිය ලබා දෙන්න. මා තණ විකුණන තෙක් නුඹලා තණ මිටි නොවිකුණන්න.' 'යහපතැ' යී ඔවුන් පොරොන්දු කරවා ගත්තා. ඒ අනුව අශ්ව වෙළෙන්දා තණ කොළ සොයා ගත නොහැකි ව මේ චූල්ලන්තේවාසිකගෙන් දහසක් කහවනු ගෙවා තණ ලබා ගත්තා.

අනතුරුව කිහිප දිනක් ගිය පසු 'නැවු තොටට වෙළඳාම් සඳහා බඩු පැටවූ වෙළෙඳ නැවක් පැමිණ ඇතැ' යි සමුද්‍ර යහළුවකු පැවසුවා. එ බස් අසා කිහිපදෙනෙක් රැගත් රථයෙකින් තොටට ගොස් නැව් හිමිට පෙරැස් මුද්දක් අත්තිකාරම් ලෙස තබා නැවේ බඩු තමාගේ අවසරයකින් තොරව නොවිකුණන ලෙස ගිවිස්සා ගත්තා. නුවරින් පැමිණී සිය ගණන් වෙළෙන්ඳන්ට නැවෙන් බඩු ගන්නට නොහැකිව චූල්ලන්තේවාසිකට කහවනු දහස බැගින් දී අවසර ලබා බඩු ගන්නට සිදු වුණා. එයින් දෙලක්ෂයක කහවනු උපයා ගත හැකි වුණා. ටික දවසකින් ම තමාගේ උපායෙන් නුවණ මෙහෙයවා මහත් ධනවතෙක් වන්නට හැකියාව ලැබුණා.

පසුව තමාට මෙසේ මහා ධනවතෙක් වන්නට මඟ පෑදූ චූල්ලසිටුවරයා සොයා ගොස් විස්තර කියා කළගුණ දක්වා සිටිමින් ගුරු පඬුරු ලෙස මහත් පසුම්බියක් දුන්නා. චූල්ල සිටාණන් ඔහුගේ දක්ෂකම අසා පැහැදී සතුටට පත්ව තම දියණිය ද විවාහ කර දී තමාගේ මහා බූදලයට අයිතිකාරයා කළා.

"ඕනම ජීවිතයක දෛවය වෙනස් කරන්නට තමාගේ උත්සාහයට සහ නුවණට හැකියාව තියෙනවා. නුවණැත්තන්ගේ බස් පිළිපැදීම තුළ කාටත් මඟ නොවැරදිව යා හැකියි. අප හැම විට ම ගුරු දෙගුරුන්ගේ නුවණැති බස් පිළිගෙන අනාගත අභිවෘද්ධිය සලසා ගනිමු."

මෙහි 'එදා දුප්පත් ව ඉපිද, පසුව පෝසත් වූ පුරුෂයා මෙකල චූල්ලපන්ථක තෙරණුවෝයි. ඔහුට පොහොසත් වන්නට මඟ පෑදූ චූල්ල සිටාණෝ නම් මෙකල බුදු වූ මම් ම වේ ය' යි භාග්‍යවතුන් වහන්සේ පෙර අපර සන්ධි ගලපා වදාළ සේක.



# ආර්ය මාර්ග ප්‍රවේශයේ පළමු පියවර

**ආර්ය ශ්‍රාවක ප්‍රතිපදා 04**

**සංයුත්ත නිකායේ ඉන්ද්‍රිය සංයුත්තයේ පටිපන්න නමින් සූත්‍රයක් තිබෙනවා. "පටිපන්න" පාලි වචනයේ තේරුම පිළිපන්න කියන එකයි. පැමිණුනා, ප්‍රවේශ වුණා කියන තේරුමයි. එසේ පිළිපන්නේ, පැමිණුනේ, ප්‍රවේශ වුණේ ගෞතම ශාසනයේ ආර්ය මාර්ගයටයි.**

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටින සමයක "භික්ඛවොති" මහණෙනි මෙහාට වැඩම කරන්න කියා භික්ෂූන් වහන්සේලාට කතා කළා. භික්ෂූන් වහන්සේලාත් "භදන්තෙති" ඇයි ස්වාමීනි යි පිළිතුරු දෙමින් වැඩම කළා. එහෙම වැඩම කළ භික්ෂූන් වහන්සේලාටයි "පටිපන්න" සූත්‍රය දේශනා කරමින් මේ ආර්ය මාර්ග ප්‍රවේශය පැහැදිලි කළේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "පඤ්චිමානි භික්ඛවෙ ඉන්ද්‍රියානි" මහණෙනි, ඉන්ද්‍රිය ධර්ම පහක් තියෙනවා. "කතමානි පඤ්ච" මොනවාද ඒ පහ? "සද්ධින්ද්‍රියං" ශ්‍රද්ධා ඉන්ද්‍රිය. "විරියින්ද්‍රියං" වීර්ය ඉන්ද්‍රිය. "සතින්ද්‍රියං" සති ඉන්ද්‍රිය. "සමාධින්ද්‍රියං" සමාධි ඉන්ද්‍රිය. "පඤ්ඤින්ද්‍රියං" ප්‍රඥා ඉන්ද්‍රිය යි. ඊළඟට උන්වහන්සේ දේශනා කරනවා "මේ ඉන්ද්‍රිය ධර්ම පහ යම් කෙනෙක් තුළ සියලු ආකාරයෙන්, කිසි ලෙසකින්වත් නැත්නම් ඔහු මාගේ ශාසනයෙන් බැහැර වූවෙක්" කියලා. ඒ කියන්නේ ගෞතම ශාසනයේ ආර්ය මාර්ගයට පිළිනොපන්, නොපැමිණුන, ප්‍රවේශ නොවුණු කෙනෙක් කියන එකයි.

ආර්ය ශ්‍රාවකයෙක් වීමට නම්...

මේ ගෞතම ශාසනය තුළ ම ප්‍රථමයෙන්ම ආර්ය මාර්ගයට ප්‍රවේශ වෙන්න ඕන. ආර්ය මාර්ගයට ප්‍රවේශ වෙන්න තියෙන පහසුම ක්‍රමය තමයි පටිපන්න සූත්‍රයේ විස්තර කළ ඉන්ද්‍රිය ධර්ම වඩන එක. ඉන්ද්‍රිය ධර්ම අභ්‍යාස කරන එක. ඉන්ද්‍රිය ධර්ම පුරුදු පුහුණු කරන එක. ඉන්ද්‍රිය ධර්ම වඩන්න, අභ්‍යාස කරන්න, පුරුදු පුහුණු කරන්න පටන් ගත්තොත් ඔබ අනිවාර්යයෙන්ම ආර්ය මාර්ගයට ප්‍රවේශ වෙනවා. ඊළඟට අඩුම ගණනේ සෝවාන් මාර්ගයට පැමිණුන ශ්‍රාවකයෙක් වෙන්න හැකියාව ලැබෙනවා. ඉන්ද්‍රිය ධර්ම වඩන්න කලින් ඉන්ද්‍රිය ධර්ම එකින් එක විස්තර වශයෙන් ධර්මානුකූල ව හඳුනාගත යුතුයි. එම නිසා මෙතැන් සිට ඉන්ද්‍රිය ධර්ම පහ එකින් එක විස්තර කරන්නම්.

පළමු වැන්න සද්ධා ඉන්ද්‍රියයි

අටුවාව "සද්ධා" වචනය හඳුන්වා තියෙන්නේ "සද්දහන්තීති වා සද්ධා" කියලා. එහි තේරුම මැනවින් අදහන්නේ, මනාකොට පිහිටනු ලබන්නේ ශ්‍රද්ධාවයි. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ මැනවින් අදහන්නේ, ධර්ම රත්නයේ ස්වාක්ඛාතාදී ගුණ හය මැනවින් අදහන්නේ, සංඝ රත්නයේ සුපටිපන්නාදී ගුණ නවය මැනවින් අදහන්නේ ශ්‍රද්ධාවයි. මේ ආකාරයට ඇදහුවාට පස්සේ ඒ ගුණවල පිහිටන්නේ ශ්‍රද්ධාව නිසයි.



බලපිටිය ශ්‍රී ලංකා ප්‍රාචීන භික්ෂු විද්‍යාලයේ
මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත,
දර්ශනපති
**බලපිටියේ සිරිසීවලි හිමි**

අභිධර්ම පිටකයේ විභංගප්‍රකරණයේ සද්ධා ඉන්ද්‍රිය හඳුන්වල තියෙන්නේ "යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෙ සද්ධා සද්ධින්ද්‍රියං" කියලා.

මේ පාලි පාඨයේදී ශ්‍රද්ධාවේ ස්වභාවය දක්වන්න වචන තුනක් දක්වා තියෙනවා.

1. සද්දහනා - තෙරුවන් ගුණ ඇදහීම

2. ඔකප්පනා - තෙරුවන් ගුණ සිතට වැද ගැනීම

3. අභිප්පසාදෙ - තෙරුවන් ගුණ කෙරෙහි විශේෂයෙන් පැහැදීම

මෙයාකාරයට තෙරුවන් ගුණ අදහමින් සිතට වැද ගත් පසුව ඇති වෙන්නේ, විශේෂ පැහැදීමක්. ඒ විශේෂ පැහැදීම නිසා ඇති වුණු ශ්‍රද්ධාව අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය ධර්මයක් වෙනවා. මෙහිදී අප හොඳින් තේරුම් ගත යුතු දෙයක් තියෙනවා. ඒ තමයි ශ්‍රද්ධාව අපි තුළ පිහිටන්න නම් පළමුවෙන්ම අපි බුදුරජාණන් වහන්සේ ගුණවලින් හඳුනා ගන්න ඕන. බොහෝ බෞද්ධයන් බුදුහාමුදුරුවන් හඳුනන්නේ රූපෙන් පමණයි. ගුණවලින් හඳුනන්නේ නැහැ. ඒ නිසා තමයි මිනිස්සු දහස් ගණන්, ලක්ෂ ගණන්, කෝටි ගණන් මුදල් වියදම් කරලා හැමතැනම බුදුපිළිම හදන්න පුරුදු වෙලා තියෙන්නේ. හොඳට හිතන්න ඔය බුදුපිළිම හදන්න ලක්ෂ ගණන් මුදල් පරිත්‍යාග කරන මහත්මයෙකුගෙන් හරි මහත්මියකගෙන් හරි ඇහුවොත් ඇයි අපේ බුදුහාමුදුරුවන්ට "අරහං" කියන්නේ? ඇයි "සම්මා සම්බුද්ධ" කියන්නේ? ධර්මානුකූලව බුදුගුණ ගැන විස්තර කරන්න දැනුමක් තියෙනව ද? ඇත්තටම නැහැ. එහෙනම් ඇයි බුදුහාමුදුරුවන් වෙනුවෙන් ලක්ෂ ගණන් වියදම් කරන්නේ. එකම දේ තමයි බුදුහාමුදුරුවන් රූපෙන් හඳුනා ගෙන තිබීම. රූපෙන් විතරක් බුදුහාමුදුරුවන් හඳුනා ගත්තට ශ්‍රද්ධාව ඇති වෙන්නේ නැහැ. ශ්‍රද්ධාව පිහිටන්නේ නැහැ. ශ්‍රද්ධාව නැත්නම් ආර්ය මාර්ගයට ප්‍රවේශ වන්න කොහෙත්ම බැහැ. බුදුගුණ කියවා තේරුම් අරගෙන බුදුගුණ වඩනකොටයි ශ්‍රද්ධාව ඇති වෙන්නේ. එහෙම නැතිව මුදල් වියදම් කර කර බුදුපිළිම හැදුවට ශ්‍රද්ධාව ඇති වෙන්නේ නැහැ. එයින් ඇති වෙන්නේ ඒ වෙලාවට බුද්ධාලම්බන ප්‍රීතියක් පමණයි. සතුටක් විතරයි.

> **බොහෝ බෞද්ධයන් බුදුහාමුදුරුවන් හඳුනන්නේ රූපෙන් පමණයි. ගුණවලින් හඳුනන්නේ නැහැ. ඒ නිසා තමයි මිනිස්සු දහස් ගණන්, ලක්ෂ ගණන්, කෝටි ගණන් මුදල් වියදම් කරලා හැමතැනම බුදුපිළිම හදන්න පුරුදු වෙලා තියෙන්නේ.**

මිනිස්සු බුදුගුණ කොයිතරම් හඳුනන්නේ නැද්ද කියනව නම් "අරහං" කියන වචනේ තේරුමවත් හරියට දන්නේ නැහැ.

දැන් බලන්න මිනිස්සු "අරහං" කියන වචනේ භාවිත කරන්නේ මොන තේරුමෙන්ද කියලා. ගෙදරක ඉන්නව නම් මහා විසේකාර, දඟ කරන දරුවෙක් අම්මලා මොකද කියන්නේ, 'මට දැන් මේ දරුවා අරහං' කියනවා. එපා වෙලා කියන එකයි මේ කියන්නේ. හැබැයි අරහං කියන්නේ බුදුහාමුදුරුවන්ගේ පළමු ගුණයයි. එය තේරුම් ගත්ත නම් විසේ කරන, දඟ කරන එපා වෙච්ච දරුවෙකුට 'අරහං' කියන්නේ නැහැනේ. මේ පුංචි උදාහරණයක් විතරයි.

ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්මයක් හැටියට ඇති කර ගන්න අප කළ යුතු දේ දැන් පැහැදිලි කරන්නම්. පළමුවෙන්ම බුදුගුණ ලියවුණු පොතක් සොයා ගෙන "අරහං" බුදුගුණය ගැන ලියවුණු දේ කියවන්න. කිහිප වරක් නැවත නැවත හොඳින් කියවන්න. දැන් එහි නොතේරෙන දේ වෙනම සටහන් කරගෙන ධර්මය දන්න කල්‍යාණ මිත්‍රයන් වහන්සේ හමුව සාකච්ඡා කරන්න. තේරුම් අහගන්න. ඊළඟට අරහං ගුණය පිළිබඳ කමටහන් සකස් කරගෙන දවසට විනාඩි තිහක් විතර භාවනාවක් හැටියට වඩන්න පටන් ගන්න. අරහං බුදුගුණය එක දිගට මාසයක් විතර නොකඩවා වඩන්න. ඊළඟට "සම්මා සම්බුද්ධ" ගුණය ගැන ලියවුණු දේ කියවන්න. තේරුම් ගන්න. ඊට පස්සේ මාසයක් විතර භාවනාවක් හැටියට වඩන්න. මේ විදියට බුදුගුණ නවයම ඉගෙන ගෙන තේරුම් අරගෙන බුද්ධානුස්සතිය ලෙස වඩන්න. එතකොට ඔබට බුදුහාමුදුරුවන් ගුණවලින් හඳුනා ගන්න පුළුවන් වේවි. අවුරුද්දක් විතර මේ බුදුගුණ අභ්‍යාස කරන කොට ඔබ තුළ ශ්‍රද්ධාව පිහිටාවි.

ඊළඟට මේ විදියට ම ධර්මයේ ගුණ හයත්, සංඝරත්නයේ ගුණ නවයත් කියවා තේරුම් ගෙන කමටහන් ලෙස වඩන්න. අවුරුදු දෙකක් විතර මේ අභ්‍යාස කළොත් ඔබ තුළ ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්මයක් හැටියට ඇත්තටම පිහිටාවි. ඒ ඔබේ ආර්ය මාර්ග ප්‍රවේශයේ පළමු පියවරයි.

බුදුසරණ



රාවගල කඳු මුදුනට පිවිසෙන සිංහ තොරණ



රාවගල රැක ගන්නට රතනසාර හිමි කටයුතු කරන්නේ මේ කුඩා ආවාසයේ සිටය

# නාගයින් හඬා වැලපුණු රාවගල

**කලින් කල ඇති වූ පරසතුරු ආක්‍රමණ නිසා අපේ වෙහෙර විහාර රැසක් විනාශ වී ගිය බව ඉතිහාසයේ දැක්වෙනවා. එමෙන්ම රාජධානි මාරුවීමත් සමඟම ඇතැම් සිද්ධස්ථාන කෙරෙහි අවධානය යොමු වී නැති බවත් අපට පෙනී යනවා.**

මේ බොහෝ සිද්ධස්ථාන පසුගිය දශක කිහිපය තුළ සොයා ගෙන ඒවා ප්‍රතිසංස්කරණය කළත් නැඟෙනහිර පළාතේ තවමත් පුරා විද්‍යා ඇස නොගැටුණු බෞද්ධ ඓතිහාසික සිද්ධස්ථාන රැසක් තිබෙනවා. වසර 800කට පමණ පසු කඨින පින්කමක් පැවැත්වූ 'රාවගල' එයින් එක් සිද්ධස්ථානයක්. කාලිංග මාඝ විසින් විනාශ කළ පුදබිමක් ලෙස රාවගල හඳුන්වා දෙන්න පුළුවන්.

මේ ඓතිහාසික සිද්ධස්ථානය පිහිටා ඇත්තේ මඩකළපුව - ත්‍රිකුණාමලය මාර්ගයේ මූතූර් නගරයට කිලෝමීටර් 12ක් පමණ මඩකළපුව දෙසට වන්නටයි. මඩකළපුව දෙසට ගමන් කරද්දී මාර්ගය අද්දරම වම් පැත්තේ සිංහ රුව සහිත සුදු පැහැති තොරණකින් හෙබි රාවගල පුදබිම අපට හමුවෙනවා.



බලල්ලේ රතනසාර හිමි

නැඟෙනහිර පළාතේ හුදකලා වූ එකම, උසම කන්ද මෙය වනවා. කඳු මුදුනට ත්‍රිකුණාමලය වරාය දක්වාත්, අනෙක් පැත්තෙන් සේරුවිල හා ලංකා පටුන දක්වාත් වූ ප්‍රදේශය ඉතා පැහැදිලිව දර්ශනය වනවා. එම නිසා යුද සමයේ ත්‍රස්තවාදීන් විසින් මේ ස්ථානය ඔත්තු බැලීම සඳහා භාවිත කර තිබෙනවා.

රාවගල සම්බන්ධ වූ ඓතිහාසික කතාවක් අපට ධාතුවංශයේ දැකගන්නට පුළුවන්.

සේරුවිල විහාරස්ථානය ගැන කියැවෙන ධාතු වංශයේ දැක්වෙන ආකාරයට සේරුවිල චෛත්‍යයේ නිධන් කිරීමට කේශ ධාතු ලබා ගැනීම පිණිස ශිව මහ රහතන් වහන්සේ නාග ලොවට වැඩම කර තිබෙනවා. ජයසේන නම් නාගරාජයා ශිව මහ රහතන් වහන්සේ වැඩම කරනු දැක ඔවුන් සතුව තිබූ කේශ ධාතූන් ඇතුළත් කරඬුව ගිල දමනවා. ඒ නාගයින් ධාතූන් වහන්සේට දැඩි ඇල්මක් දැක්වූ හෙයින්.

"ස්වාමීනි, ඇයි නාග ලොවට වැඩම කෙළේ" ජයසේන නා රජු ශිව මහ රහතන් වහන්සේගෙන් විමසනවා.


"සේරුවිල චෛත්‍යයක් කරනා හෙයින් ඒ සඳහා කේශ ධාතූන් වැඩම කරවනු පිණිස වැඩම කෙළෙමි"

ශිව මහ රහතන් වහන්සේට පිළිතුරු දෙන ජයසේන නා රජු පවසන්නේ කේශ ධාතූන් තමන් අත නොමැති බවත්, හැකියාවක් ඇත්නම් සොයා ගන්නා ලෙසයි. තමා අත නොමැති බව පැවසුවත් ධාතූන් ඇතුළත් කරඬුව නා රජු විසින් ගිල දමා ඇති බව දිවැසින් දුටු රහතන් වහන්සේ නා රජුගේ උගුරට අත දමා එය රැගෙන නා ලොවින් පැමිණෙනවාත් සමඟම ජයසේන නා රජු තම මස්සිනා ද කැටුව සෙසු නාගයින් සමඟ ශිව මහ රහතන් වහන්සේ පසුපස හඬා ආ බව ධාතු වංශයේ දැක්වෙනවා.

'දෙව් මිනිසුන් සහිත වූ ලොවට පිහිට වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ධාතු පරිහරණය කොට සතර අපා දුකින් මිදෙන්නා වූ අප නිශ්ශෝභ කොට 'ධාතූන් වහන්සේ ගෙන ගිය මහණු' ලුහු බඳවා ගනුම්හ' යි දෙකෙළක් පමණ වූ නයින් ගෙන තමාගේ බෑණා හා සමඟ ඔවුන් වහන්සේ පසු පස්සෙහි ලුහු බඳවා එන්නේ අහසට නැංගේය. එකිණෙහිම තෙරුන් වහන්සේ අහසින් බැස පොළව කිම්ද යට වන් සේක 'ඒ නයිදු පොළොවට එන්නාහුය. මෙසේ ඒ තෙරුන් වහන්සේ ඒ නයින් හා සමඟ නැඟෙමින් බසිමින් පෙළහර දක්වා සේරු නුවරට නුදුරු තෙන ගල් අතළකට නැගි සේක.'

'නයි තෙරුන් අල්වා ගන්ට නොහැකිව මහ හඬින් හඬා ඒ ගල් අතළ පිට හිඳ ඇම දෙනම එක්ව පින්වත්නි මෙයින් මත්තෙහි අපි ඇම නටුම්හ'යි මහ හඬින් හැඬුවාහුය. එතැන් පටන් ඒ ගල් අතළ නයින් රැව් පිළිරැව් දී හැඬූ බැවින් රාවගල් නම් වූයේ ය.'

ධාතු වංශයේ දැක්වෙන පරිදි 'රාවගල්' නම් ගල්තලාවේ සිට නාගයින් ශෝක වූ ගල්පර්වතය 'රාවගල' නම් වුවත් එහි ඉදිකර තිබූ ඉපැරැණි චෛත්‍යය ඇතුලු සියල්ල කාලිංඝ මාඝගේ ආක්‍රමණයත් සමඟ විනාශයට



රාවගල කඳු මුදුනේ පිහිටි ඉපැරැණි චෛත්‍යය

පත් වූ බව අපේ ඉතිහාසයේ දැක්වෙනවා. එහෙත් කඳු මුදුණේ ඉදි කරන ලද චෛත්‍යය පමණක් නටබුන් වූ තත්ත්වයකින් තවමත් ඉතිරි ව තිබෙනවා. එහෙත් අවාසනාවකට තවමත් පුරාවිද්‍යාවේ ඇස මේ කෙරෙහි යොමුව නැහැ.

කාලිංඝ මාඝගේ ආක්‍රමණය සිදු වන විට මේ ප්‍රදේශයෙහි ආරාම කෝටියක් තිබුණු බවත් කෝටියක් ආරාම ඇති නිසා 'කෝටියාරම' හෙවත් 'කොට්ටියාරම්' වශයෙන් හඳුන්වා තිබෙනවා. පසුව කොට්ටියාරම් පත්තු වශයෙන් මේ ප්‍රදේශය අද දක්වාම හඳුන්වා ඇත්තේ ද එහෙයින්. ශ්‍රී මහා බෝධියට සම කාලීන බෝධීන් වහන්සේ නමක් මේ ආසන්නයේ තිබුණ ද මෑත කාලයේ එක්තරා අන්තවාදීන් පිරිසක් විසින් ඒ බොදු උරුමය විනාශ කළ නිසා එය සිහිවීම පිණිස රාවගල විහාරය කොට්ටියාරම මූල මහා විහාරය නමින් අද හැඳින්වීමට වත්මන් විහාරාධිපති බලල්ලේ රතනසාර හිමියන් විසින් කටයුතු කර තිබෙනවා. කිලෝමීටර් 15ක් දෙපසටම යනතුරු කිසිදු බෞද්ධ ජනතාවක් සොයාගැන්මට නොමැති පරිසරයක් තුළ මේ බෞද්ධ සිද්ධස්ථානය රැක ගැන්මට විහාරාධිපති හිමියන් දක්වන්නේ විශාල කැපකිරීමක්. දෙමළ ජනතාව පවා මේ පින්බිමට පැමිණ සිල් සමාදන් වීම විශේෂත්වයක්.

රාවගල විශේෂත්වයක් ගන්නේ එය රජවරුන් විසින් ශාසනයට පූජා කළ ස්ථානයක් නොවීමත්, භික්ෂූන් වහන්සේ විසින් ගල් ලෙන් වාස භූමි බවට පත් කර ගෙන එය පූජා භූමියක් බවට පත් කරගත් ස්ථානයක් වීමත් නිසයි.

කාවන්තිස්ස රජු සමයේ ආරම්භ කරන ලදැයි සැලකෙන මේ පූජාභූමිය පසු කලෙක වළගම්බා රජු විසින් වැඩි දියුණු කළ බව ද සඳහන්. එහෙත් කාලිංඝ මාඝගේ ආක්‍රමණය නිසා වල්වැදී ජනතාවගෙන් ඈත් වූ මේ පින් බිම හා ආසන්න බෞද්ධ සිද්ධස්ථාන යළි ජනතාවට ලබා දීම පිණිස දඹගස්ආරේ සුමේධංකර නාහිමියෝ දැඩි වෙහෙසක් ගෙන තිබෙනවා. උන් වහන්සේ සේරුවිල චෛත්‍යය ජනතාවට වන්දනා මාන පිණිස සොයා දුන් අතර එතැනින් පසුව අවට ඇති නීලපොළ, විල්ගම් වෙහෙර, රාවගල වැනි සිද්ධස්ථාන ගැන ද අවධානය යොමු කළා.

උන් වහන්සේගේ අපවත් වීමෙන් පසුව සේරුවිල සරණකිත්ති නාහිමියන් විසින් රාවගල බෞද්ධයන් උදෙසා ලබා දීමට කටයුතු ආරම්භ කළ ද ත්‍රස්තවාදී තර්ජන ආරම්භ වීමත් සමඟම එම කටයුතු යළි ඇණ හිටියා.

රාවගල පුද බිම ගැන අදහස් දැක්වූ රතනසාර හිමියන් පවසා සිටියේ කඳු මුදුනේ ආරක්ෂක මුරපොළක් ඉදිකර තිබූ නිසා යම් පමණකට මේ භූමිය ආරක්ෂා වූ බවයි. 2018 වසරේ පැමිණ උන් වහන්සේ විසින් මේ පුදබිම රැක ගෙන ඇත්තේ විවිධාකාර අන්තවාදී තර්ජන මැදයි.

නිසි සංඝාවාසයක් නොමැති නිසා උන් වහන්සේ වැඩ වාසය කර ඇත්තේ තහඩුවලින් සමන්විත වූ කුඩා කාමරයකයි. දිවා කාලයේ අඹ ගස මුල පැදුරක් එළාගෙන සැතපී මේ බෞද්ධ උරුමය රැක ගන්නට උන් වහන්සේ කටයුතු කළේ එකල නැඟෙනහිර පළාතේ ප්‍රාදේශීය ලේකම්වරයකුගේ නිල රථයෙන්ම පැමිණ මේ ආසන්නයේ පිහිටි සැදු කුඩා ඉපැරැණි චෛත්‍යයක් ඩෝසර් කරන ලද නිසයි.

රහතන් වහන්සේ ලක්ෂ ගණනක් වන්දනා මාන කළ රාවගල කඳු මුදුණේ චෛත්‍යක් ඉදි කිරීම පිණිස මේ වන විට කටයුතු කර තිබෙන අතර රාවගල සම්බන්ධ ව අවධානය වහාම යොමු කරන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කළ යුත්තේ මුහුදු මහා විහාරයට ගුරුකන්ද විහාරයට වූ දෙය මේ පුදබිමට අත් නොවිය යුතු නිසයි.

තාරක වික්‍රමසේකර

සේයාරූ - විමල් කරුණාතිලක

වර්ෂ 2020ක් වූ ජූනි 20 වනදා සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.